# තුන්වෙනි කොටස

# තුන්වැනි කොටස

## මුදල් මණ්ඩලය විසින් 2005 වර්ෂයේ දී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන.

### බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (තැන්පතු) විධානයන්ට සංශෝධන | | i |
| 2. | 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත යටතේ නිකුත් කරනලද විධානයන් | - 02/04/002/0012/002 | i |
| 2.අ | බැංකු (සංශෝධිත) පනතේ 46(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානය | | i |
| 2.ආ | බැංකු (සංශෝධිත) පනතේ 47(3), (4), (5) සහ (6) යන වගන්තීන්ට අදළ නියමය | | ii |
| 2.ඇ | බැංකු පනතේ 47(4) වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද අණ | | iii |
| 3. | කාර්තුමය සහ මාසික පදනම යටතේ අනුකූලතා වාර්තා ඉදිරිපත් කිරීම | - 02/04/004/0010/001 | iv |
| 4. | පුවත්පත්වල බැංකු ගිණුම් පළ කිරීම මගින් මහජනයාට හෙළිදරව් කිරීම. | - 02/04/003/0400/001 | iv |
| 5. | බැංකු පනත (කේවල ණයගැති සීමාව) 2005 අංක 2 දරන විධානය | | v |
| 6. | අධ්‍යක්ෂකවරුන්ට හා ඔවුන්ට සම්බන්ධිත සමාගම්වලට දෙනු ලබන පහසුකම් | | vi |
| 7. | බැංකු පනත (කේවල ණයගැති සීමාව), 2005 අංක 3 දරන විධානය | | vii |
| 8. | බැංකු අධ්‍යක්ෂකවරුන් පත් කිරීම (සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 42 වන වගන්තිය) | - 02/04/002/0012/002 | ix |
| 8.අ | බැංකු පනතේ 42 (2) වගන්තිය යටතේ ඉදිරිපත් කළයුතු දිවුරුම් ප්‍රකාශය. | | ix |
| 8ආ | අධ්‍යක්ෂකවරයකු ලෙස යෝජිත පුද්ගලයන් විසින් ඉදිරිපත් කළයුතු ප්‍රකාශය. | | xi |
| 9. | බැංකුවල (බලපත්‍රලාභී වාණිජ බැංකු) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම | - 02/17/402/0073/001 | xii |
| 10. | බැංකුවල (බලපත්‍රලාභී විශේෂිත බැංකු) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම | - 02/17/402/0073/001 | xii |
| 11. | ඉස්ලාමීය මූලධර්ම මත පදනම් වූ බැංකු සේවා හඳුන්වාදීම. | | xiii |
| 12. | විදේශ මුදලින් ප්‍රාග්ධනය පවත්වා ගැනීම සඳහා ඉල්ලීම | | xiii |
| 13. | බැංකු පනත (කේවල ණයගැති සීමාව), 2005 අංක 4 දරන විධානය. | - 02/04/002/0101/002 | xiv |
| 14. | බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව - 2005 අංක 2 දරන නියමය | - 02/08/006/0001/002 | xvii |
| 15. | විදේශ මුදලින් ප්‍රාග්ධනය පවත්වා ගැනීම සඳහා ඉල්ලීම | - 02/04/002/0018/001 | xvii |
| 16. | මහජනයාට හෙළිදරව් කිරීම සඳහා බැංකුවල කාර්තුමය මූල්‍ය ප්‍රකාශ පුවත්පත්වල පල කිරීම | - 02/04/003/0401/001 | xviii |
| 17. | බැංකු පනත (කේවල ණයගැති සීමාව), 2005 අංක 5 දරන විධානය. | | xxxiv |
| 18. | බලපත්‍රලාභී විශේෂිත බැංකු කේවල ණයගැති සීමාව. | | xxxvi |


### දේශීය කටයුතු දෙපාර්තමේන්තුව


| | | | |
|---|---|---|---|
| 19. | ලංකාසෙට්ල්හි නිර්ලේඛන රාජ්‍ය සුරැකුම්පත් මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම පිළිබඳ මෙහෙයුම් උපදෙස් | - 35/01/005/0006/09 | xxxvii |


### විනිමය පාලන දෙපාර්තමේන්තුව


| | | | |
|---|---|---|---|
| 20. | බලයලත් වෙළෙඳුන් සඳහා මෙහෙයුම් උපදෙස් | - 06/04/01/2005 | xxxvii |
| 21. | වක්‍ර අපනයනකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් | - 06/04/02/2005 | xxxviii |
| 22. | පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම. | - 06/04/03/2005 | xxxix |
| 23. | විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි සංශෝධනය කිරීම | - 06/05/04/2005 | xl |
| 24. | ජාත්‍යන්තර විද්‍යුත් හර බැර හෝ වෙනත් මුදල් පැවරුම් කාඩ්පත් මගින් විදේශ විනිමය හැර ගැනීම පිළිබඳ මෙහෙයුම් යෝජනා ක්‍රමය | - 06/08/06/2005 | xl |

## ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව


| | | | |
|---|---|---|---|
| 25. | මූල්‍යමය ව්‍යුත්පන්න උපකරණ සම්බන්ධිත විධාන (සංශෝධිත) | - 33/01/002/0086/002 | xlv |


## ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව


| | | | |
|---|---|---|---|
| 26. | ලංකා සෙට්ල් පද්ධතිය ප්‍රාථමික අඩවියේ සජීව ඩීඑස්/ඩීඑස්එස්/වෙබ් සුරැකුම් සේවා/දත්ත ගොනු වැඩි දියුණු කිරීම RTGS/03/2005 | - 34/07/029/0001/001 | l |
| 27. | ලංකා සෙට්ල් පද්ධතිය සඳහා සහභාගීත්ව ආයතනයක් ලෙස සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව පත් කිරීම RTGS/04/2005 | - 34/07/029/0001/001 | l |
| 28. | බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිෂ්කාෂණ කටයුතුවලට අදාළ පියවීම්වලදී ආර්ටීජීඑස් පියවීම් ගිණුමෙහි ශේෂය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී එම ගෙවීම පැහැර හැරීම පිළිබඳව දඩ මුදලක් පැනවීම. | - 34/07/029/0001/001 | li |
| 29. | සීමාසහිත මුස්ලිම් කොමර්ෂල් බැංකුවෙහි නාමය වෙනස් කිරීම RTGS/07/2005 | - 34/07/029/0001/001 | liii |


## රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව


| | | | |
|---|---|---|---|
| 30. | ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම සඳහා වූ විධානය | - 08/24/002/0001/005 | liii |
| 31. | අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම ලාභාංශ බෙදා හැරීම සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අධියර ii ප්‍රාග්ධනය පිළිබඳ වූ විධානය | - 08/24/002/0005/005 | liv |
| 32. | 2003 අගෝස්තු ලංකා සෙට්ල් පද්ධතියේ නීති සංශෝධනය SSSS/01/2005 | - 08/25/001/0034/001 | liv |


## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව


| | | |
|---|---|---|
| 33. | 2005 අංක 1 දරන මුදල් සමාගම් (තැන්පතු) විධානය | lv |
| 34. | 2005 අංක 2 දරන මුදල් සමාගම් (පොලී) විධානය | lviii |
| 35. | 2005 අංක 3 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය | lix |
| 36. | 2005 අංක 4 දරන මුදල් සමාගම් (ව්‍යාපාර කටයුතු සඳහා කාර්යාලයන් වසා දැමීම)විධානය | lx |
| 37. | 2005 අංක 5 දරන මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්)විධානය | lxi |
| 38. | 2005 අංක 6 දරන මුදල් සමාගම් (ශාඛා/කාර්යාල විවෘත කිරීම/ ස්ථාන වෙනස් කිරීම්/වැසීම)විධානය | lxii |
| 39. | 2005 අංක 1 දරන මුදල් සමාගම් (ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර දීමේ) රීති | lxii |
| 40. | ප්‍රාග්ධන ප්‍රාමාණිකත්මකභාවය පිළිබඳ විධානය - සංශෝධිත උපදෙස්. | lxiii |
| 41. | සුදුසුකම්ලත් ප්‍රත්‍යාගණන සංචිත ප්‍රාග්ධන අරමුදල් හි ඇතුලත් කිරීම සම්බන්ධයෙන් සියළු ලියාපදිංචි මුදල් සමාගම් වෙත නිකුත් කෙරෙන උපදෙස්. | lxiv |
| 42. | 2003 අංක 2 දරන මුදල් සමාගම් (අවදනම් මත බරතැබූ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාත) විධානය - සංශෝධිත උපදෙස් | lxv |
| 43. | 2005 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම ප්‍රාග්ධන)විධානය | lxvi |
| 44. | 2005 අංක 2 දරන කල්බදු මූල්‍යකරණ (බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම) විධානය | lxvii |
| 45. | 2005 අංක 3 දරන කල්බදු මූල්‍යකරණ (තනි ණය ගැණුම්කරු සීමා) විධානය | lxix |
| 46. | 2005 අංක 4 දරන කල්බදු මූල්‍යකරණ (තෝලන අනුපාත) විධානය | lxxi |
| 47. | 2005 අංක 5 දරන කල්බදු මූල්‍යකරණ (උපචිත පොලී) විධානය | lxxii |
| 48. | 2005 අංක 6 දරන දරන කල්බදු මූල්‍යකරණ (සංචිත අරමුදල) විධානය | lxxiii |

## 1995 අංක 33 දරණ බැංකු (සංශෝධිත) පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත

1995 අංක 33 දරන බැංකු සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතෙහි 76 ඒ (1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1998 මැයි 7 වැනි දින නිකුත් කළ තැන්පතු සම්බන්ධ විධානයන්ට සංශෝධන.

අත්සන් කලේ / **සුනිල් මෙන්ඩිස්**
අධිපති

2005 ජනවාරි 03 දින,
කොළඹ

## බලපත්‍රලාභි විශේෂිත බැංකු (තැන්පතු) විධානයන්ට සංශෝධන

වහාම බලපැවැත්වෙන පරිදි ඉහත විධානයෙහි 4 වැනි වගන්තියේ (ආ) උප වගන්තිය අවලංගු කෙරෙනු ඇත.

**02/04/002/0012/002**

වෙත: බලපත්‍රලාභි වානිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරින්,
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (ඇපයෙන් සීමිත) සංගමයේ
ලේකම් ජෙනරල්

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 පෙබරවාරි මස 16

ප්‍රිය මහත්මයාණෙනි,

## 2005 අංක 2 දරණ බැංකු (සංශෝධිත) පනත

ඔබ දන්නා පරිදි බැංකු සංශෝධිත පනත් කෙටුම්පත, 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත ලෙස පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඇත.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් දේ මේ සමඟ අමුණා ඇත.

* 47 (4) වගන්තියට අනුකූලව මුදල් මණ්ඩලය මගින් අනුමත කරන ලද සීමාවන්.
* 47 (3) (4) (5) සහ (6) යන වගන්ති යටතේ මුදල් මණ්ඩලය විසින් කරන ලද නියමයන්.
* 46 (1) වගන්තියට යටතේ නිකුත් කරන ලද විධානයන්.

මෙය ලැබුණු බව දන්වා එවන්න

මෙයට විශ්වාසී
අතසන් කළේ / අධ්‍යක්ෂ
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

## බැංකු පනත

2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්.

අත්සන් කලේ / **සුනිල් මෙන්ඩිස්**
අධිපති

2005 පෙබරවාරි 11 දින,
කොළඹ

## විධානයන්

2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතලවලට අනුකූලව පහත සඳහන් විධානයන් නිකුත් කරනු ලැබේ.

1. 2005 අංක 02 දරන බැංකු (සංශෝධිත) පනත බල පවත්වන්නට යෙදුනු දිනට පෙර දින වන 2005 පෙබරවාරි මස 09 වන දින තෙක් බලපැවැත්වුන බැංකු පනතේ 46(1) වගන්තියට අනුව මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද පහත සඳහන් විධානයන්හි ප්‍රතිපාදන වලට සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු අනුකූල විය යුතුය.

   (අ) 2003 නොවැම්බර් මස 18 වන දින නිකුත් කරන ලද 1999 අංක 2 දරන විධානය (කෝවල ණය ගැති සීමාව) ලෙස සංශෝධනය කරන ලද 46(1) (ඇ) වගන්තිය යටතේ 1999 ඔක්තෝබර් මස 11 වන දින නිකුත් කරන ලද 1999 අංක 2 දරන විධානය (කෝවල ණය ගැති සීමාව)

   (ආ) බැංකු පනතෙහි 46(1)(ඇ) වගන්තියට යටතේ 1998 ඔක්තෝබර් මස 22 දින නිකුත් කරන ලද 1998 අංක 1 දරන විධානය (කොටස් ප්‍රාග්ධන අයිතිය).

2. ඉහත සඳහන් (අ) සහ (ආ) විධානයන් කියවා තේරුම් ගත යුත්තේ එම විධානයන් නිකුත් කරනු ලැබූ 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතෙහි 46 වන වගන්තියට අනුකූලවය.

## බැංකු පනත

2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 47(3),(4),(5) සහ (6) වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියමයන්.

2005 පෙබරවාරි 11 දින, අත්සන් කලේ / **සුනිල් මෙන්ඩිස්**
කොළඹ අධිපති

## නියමය

1. බැංකු පනතේ 47(3), (4), (5) සහ (6) යන වගන්තිවල විධිවිධානයන්ට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි අධ්‍යක්ෂකවරයෙකුට හෝ එබඳු අධ්‍යක්ෂකවරයෙකුගේ කිට්ටු ඥාතිවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලෙන සම්බන්ධතාවයක් ඇති සමාගමකට (Substantial Interest) ප්‍රදනය කරනු ලබන ණය පහසුකම් සඳහා ඇප ලෙස ලබා ගැනීමට මුදල් මණ්ඩලය අනුමත කර ඇති සුරැකුම් පහත සඳහන් පරිදි වේ :

   (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඇප
   (ආ) බැංකු ඇප
   (ඇ) ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC), ආසියානු සංවර්ධන බැංකුව (ADB),USAID වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල ඇප.

   ඉහත (අ), (ආ) හෝ (ඇ) මගින් සුරක්ෂිත කරන ලද පහසුකම් ඇපයෙන් 100% නොඉක්ම විය යුතුය.

   (ඈ) රාජ්‍ය හෝ මහ බැංකු සුරැකුම් පත් - ප්‍රදනය කරන පහසුකම්, මෙම සුරැකුම්පත් වල මුහුණත් වටිනාකමින් හෝ වෙළෙඳපොළ අගය යන දෙකෙන් අඩු අගයෙන් 90% ක් නොඉක්මවිය යුතුය.
   (ඉ) ප්‍රදනය කරන ලද පහසුකම්, ඒ සඳහා ණයදෙන බැංකුවල අණ පරිදි උකසට යටත් ඕනෑම වාණිජ බැංකු මුදල් තැන්පතු, වලින් 90% නොඉක්ම විය යුතු ය.
   (ඊ) ප්‍රදනය කරන ලද පහසුකම්, ඒ සඳහා ණයදෙන බැංකුවලට පවරාදෙන ලද සහ ශ්‍රී ලංකාව තුළ නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ප්‍රතිපත්ති, පවාරණය කිරීමේ වටිනාකමින් 75% නොඉක්මවිය යුතුය.
   (උ) ප්‍රදනය කරන ලද පහසුකම්, ඒ සඳහා ණයදෙන බැංකු මගින් ප්‍රාථමික උකස් සහ සින්නක්කර පදනම මත පවත්වාගෙන යනු ලබන නිශ්චල දේපලවල, වටිනාකමින් 60% නොඉක්මවිය යුතුය.
   (ඌ) ප්‍රදනය කරන ලද පහසුකම්,

      (i) ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් ප්‍රදනය කරන ලද බදු
      (ii) බද්දේ කල් ඉකුත් නොවූ කාලය අවම වශයෙන් අවුරුදු 50 වන
      (iii) බදු ඔප්පුවෙහි අඩංගු බැඳුම්කර අයිතිවාසිකම්වල උකස මත තහනම් නොවන, හෝ බදුකර අයිතිවාසිකම්වල උකස සඳහා බදුදයකයාගේ පෙර අනුමතය, බදු ඔප්පුවට උවමනා කරන්නේ නම්, බදු දයකයාගෙන් ලබාගන්නා ලද එබඳු අනුමතකිරීම්.

(iv) ණයදෙන බැංකු මගින් බදුකර අයිතිවාසිකම් මත ගන්නා ලද ප්‍රාථමික උකස් යන , කරුණුවලට යටත් වූ බදුපදනම මත පවත්වාගෙන යන නිශ්චල දේපලවලින් 60% ක් නොඉක්මවිය යුතුය.

(එ) ප්‍රදානය කරන ලද පහසුකම්, කොළඹ සුරැකුම්පත් හුවමාරුවේ ලැයිස්තුගත පොදු සමාගම්වල කොටස්, වල වෙළෙඳපොළ වටිනාකම් 50% නොඉක්මවිය යුතුය.

(ඒ) ප්‍රදානය කරන ලද පහසුකම්, උකස් කල බඩු තොගවල වෙළෙඳපොළ වටිනාකමින් 30% නොඉක්මවිය යුතුය.

(ඔ) ප්‍රාථමික සහ ද්විතීය උකසට යටත්ව ප්‍රදානය කරන ලද මුළු පහසුකම්, මුදල් නීති පනතේ 127 වන වගන්තියේ අර්ථ දක්වන පරිදි, සැලකිය යුතු ඇල්මක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු හැර අනෙකුත් ආයතන විසින් දරනු ලබන සින්නක්කර හා ණය දෙන බැංකු විසින් දෙනු ලබන ද්විතීය උකසට යටත්ව නිශ්චල දේපලවල වටිනාකමින් 60% නොඉක්ම විය යුතුය.

(ඕ) ප්‍රදානය කරන ලද පහසුකම්, සීමිත ජීව කාලයක් ඇති දේවල් සහ සියළුම නිෂ්පාදිත ආහාර හැර, විකිණීමට සූදානම් වාණිජ ස්වභාවයක් ඇති නරක් නොවන සුළු භාණ්ඩවල ඇපයෙහි වෙළෙඳපොළ වටිනාකමින් 40% නොඉක්මවිය යුතුය.

2. 47(5) වගන්තියෙහි අරමුණු සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මගින් ප්‍රදානය කරන ලද පහසුකම්වලට අනුකූලව, එබඳු බැංකුවක අධ්‍යක්ෂකවරයකුට තිබෙන සැහෙන සම්බන්ධතාවය සැලකීමට, එබඳු අධ්‍යක්ෂකවරයෙකු ගේ සැහෙන සම්බන්ධතාවය

(i) සමාගමක් සළකා බැලීමේදී, එහි ගෙවනලද ප්‍රාග්ධනයෙන් 10% ට වඩා වැඩි නොවූ නමුත් රුපියල් මිලියනය ඉක්ම වූ හෝ ප්‍රාග්ධනයෙන් 10% ඉක්ම නොවන වන්දි පූරණය හෝ ඇපකරයෙහි පැවැත්ම

(ii) ව්‍යාපාර ආයතනය සළකා බැලීමේදී එහි සියළු හවුල්කරුවන් විසින් යෙදවූ මුළු ප්‍රාග්ධනයෙන් 10%ට අඩුවෙන් වන්දිපූරණය හෝ ඇපකරයෙහි පැවැත්ම,
යන මෙවැනි සුරැකුම්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සලකන පරිදි බැරකම් වටිනාකමට සැහෙන ලෙස ලබාගත යුතුය. මෙවැනි පහසුකම් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත, විය පැහැදම් කර සතියක් තුළ වාර්තා කළ යුතුය.

## 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතෙහි 47(4) වන්තියට අනුකූලව ප්‍රකාශිත නියෝගය.

2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතෙහි 47(4) වගන්තියට අනුකූලව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් එම බැංකුවල අධ්‍යක්ෂකවරුන් හට හෝ ඔවුන්ගේ කිට්ටු ඥාතීන්ට ප්‍රදානය කරන ලද ණය මුදල සම්බන්ධ පහත සඳහන් සීමාවන් 2005 පෙබරවාරි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

(අ) 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරණ බැංකු පනතෙහි 47(3) වගන්තියට අනුකූලව මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද තීරණයේ (අ) සහ (ඉ) යන අයිතමයන්හි සඳහන්, මුදල් හෝ ආසන්න මුදල් මගින් සුරැකුම් කරන ලද ණය මුදල එහි සඳහන් අවසර දෙනු ලැබූ සීමාව දක්වා,

(ආ) අනෙකුත් අනුමත සුරැකුම් මත ප්‍රදානය කරන ලද ණය පහසුකම් රුපියල් ලක්ෂ පහ (රු. 500,000/-) සීමාව තෙක්

(ඇ) බැංකුවක් විසින් අනෙකුත් ගනුදෙනු කරුවන්ට පහසුකම් සපයන නියම හා කොන්දේසි යටතේම රුපියල් ලක්ෂ පහ (රු. 500,000) දක්වා ක්‍රෙඩිට් කාඩ් පත් මත පහසුකම් ප්‍රදානය කළ හැක.

අත්සන් කළේ / **සුනිල් මෙන්ඩිස්**

අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2005 පෙබරවාරි 11 දින
කොළඹ.

**02/04/004/0010/001**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 පෙබරවාරි 18

වෙත:- බලපත්‍රලාභි විශේෂිත බැංකු සහ බලපත්‍රලාභි වාණිජ බැංකුවල
ප්‍රධාන විධායක නිලධාරීන්,

මහත්මයාණෙනි,

## කාර්තුමය සහ මාසික පදනම යටතේ අනුකූලතා වාර්තා ඉදිරිපත් කිරීම

2005.02.17 දින පවත්වන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී ඉහත සඳහන් කරුණ මත කරන ලද සාකච්ඡාව සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2001 ඔක්තෝබර් 26 දිනට චක්‍රලේඛය වෙත මා විසින් අවධානය යොමු කෙරේ.

එකඟවූ පරිදි, කාර්තුමය සහ මාසික පදනමින් මෙම දෙපාර්තමේන්තුවට භාරදෙන අනුකූලතා වාර්තා, අදළ බැංකුවෙහි ප්‍රධාන විධායක නිලධාරිතුමා විසින් අත්සන් කළ යුතු බවට සියළුම බැංකුවලට දැනුම් දෙනු ලැබේ

2005 පෙබරවාරි සිට ඉදිරියට භාරදීමට නියමිත අනුකූලතා වාර්තා සඳහා මෙය බලපානු ඇත.

මෙයට,
විශ්වාසී,

අධ්‍යක්ෂ
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පිටපත:- ලේකම් - ජෙනරාල්,
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (ඇපයෙන් සීමිත) සමාගම.

**02/04/003/0400/001**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 පෙබරවාරි 18

වෙත:- බලපත්‍රලාභි විශේෂිත බැංකු සහ බලපත්‍රලාභි වාණිජ
බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

මහත්මයාණෙනි,

## පුවත්පත්වල බැංකු ගිණුම් පළකිරීම මගින් මහජනයාට හෙළිදරව් කිරීම

2005.02.17 දින පවත්වන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි, ඉහත සඳහන් කාරණය මත 2003.01.30 දින යොමු අංක/02/04/003/0400/001 සහ අංක/BS/62/97 දරන 1999.01.29 දිනැති අපගේ චක්‍රලේඛය වෙත අවධානය යොමු කෙරේ.

පුවත්පත් තුල මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව සහ ත්‍රෛ මාසිකව පළ කිරීමේදී පහත සඳහන් ව්‍යවස්ථාපිත සහ විචක්ෂණ අනුපාත එළිදරව් කළ යුතු බව සියළුම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

- ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය
- ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකකය සහ අක්වෙරළ බැංකු ඒකකය වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය)
- අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (දළ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය සහ ශුද්ධ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය) .

මෙම චක්‍රලේඛය, 2005 පළමු කාර්තුවේ සිට බැංකුවල මූල්‍ය ප්‍රකාශන සඳහා බලපැවැත්වේ.

මෙයට,
විශ්වාසී,

පිටපත:-
ලේකම් - ජෙනරාල්,
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (ඇපයෙන් සීමිත) සමාගම.

අධ්‍යක්ෂ
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 මාර්තු 7

වෙත:- සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## බැංකු පනත (කේවල ණයගැති සීමාව) 2005 අංක 2 දරන විධානය

අද දින සිට බලපැවැත්වෙන පරිදි ඉහත විධානය මේ සමඟ අමුනා ඇත.

මෙය ලැබුන බව දන්වා එවන්න.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ / බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

## 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනතින් හා 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත

2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනතින් හා 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 46 (1)(ඇ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානය.

2005 මාර්තු 07
කොළඹ.

**සුනිල් මෙන්ඩිස්**
අධිපති

## බැංකු පනත (කේවල ණයගැති සීමාව) 2005 අංක 2 දරන විධානය

1. මෙම විධානය 2005 අංක 2 දරන බැංකු පනත් (කේවල ණය ගැති සීමාව) පිළිබඳ විධානය ලෙස හඳුන්වනු ලබන අතර, එය 2005 මාර්තු මස 07 වන දින සිට බලපවත්වනු ලැබේ.

2. 2005 අංක 2 දරන සහ 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනත් මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) ඇ(i) වගන්තියේ වර්ග කිරීම්වලට අනුව යම් එක් ගණුදෙනුකරුවකුට හෝ 46 1 (ඇ) (ii) වගන්තියට අනුව ගණදෙනුකරුවන්ගේ එකතුවකට දෙනු ලබන පහසුකම්වල එකතුව පසුගිය මුදල් වර්ෂය අවසානයේ පැවති එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ප්‍රාග්ධන අරමුදල්වලින් 30% නොඉක්මවිය යුතුය.

3. තවද,46 (i) ඇ(i) වගන්තියට අනුව යම් එක් ගණුදෙනුකරුවකුට ප්‍රධානය කරනු ලබන පහසුකම් හෝ 46(i) ඇ(ii) වගන්තියට අනුව ගණුදෙනුකරුවන් එකතුවකට ප්‍රධානය කරනු ලබන පහසුකම්වල එකතුව බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ප්‍රාග්ධන අරමුදලින් 15% ඉක්මවන්නේ නම් එම සියළුම ගණුදෙනුකරුවන්ට ප්‍රධානය කරනු ලබන පහසුකම්වල එකතුව පසුගිය මුදල් වර්ෂයේ අවසානයට එම බැංකුවේ සියළු පහසුකම් ප්‍රමාණයෙන් 50% නොඉක්මවිය යුතුය.

4. 2 වන හා 3 ඡේදයන්ට යටත්ව ප්‍රදනය කලහැකි පහසුකම්වල උපරිම ප්‍රමාණය ගණනය කිරීම සඳහා පවත්නා පහසුකම් සීමාව හෝ සියළු නොගෙවූ පහසුකම්වල ප්‍රමාණය යන දෙකෙන් වැඩි අගයක් ගන්නා සහ මෙම විධානයන් බලපැවැත්වීමට පෙර හෝ පසු දිනයක් ද යන්න සැලකිල්ලට ගත යුතුය.

5. කේවල ණයගැති සීමාව සලකා බැලීමේදී, 46 (i) ඇ(i) වගන්තියේ වර්ගකිරීම්වලට අයත්වන ගණුදෙනුකරුවකු හෝ 46 (i) ඇ (ii) වගන්තිය අනුව ගණුදෙනුකරුවන්ගේ එකතුවකට ප්‍රදනය කරනු ලබන පහසුකම්වල එකතුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක දේශීය හා අක්වෙරළ බැංකු ඒකක මගින් ප්‍රධානය කරනු ලබන පහසුකම් එකතු කරනු ලබන අවස්ථාවකදී 2 හා 3 ඡේදයන්ගේ සඳහන් සීමාවන් නොඉක්මවිය යුතුය.

6. කේවල ණයගැති සීමාව ගණනය කිරීමේදී පහත (i) සිට (iv) දක්වා ඇති අයිතමයන්වල සුරැකුම යටතේ 46 (i) ඇ (i) වර්ග කිරීම්වලට සහ 46 (i) ඇ (ii) වර්ග කිරීම්වලට අයත්වන ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම් ඇතුළත් කර නොගත යුතුය.

   1. මුදල්
   2. රජයේ/මහ බැංකුවේ සුරැකුම්පත්
   3. භාණ්ඩාගාර/මහ බැංකු ඇපකර
   4. ආසියානු සංවර්ධන බැංකුව, අන්තර් ජාතික සංවර්ධන සංගමය, ලෝක බැංකුව හෝ මහ බැංකුවට පිළිගත හැකි වෙනත් ආයතන විසින් නිකුත් කළ ඇපකර.

7. පහත සඳහන් ආයතන වෙත/පහත දක්වා ඇති පරිදි බලපත්‍රලාභි වාණිජ බැංකු විසින් දෙවන හා තුන්වන ඡේදවල දක්වා ඇති සීමාවන් ඉක්මවා පහසුකම් ප්‍රධානය කරනු ලැබිය හැකිය.

   1. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.
   2. ලංකා විදුලිබල මණ්ඩලය
   3. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව හෝ
   4. ගනුදෙනුකරුවකුට/ගනුදෙනුකරුවන්ට සෘජු ලෙසම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රයෝජනයට ගැනීමට පහසුකම් ප්‍රධානය කරනු ලබන්නේ නම් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව
      (අ) ගනුදෙනුකරු/ගණුදෙනුකරුවන් සෘජු ලෙසම යටිතල පහසුකම් සංවර්ධනය කරන ව්‍යාපෘතියක් සඳහා ගිවිසුමක් තිබිය යුතුය.
      (ආ) බැංකු විසින් ප්‍රධානය කරනු ලබන පහසුකම් හැරුණුවිට, එම ව්‍යාපෘතියට ලංකාවට පිටතින් හෝ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ/හෝ බලපත්‍රලාභී විශේෂ බැංකු සහවාසයක් විසින් අවම වශයෙන් 50% ප්‍රමාණයේ අරමුදල් සපයන විට.
      (ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් එම පහසුකම බෙදහැරීමට පෙර එය ඉහත (අ) සහ (ආ) කොන්දේසිවලට අනුකූල බවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකට ලිඛිතව සහතික විය යුතුය.

8. බලපත්‍රලාභි වාණිජ බැංකුවක් විසින් එහි ප්‍රාග්ධනය පසු කාලීනව ඉහළ දමන අවස්ථාවලදී:

   (i) නව කොටස් නිකුතුවකින් හෝ හිමිකම් නිකුතුවකින් හෝ නව පවරාදුන් ප්‍රාග්ධනයකින් අරමුදල් ලැබුණු අවස්ථාවකදී ඉහළගිය ප්‍රාග්ධන අරමුදල් පදනම් කරගෙන (2) සහ (3) වගන්ති යටතේ කේවල ණයගැති සීමාව ගණනය කරනු ලබන්නේ නව අරමුදල් ලැබුණු පසු සහ එය පොත්වල ගිණුම්ගත වූ දිනට පසුවය.
   (ii) පවත්නා වර්ෂයේ ලාභය ප්‍රාග්ධනිතකරණය මගින් ඉහළගිය ප්‍රාග්ධන අරමුදල් පදනම් කර ගනිමින්(2) සහ (3) ඡේද යටතේ කේවල ණයගැති සීමාව ගණනය කලහැක්කේ එම ලාභය බාහිර විගණකවරයකු විසින් සහතික කල පසුවය.

9. ලාභාංශ ගෙවීමෙන් හෝ ලාභ සිය රටට ප්‍රේෂනය කිරීමෙන් ප්‍රාග්ධනය අඩුවීමක් හේතුවෙන් හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, පවත්නා වර්ෂයේ පාඩු දරීමක් සිදුවුවහොත් හෝ 2 හා 3 ඡේදයන්ට අනුව කේවල ණය ගැති සීමාව ගණනය කළ යුත්තේ අඩු වූ ප්‍රාග්ධන අරමුදල් පදනම් කරගෙනය.

10. බැංකු පනතේ 1999 අංක 2 දරන විධානය (කේවල ණයගැති සීමාව) සහ 2004 ජූලි 16 වන දින දරන කේවල ණයගැති සීමාව පිළිබඳ චක්‍රලේඛයට අනුව ඔවුන්ගේ අත්තිකාරම් මත කේවල ණයගැති සීමාව ගණනය කරනු ලබන, ලංකාවට පිටතින් පිහිටුවා ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු, කේවල ණයගැති සීමාව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ප්‍රාග්ධන අරමුදල් නොමැතිවිට, 2005 ජූනි 30 වනවිට එම අරමුදල් හිඟයෙන් 50%ක් රැස්කර ගතයුතු අතර 2005 දෙසැම්බර් 31 වනවිට ඉතිරි ප්‍රාග්ධන ප්‍රමාණය රැස්කර ගැනීමෙන් මෙම විධානය මගින් ගිවිසගත් කේවල ණයගැති සීමාවට අනුකූල විය යුතුය.

11. යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මෙම විධානයන් උල්ලංඝනය කරයි නම් එම උල්ලංඝනය කරනු ලබන කාලය තුල එම බැංකුව විසින් ලාභ සිය රටට ප්‍රේෂනය කිරීම හෝ ලාභාංශ ගෙවීම නොකළ යුතුය.

12. බැංකු පනතේ (කේවල ණයගැති සීමාව) විධානයන් වන 2003 නොවැම්බර් 18 සහ 2002 දෙසැම්බර් 24 මගින් සංශෝධිත 1999 අංක 2 දරන විධානයන් සහ 2004 ජූලි 16 දිනැති විදේශීය බැංකු සඳහා බලපාන කේවල ණයගැති සීමාව පිළිබඳ වූ චක්‍රලේඛය වෙනුවට මෙම විධානයන් ආදේශ කළ යුතුය.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 මාර්තු 17

වෙත:- බලපත්‍රලාභි විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## අධ්‍යක්ෂකවරුන්ට හා ඔවුන්ට සම්බන්ධිත සමාගම්වලට දෙනු ලබන පහසුකම්

2005.03 .17 දින පවත්වන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී දැන්වූ පරිදි ,බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කරන ලද ඉහත කරුණුමත වූ විධානයන් සමඟ සංගතවීම සඳහා බැංකු පනතෙහි 76 ඒ(1) වගන්තිය යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නිකුත් කර ඇති විධානයන්ට කරනු ලබන සංශෝධන පිළිබඳව මෙයින් ඔබව දැනුවත් කරනු ලැබේ.

එම සංශෝධිත විධානයන් මේ සමඟ අමුණා ඇත.

මෙයට විශ්වාසී,

අත්සන් කළේ
අධ්‍යක්ෂ / බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පිටපත :- ලේකම් ජෙනරාල්,
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (ඇපයෙන් සීමිත)සමාගම.

## 2005 අංක 02 සහ 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනත්වලින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත

2005 අංක 2 සහ 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 76 ඒ(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්වලට කෙරෙන සංශෝධනයන්.

2005.03.17 අත්සන් කළේ / **සුනිල් මෙන්ඩිස්**
කොළඹ අධිපති

## අධ්‍යක්ෂවරුන්ට සහ ඔවුනට සම්බන්ධිත සමාගම්වලට දෙනු ලබන පහසුකම් සම්බන්ධව බැංකු පනතේ 76 ඒ (1) වගන්තිය යටතේ නිකුත් කර ඇති විධානයන්ට කරනු ලබන සංශෝධනය

මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අධ්‍යක්ෂකවරුන්ට සහ සම්බන්ධිත සමාගම්වලට දෙනු ලබන පහසුකම් පිළිබඳවූ 1997.11.21 දිනැති විධානය පහත පරිදි සංශෝධනය කරන ලදී.

1. උපවගන්තිය අවලංගු කිරීමෙන් සහ පහත සඳහන් ලෙස එයට ආදේශනය කරමින් ;

1.1 "එහි කිසිදු අධ්‍යක්ෂකවරයෙකුට හෝ ඔහුගේ කිට්ටු ඥාතිවරයෙකුට රුපියල් 500,000 ක ණය පහසුකම් ඉක්මවා යන සහ නිකුත් කරන ලද ණය කාඩ්පත් මගින් සපයන පහසුකම් හැර එවැනි පහසුකම් (7) වැනි වගන්තියේ දක්වෙන සුරැකුම් මගින් සුරක්ෂිත කළ යුතුය.
නිකුත් කරන ලද ණය කාඩ්පත් මගින් පහසුකම් සැපයීමේදී එම බැංකුවේ අනෙකුත් ගණුදෙනුකරුවන් සඳහා වන නියම හා කොන්දේසි යටතේම රුපියල් 500,000 ක සීමාවකට යටත්ව එම පහසුකම් ලබාදිය යුතුය.
කෙසේ වෙතත්, පහත 7.1 සිට 7.5 උප වගන්ති යටතේ දක්වා ඇති සුරැකුම් මත සුරක්ෂිත කරන ලද පහසුකම් ප්‍රදානය කළ හැක්කේ අදළ උපවගන්තියෙහි දක්වා ඇති අවසර දෙන ලද සුරැකුම් මත වූ සීමාවලට යටත්වය".

2. 6 වැනි වගන්තියට පසුව 6.1 වගන්තිය ඇතුලත් කිරීම මගින්:

6.1 "ඕනෑම මූල්‍ය වර්ෂයක් තුළ, පළමුවැනි වගන්තිය යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් මගින් පහසුකම් සපයන විටක එවැනි පහසුකම්, එම මූල්‍ය වර්ෂයේ ගිණුම් තුළ ඇතුළත් විය යුතු අතර එම පහසුකම් නැවත ගෙවා දමන තෙක් හෝ සම්පූර්ණයෙන් ගෙවා දමන තුරු ඊළඟ සෑම මූල්‍ය වර්ෂයකම ගිණුම් තුළ ඇතුළත් කළ යුතුය".
ඉහත සංශෝධනය වහාම ක්‍රියාත්මක වනු ඇත.

## 2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනතින් සහ 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනත

2005 අංක 2 දරන බැංකු (සංශෝධිත) පනතින් සහ 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 76 ඒ (1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්

2005 මාර්තු 18 අත්සන් කළේ / **සුනිල් මෙන්ඩිස්**
කොළඹ අධිපති

## 2005 අංක 3 දරන බැංකු පනත (කේවල ණයගැති සීමාව) විධානය

(1) 2005 මාර්තු මස 21 දින සිට බලපැවැත්වෙන පරිදි, බැංකු පනතෙහි (කේවල ණයගැති සීමාව) 2005 අංක 3 දරණ විධානයන් ලෙස මෙම විධානයන් සඳහන් විය යුතුය.

(2) බැංකු පනතෙහි අර්ථ දක්වන පරිදි ප්‍රාග්ධනයක් සහිත බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් පසුගිය මූල්‍ය වර්ෂය අවසානයේදී පැවති ප්‍රාග්ධන අරමුදලින් 30% නොඉක්මවන ලෙසට පහත සඳහන් අයට පහසුකම් සැලසිය යුතුය.

2.1 කිසියම් පුද්ගලයෙකුට, පුද්ගල සමාගමකට, ආයතනයකට,රාජ්‍ය සංස්ථාවකට හෝ සමාගමකට.
2.2 සමස්තයක් වශයෙන් ගත්විට,
2.2.1 කිසියම් පුද්ගලයෙකුට, ඔහුගේ කිට්ටු ඥාතියෙකුට හෝ ඔහුට සැහෙන සම්බන්ධතාවයක් ඇති සමාගමකට හෝ ආයතනයකට.
2.2.2 කිසියම් සමාගමකට සහ පහත සඳහන් ඒවායින් කිසිවකට හෝ කිහිපයකට
2.2.2.1 එහි පාලිත සමාගම්වලට
2.2.2.2 එහි පාලක සමාගමකට
2.2.2.3 එහි ආශ්‍රිත සමාගමකට

2.2.2.4 එහි පාලක සමාගමේ පාලිත සමාගමකට

2.2.2.5 එම සමාගමට සැහෙන සම්බන්ධතාවයක් ඇති තවත් සමාගමකට හෝ එහි පාලිත සමාගම කට හෝ එහි පාලක සමාගමකට හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමකට

(3) ඉහත 2.2.1 යටතේ සඳහන් කරන ලද ඕනෑම ගනුදෙනුකරුවෙකුට දෙනු ලබන පහසුකම් හෝ ඉහත 2.2.2 ඡේදය යටතේ සඳහන් ඕනෑම ගණුදෙනුකරුවන්ගේ එකතුවකට ප්‍රධානය කරනු ලබන පහසුකම්වල එකතුව බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ ප්‍රාග්ධන අරමුදලින් 15% ඉක්මවන විටක එම සියළුම ගණුදෙනුකරුවන්ට සපයන ලද ණය පහසුකම්වල එකතුව මීට ඉහත මූල්‍ය වර්ෂයේ අවසානයේ එම බැංකුවල මුළු පහසුකම් වලින් 50% නොඉක්මවිය යුතුය.

(4) 2 වන හා 3 වන ඡේදයන්ට යටත්ව ප්‍රදානය කළහැකි පහසුකම්වල උපරිම ප්‍රමාණය ගණනය කිරීමේ අරමුණ සඳහා පවත්නා පහසුකම් සීමාව හෝ සියළු නොගෙවූ පහසුකම්වල ප්‍රමාණය යන දෙකෙන් වැඩි අගයක් ගන්නා සහ මෙම විධානයන් බලපැවැත්වීමට පෙර හෝ පසු දිනයක ප්‍රධානය කරනු ලැබූ පහසුකම් ද සැලකිල්ලට ගතයුතුය.

(5) පහත සඳහන් 5.1 සිට 5.4 දක්වා ඇති සුරැකුම් යටතේ ඉහත 2.1 හෝ 2.2 ඡේදවල වර්ග කිරීම් වලට අයත්වන ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම් කේවල ණයගැති සීමාව ගණනය කිරීමේදී ඇතුළත් කර නොගත යුතුය.

5.1 මුදල්
5.2 රජය/ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත්
5.3 භාණ්ඩාගාරය/ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇපකර
5.4 ආසියානු සංවර්ධන බැංකුව, අන්තර් ජාතික සංවර්ධන සංගමය, ලෝක බැංකුව හෝ මහ බැංකුවට පිළිගත හැකි වෙනත් ආයතන විසින් නිකුත් කල ඇපකර.

(6) පහත සඳහන් ආයතන වෙත පහත දක්වා ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් 2 වන සහ 3 වන ඡේදවල දක්වා ඇත සීමාවන් ඉක්මවා, පහසුකම් ප්‍රදානය කරනු ලැබිය හැකිය.

6.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
6.2 ලංකා විදුලිබල මණ්ඩලය,
6.3 සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව හෝ
6.4 ගනුදෙනුකරුවකුට හෝ ගනුදෙනුකරුවන්ට සෘජු ලෙසම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රයෝජනයටගැනීමට පහසුකම් ප්‍රදානය කරනු ලබන්නේ නම් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව

6.4.1 ගණුදෙනුකරු/ගණුදෙනුකරුවන් සෘජු ලෙසම යටිතල පහසුකම් සංවර්ධනය කරන ව්‍යාපෘතියක් සඳහා ගිවිසුමක් තිබිය යුතුය.

6.4.2 බැංකු විසින් පහසුකම් ප්‍රදානය කිරීම හැරුණුවිට එම ව්‍යාපෘතියට ලංකාවට පිටතින් හෝ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ/හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකු සහවාසයක් විසින් අවම වශයෙන් 50% ප්‍රමාණයේ අරමුදල් සපයන විට

6.4.3 බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් එම පහසුකම් බෙදාහැරීමට පෙර 6.4.1 සහ 6.4.2 කොන්දේසිවලට අනුකූල බවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂට ලිඛිතව සහතික විය යුතුය.

(7) බලපත්‍රලාභි විශේෂිත බැංකුවක් විසින් එහි ප්‍රාග්ධන අරමුදල පසු කාලීනව ඉහළ දමන අවස්ථාවලදී;

7.1 නව කොටස් නිකුතුවකින් හෝ හිමිකම් නිකුතුවකින් අරමුදල් ලැබුණු අවස්ථාවකදී කේවල ණය ගැති සීමාවන් ඉහළ ගිය ප්‍රාග්ධන අරමුදල් පදනම් කර ගෙන 2 සහ 3 ඡේද යටතේ ගණනය කරනු ලබන්නේ නව අරමුදල් ලැබුණු දින සහ එය පොත්වල ගිණුම්ගත වූ දින සැලකිල්ලට ගැනීමෙනි.

7.2 බාහිර විගණකාධිවරයකු විසින් සහතික කල පවත්නා වර්ෂයේ ලාභය ප්‍රාග්ධනීකරණය මගින් ඉහළගිය ප්‍රාග්ධන අරමුදල් පදනම් කර ගනිමින් 2 සහ 3 ඡේද යටතේ කේවල ණය ගැති සීමාව ගණනය කළ හැක.

(8) ලාභාංශ ගෙවීමෙන් ප්‍රාග්ධන අඩුවීමක් හේතුවෙන් හෝ බලපත්‍රලාබී විශේෂිත බැංකුවක් පවත්නා වර්ෂයේ පාඩු දැරීමක් සිදුවුවහොත් 2 හා 3 ඡේදයන් යටතේ කේවල ණයගැති සීමාව ගණනය කළ යුත්තේ අඩු වූ ප්‍රාග්ධන අරමුදල් - පදනම් කරගෙනය.

(9) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් මෙම විධානයන් උල්ලංඝනය කරනු ලබන කාලය තුළ එම ැංකුව විසින් ලාභාංශ ගෙවීම නොකළ යුතුය.

(10) 2003 නොවැම්බර් 18 දින සංශෝධනය කරන ලද බැංකු පනතේ (කේවල ණයගැති සීමාව) 1997.11.21 දිනැති නියෝගයෙන් මෙම නියෝග ප්‍රතිස්ථාපනය කරන ලදී.

**02/04/002/0012/002**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 මාර්තු 31

වෙත:- බලපත්‍රලාභී වාණිජ (දේශීය) බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල
ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## බැංකු අධ්‍යක්ෂකවරුන් පත් කිරීම

(සංශෝධිත 1988 අංක 30 දරණ බැංකු පනතේ 42 වැනි වගන්තිය)

බැංකු පනතෙහි 42(1) වැනි වගන්තිය පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂකවරයෙකු ලෙස ඡන්දයෙන් පත් කරන හෝ නාම යෝජනා කරන අයෙකු හෝ එවැනි බැංකුවක දිගටම අධ්‍යක්ෂකවරයෙකු ලෙස සිටි අයෙකු එම කාර්ය භාරයන් සඳහා සුදුසු සහ නිසි පුද්ගලයෙකු විය යුතු අතර වෙනත් ලිඛිත නීතියක් මගින් හෝ බැංකු පනතෙහි ප්‍රතිපාදනයක් මගින් එසේ කිරීම වැලැක්වීම නොකළ යුතුය. යම් පුද්ගලයකු එසේ සුදුසු ද සහ නිසිවග තහවුරු කර ගැනීමේදී සලකා බැලිය යුතු විශේෂිත වූ කරුණු එම වගන්තියෙහි තවදුරටත් දක්වා ඇත.

තවදුරටත්, පනතෙහි 42(4) වගන්තියට අනුව, 42(5) වගන්තිය යටතේ අනුමත කිරීම සඳහා යෝජනා කරන ලද/පත්කරන ලද/ඡන්දයෙන් පත් කරන ලද/නාම යෝජනා කරන ලද අධ්‍යක්ෂකවරුන්ගේ තොරතුරු, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකට දැනුම්දීම, සියළුම බැංකු විසින් සිදුකළ යුතුය. බලපත්‍රලාභී වාණිජ බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය, එම මණ්ඩලයට පත් කිරීමට හෝ ඡන්දයෙන් පත් කිරීමට හෝ නාම යෝජනා කිරීමට අදහස් කරන පුද්ගලයාගේ ප්‍රමාණවත් තොරතුරු එවැනි පත් කිරීමකට ඡන්දයෙන් පත්කිරීමකට හෝ නාම යෝජනා මගින් පත් කිරීමට පෙර දැනට සිටින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

මේ සඳහා, මණ්ඩලයට නම ඉදිරිපත් කරන ලද හෝ බැංකු අධ්‍යක්ෂක ලෙස පත්ව සිටින හෝ ඡන්දය සඳහා නම් ඉදිරිපත් කරන ලද පුද්ගලයන්ගේ සහ සියළු අධ්‍යක්ෂකවරුන්ගෙන් ලබා ගතයුතු දිවුරුම් ප්‍රකාශයක ආකෘති පත්‍රයක් මේ සමඟ අමුණා ඇත. දිවුරුම් ප්‍රකාශනයට අමතරව බැංකුවේ අධ්‍යක්ෂවරුන් පනතෙහි අනෙකුත් ප්‍රතිපාදනයන් සමග එකඟ වන බව බැංකුවට තහවුරු කර ගැනීම පිණිස එම පුද්ගලයන්ගෙන් ප්‍රකාශයක් ලබාගත යුතුය. මේ සඳහා ඇමුණුම් 2 හි ඇති කෙටුම්පත් කරන ලද ප්‍රකාශය භාවිතා කළ හැක. අධ්‍යක්ෂවරයකු පත්කිරීම, ඡන්දයෙන් පත්කිරීම හෝ නාම යෝජනා කිරීම සඳහා අනුමැතිය බලාපොරොත්තු වන විටක 42 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තියෙහි සඳහන් කර ඇති තොරතුරු සමගින් පත් කිරීමට යන පුද්ගලයන්ගේ දිවුරුම් ප්‍රකාශයෙහි හා දෙවැනි ප්‍රකාශයේ පිටපතක් සෑම බැංකුවකම ලේකම් විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත සැපයිය යුතුය.

දැනට සිටින අධ්‍යක්ෂකවරුන් සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශය සහ අනෙක් ප්‍රකාශය ලබාගත යුතු අතර දැනට කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයන්හි පිටපත් ශ්‍රී ලංකා මහ බැංකුවට 2005 අප්‍රේල් 30 ට පෙර ලබාදිය යුතුය. මින් ඉදිරියට දිගටම රැඳී සිටින අධ්‍යක්ෂවරුන්ගේ දිවුරුම් ප්‍රකාශයේ හා අනෙක් ප්‍රකාශයේ පිටපත් වාර්ෂික සභා රැස්වීමට පෙර ශ්‍රී ලකා මහ බැංකුවට වාර්ෂිකව සැපයිය යුතුය.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ/බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පිටපත :- උපාලි ද සිල්වා මහතා,
ලේකම් - ජෙනරාල්,
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (ඇපයෙන් සීමිත) සමාගම,
8 වෙනි මහල, සෙලින්කෝ නිවස, 69, ජනාධිපති මාවත, කොළඹ 01.

## බැංකු පනතේ 42(2) වගන්තිය යටතේ ඉදිරිපත් කල යුතු දිවුරුම් ප්‍රකාශය

..........................................................................................................වන මම (බෞද්ධ/හින්දු පුද්ගලයෙකු වශයෙන් විශ්වාසවන්තව සහ සත්‍ය ලෙස ..........................................................................................................ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් පුද්ගලයෙක් වශයෙන් දිවුරා පහත පරිදි ප්‍රකාශ කරමි.

(අ) 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ බලපත්‍ර ලද, බලපත්‍රලාභී විශේෂිත බැංකුව/බලපත්‍රලාභි වාණිජ බැංකුව වන ..........................................................................................................හි (නම් කරන ලද අධ්‍යක්ෂක / තෝරා පත් කරන ලද අධ්‍යක්ෂක / අධ්‍යක්ෂක) ඉහත නම සඳහන් (සන්තක කරු / දිවුරුම් පත් ප්‍රකාශකයා) මම වෙමි.

(ආ) මම පහත සඳහන් වෘත්තීය සහ /හෝ අධ්‍යාපනික සුදුසුකම් මා විසින් සපුරා ඇති බවට (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(ඇ) මම පහත සඳහන් බැංකු කටයුතු, මූල්‍ය කටයුතු, ව්‍යාපාරික කටයුතු, පරිපාලන කටයුතු හෝ වෙනත් අදාළ විෂයයක් පිළිබඳව කාර්යසාධක අත්දැකීම් ලබා ඇති බවට (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(ඈ) මම වංචාවක්, රැවටීමක්. වංක ක්‍රියාවක් හෝ වෙනත් යම් නුසුදුසු ක්‍රියාවක් සංයුක්ත වන යම් ක්‍රියාවක් සිදුකර ඇති හෝ සිදු කිරීමෙහිලා සම්බන්ධ වී ඇති බවට, නීතිය මගින් ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පිහිටුවන ලද යම් පාලන අධිකාරියක් හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය අධිකාරියක් හෝ වෙනත් මණ්ඩලයක් මගින් තීරණය කරනු ලැබ නොමැති බවට (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(ඉ) මම ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක, නීතියක් මගින් පිහිටුවන ලද යම් පාලන අධිකාරියක්. අධීක්ෂණ අධිකාරියක්, වෘත්තිමය සංගමයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය අධිකාරියක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන අපරාධ ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ චෝදනාවක් පිළිබඳ දන්වීමක් භාරදීමෙන් පසු පවත්වනු ලබන විමර්ශනයකට හෝ පරීක්ෂණයකට භාජනය වී නොමැති බවට (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(ඊ) මම මූල්‍ය කළමනාකරණයට අදළව සිදු කරන ලද අපරාධයක් හෝ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් අධීක්ෂණයක් විසින් වරදකරුවකු කරනු ලැබ නොමැති බවට (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(උ) මම ශ්‍රී ලංකාවේදී හෝ විදේශ රටකදී බුන්වත් භාවයෙන් නිදහස් කරන නොලැබූ තැනැත්තෙකු නොවන බව හෝ බංකොලොත්භාවයට පත් තැනැත්තෙකු නොවන බව (ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දෙමි)

(ඌ) මම ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක තිසි බලය ලත් යම් අධීක්ෂණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් අනුව ක්‍රියා කිරීමට හෝ ණය මුදලක් ආපසු ගෙවීම පැහැර හැර නොමැති බවට (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(එ) මම සිහිවිකල් තැනැත්තෙකු බවට ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බලයලත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ නොමැති බව (ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි)

(ඒ) මම යම් පාලන අධිකාරියක් හෝ අධීක්ෂණ අධිකාරියක් මගින්, ශ්‍රී ලංකාවේ හෝ යම් විදේශ රටක යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක හෝ සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරකු වශයෙන් සේවය කිරීමෙන් නෙරපනු ලැබ නොමැති බව හෝ සේවය අත්හිටවනු ලැබ නොමැති බව (ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි)

(ඔ) (i) බලපත්‍රය අත්හිටවනු ලැබ ඇති හෝ අවලංගු කරනු ලැබ ඇති හෝ

(ii) ගණන් බේරා වසා ඇති හෝ ගණන් බේරා වසා දමනු ලබන හෝ අනිවාර්යයෙන් ඈවර කරනු ලබන, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් හෝ සේවය කොට නොමැති බව හෝ වෙනත් යම් වග කිවයුතු තනතුරක් දරා නොමැති බව මම (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

(ඕ) මම 2005 අංක 02 දරණ බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත බැංකු පනතෙහි 42 වැනි වගන්තියෙහි විධි විධානයන්ට අනුව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක / බලපත්‍රලාභී වාණිජ බැංකුවක (අධ්‍යක්ෂවරයකු ලෙස තෝරා පත් කරනු ලැබීමට, පත් කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට/ අධ්‍යක්ෂ වරයකු ලෙස කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට) සුදුසු හා යෝග්‍ය පුද්ගලයකු බව මාගේ දැනුමට අනුව (ප්‍රකාශ කරමි / ප්‍රතිඥා දෙමි)

.................................................................................දින, කොළඹ ............................................... දී මා ඉදිරිපිට අත්සන් තබා දිවුරුම් ප්‍රකාශය කළ බවත්, ඉහත සඳහන් සියළු දේ සත්‍ය හා නිවැරදි ලෙස පිළිගත් බවත්, කියවා තේරුම්ගත් බවත් මින් ප්‍රකාශ කරමි.

.............................................................

මා ඉදිරිපිටදී (අත්සන)

.....................................................................

සාමදාන විනිශ්චයකාර

**ඇමුණුම 2**

බැංකුවේ නම:- ..................................................................................................................................

**බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස නම් කරනු ලැබීමට / තෝරාපත් කරනු ලැබීමට / පත් කරනු ලැබීමට පුද්ගලයන් විසින් යෝජනා කරන ලද බැංකු පනතෙහි 42 වැනි වගන්තියට අනුව ඉදිරිපත් කළ යුතු ප්‍රකාශය.**

(........................................................................................................ගේ පරිදි හා සුදුසු ලෙස බැඳේ)

1. පෞද්ගලික තොරතුරු : ..........................................................................
   - 1.1 සම්පූර්ණ නම : ..........................................................................
   - 1.2 ජා.හැ.අංකය./ගමන්බලපත්‍ර අංකය : ..........................................................................
   - 1.3 ස්ථිර ලිපිනය : ..........................................................................
   - 1.4 තාවකාලික ලිපිනය : ..........................................................................
   - 1.5 රැකියාව : ..........................................................................
2. බැංකු පනතෙහි 86 වැනි වගන්තියට අනුව ළඟම ඥාතියෙකුගේ තොරතුරු
   - 2.1 බිරිඳ/ස්වාමි පුරුෂයාගේ සම්පූර්ණ නම : ..........................................................................
     ජා.හැ.අංකය/ගමන්බලපත්‍ර අංකය : ..........................................................................
   - 2.2 යැපෙන දරුවන්ගේ නම් : ..........................................................................

| | **සම්පූර්ණ නම** | **ජා.හැ.අංකය / ගමන් බලපත්‍ර අංකය** |
|---|---|---|
| 1. | .............................................................. | .......................................................................... |
| 2. | .............................................................. | .......................................................................... |
| 3. | .............................................................. | .......................................................................... |
| 4. | .............................................................. | .......................................................................... |

3. බැංකු පනතෙහි 86 වැනි වගනතියෙහි උක්ත පරිදි අධ්‍යක්ෂවරයකු වීමට බලාපොරොත්තු වන / අධ්‍යක්ෂවරයකුගේ ස්ථිර කැමැත්ත පිළිබඳ ස්මපූර්ණ විස්තර :- ....................................................................................
   ..........................................................................................................................................
4. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වී සිටි ඔහුගේ/ඇයගේ බලපත්‍රලාභී බැංකුවේ / බැංකුවල නම්: (එම බැංකු පවත්වනු ලැබූ කාල සීමාව පිළිබඳ විස්තර ද ඇතුළත්ව):- ..........................................................................
   ..........................................................................................................................................
5. සමාන්තරව සහ ඉහත (3) මගින් දක්වෙන බැංකුවල විස්තර මගින්, ඉහත (2)හි සඳහන් ඔහුගේ/ඇයගේ ළඟම ඥාතිවරයෙකු හෝ ඔහු/ඇය විසින් දනට භාවිතා කරන කිසිවක් තිබේ නම්) පහසුකම්:..............................................
   ..........................................................................................................................................
   ..........................................................................................................................................

ප්‍රකාශය :

ඉහත සඳහන් සියළු තොරතුරු මාගේ දැනුමට අනුකූලව, සත්‍ය බවත් විශ්වාසදයක බව සහ සම්පූර්ණ බවත් තහවුරු කරමි. ඉහත සපයන ලද තොරතුරුවලට අදලව, කිසියම් වෙනසක් වූ වහාම, හැකි ඉක්මණින් තොරතුරු බැංකුවට දන්වන බවට මම පොරොන්දු වෙමි.

අත්සන:- ........................................................... දිනය:- ...........................................................

යෝජනා කරන ලද / පත් කරන ලද අධ්‍යක්ෂවරයාගේ සුදුසුකම් තක්සේරු කිරීම සඳහා, අදාල සලකා බලන ලද වෙනත් තොරතුරු සහ ඉහත සපයන ලද තොරතුරු හා බැඳෙන වෙනත් පැහැදිලි කිරීම්.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනත් කරුණු :

අත්සන (ලේකම්) : ................................................... දිනය:- ...............................................

**02/17/402/0073/00**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 අප්‍රේල් මස 12

වෙත:- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්

ප්‍රිය මහත්මයාණෙනි,

## බැංකුවල (බලපත්‍රලාභී වාණිජ බැංකු) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම

2005 අප්‍රේල් 8 වන දින රැස්වීමෙහිදී දන්වන ලද පරිදි මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වා ගැනීමේ වගකීම සහ ශක්තිමත් සහ ස්ථාවර බැංකු පද්ධතියකට ඇති බැදියාව මත මුදල් මණ්ඩලය සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් මිලියන 2,500 දක්වා වැඩි කිරීමට නියම කරනු ලැබේ. මේ සඳහා ප්‍රාග්ධනය වශයෙන්, මුදල් මණ්ඩලය විසින් විටින් විට සංශෝධනය කරන ලද බැංකු පනතෙහි 19(2) සහ 19(7) වගන්තිවලට යටත්ව 97.08.22 දින නිකුත් කරන ලද විධානයෙහි අර්ථ දක්වා ඇති පරිදි ප්‍රාග්ධන පළමු ස්ථරය (T ier 1) (මූලික ප්‍රාග්ධනය) අයත් වේ.

දැනට මෙම අවශ්‍යතාවය සපුරා නැති වාණිජ බැංකු ප්‍රාග්ධනය ප්‍රසාරණය කර ගැනීමට පහත සඳහන් ක්‍රමයන් අනුගමනය කළ හැක.

- 2006 වසර අග වන විට දැනට පවතින ප්‍රාග්ධනය, පවත්නා හිඟයෙන් අවම වශයෙන් 50% දක්වා වැඩි කිරීම.
- ඉතිරි හිඟය 2007 අග වන වට සැපිරීම.

ඉහත සඳහන් කර ඇති කාල සීමාවන් තුළ සියලුම වාණිජ බැංකු ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගත යුතුය.

බැංකු පනතේ 4(1) වගන්තියට අනුකූලව ඇති ප්‍රතිපාදන යටතේ දැනට පවත්නා විදේශ බැංකු විසින් ප්‍රේෂණය කළ යුතු ඇමෙරිකානු ඩොලර් මිලියන 2 අවශ්‍යතාවය අත්හරිනු ලබන අතර, මෙතැන් පටන් නව වාණිජ බැංකුවකට අවශ්‍ය හිමිකම් ප්‍රාග්ධනය රුපියල් මිලියන 2,500 ලෙස මුදල් මණ්ඩලය නිර්ණය කර ඇත.

දැනට පවත්නා ප්‍රාග්ධන ප්‍රමාණය අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට වඩා අඩු නම් දැනට පවතින ප්‍රමාණය තක්සේරුකොට වැඩිවිය යුතු ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනෝන්‍යව පසුගිය විගණන වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශනය අනුව තක්සේරු කොට ප්‍රාග්ධනය වැඩි කිරීමට අනුගමනය කරනු ලබන ක්‍රම පටිපාටිය දිනයන් සහිතව 2005 ජූනි 30 වන දින වනවිට මා වෙත දන්වා එවන මෙන් ඉල්ලා සිටිමි.

තවද ලාභාංශ නියම කරන විට හෝ ලාභය සිය රටට ප්‍රේෂණය කරන විට ප්‍රාග්ධන වැඩි කිරීමට ඇති අවශ්‍යතාවය ද ඔබගේ අවධානයට යොමු කරන මෙන් ඉල්ලා සිටිමි.

මෙය ලද බව කරුණාවෙන් දන්වා එවන්න.

මෙයට විශ්වාසී
අධ්‍යක්ෂ/ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පිටපත:- උපාලි ද සිල්වා මයා,
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය (ඇපයෙන් සීමිත)
8 වන මහල , සෙලින්කෝ නිවස,
කොළඹ 1.

**02/17/402/0073/001**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 අප්‍රේල් මස 12

වෙත:- සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්
ප්‍රිය මහත්මයාණෙනි,

## බැංකුවල (බලපත්‍රලාභී විශේෂිත බැංකු) අවම ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ නැංවීම

2005 අප්‍රේල් 8 වන දින රැස්වීමෙහිදී දන්වන ලද පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීමක්වන මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වාගැනීමට හා ශක්තමත් සහ පරිපූර්ණ බැංකු පද්ධතියක අවශ්‍යතාවය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සියළු බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් මිලියන 1,500 දක්වා වැඩි කිරීමට උවමනා බව ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලය තීරණය කර ඇත. මේ සඳහා කලින් කලට සංශෝධනය කරනු ලබන බැංකු පනතෙහි 76 ඒ (1) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් 1997.11.21 දිනට නිකුත් කරන ලද විධානයන් මගින් අර්ථ දක්වන පරිදි ප්‍රාග්ධනය යනු පළමු පෙල ප්‍රාග්ධනයම (මූලික ප්‍රාග්ධනය), විය යුතුය. දැනට මෙම තත්ත්වයට පැමිණ නැති විශේෂිත බැංකු, ඔවුන්ගේ ප්‍රාග්ධනය පහත පරිදි ඉහළ නංවා ගත හැකිය.

- 2006 අවසානයේදී හිඟ තත්ත්වයෙන් 50% මගින් දැනට පවතින ප්‍රාග්ධනය ඉහළ නංවා ගත යුතුය.
- 2007 අවසානයේදී හිඟතාවයෙහි ඉතිරිය සපුරා තිබිය යුතුය.

සියළු විශේෂිත බැංකු නියමිත කාල පරිච්ඡේදය තුලදී ඉහල නැංවිය යුතු ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ලිය යුතුය. නව විශේෂිත බැංකු සඳහා උවමනාකරන කොටස් ප්‍රාග්ධනය වහාම බලපාන පරිදි රු. මිලියන 1,500 විය යුතු බව මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලට ඉහළ නැංවිය යුතු ප්‍රාග්ධන අවශ්‍යතාවය තාවකාලිකව අදල නොවනු ඇත.

වැඩිකරන ලද ප්‍රාග්ධන අවශ්‍යතාවය හා ඔබ බැංකුවේ පසුගිය වසරේ විගණනය කරන ලද ගිණුම් සැලකිල්ලට ගෙන ඔබ බැංකුවේ වර්තමාන තත්වය පිළිබඳ ඇගයීමක් කර, යම් හෙයකින් නියමිත අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට වඩා ඔබගේ බැංකුවෙහි ප්‍රාග්ධන මට්ටම අඩුනම්, ප්‍රාග්ධනය ඉහල නැංවීම සඳහා කාලරාමු සැලසුමක්ද සමග 2005 ජූනි 30 ට පෙර මාවෙත දන්වන මෙන් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

තවද ලාභාංශ තීරණය කරන විටදී ඉහලනංවන ලද ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ තවදුරටත් අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

කරුණාකර මෙම ලිපිය ලද බව දන්වා එවන්න.

පිටපත:- උපාලි ද සිල්වා මයා,
ලේකම් - ජෙනරාල්
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ (ඇපයෙන් සීමිත) සමාගම,
8 වන මහල, සෙලින්කෝ නිවස,
කොළඹ 1.

මෙයට
විශ්වාසී
අත්සන් කළේ
අධ්‍යක්ෂ /
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

## ඉස්ලාමීය මූලධර්ම මත පදනම් වූ බැංකු සේවා හඳුන්වාදීම

බැංකු පනතට මෑතකදී එක් කළ සංශෝධන මගින් ඉස්ලාමීය මූලධර්ම මත පදනම් වූ බැංකු සේවා හඳුන්වාදීමට, බැංකුවලට අවසර දී ඇත. මේ සම්බන්ධයෙන් බැංකු කිහිපයක්ම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසර ඉල්ලා ඇත.

ඉස්ලාමීය බැංකු සේවා හෝ සම්ප්‍රදායික බැංකු සේවා හෝ වේවා සියලු බැංකු කටයුතු විචක්ෂණ ක්‍රමයක් තුළ පවත්වාගෙන යනු ලබන බව සනාථ කර ගැනීමට පහත සඳහන් නීතිමය රාමුව අදළ වේ.

(1) ඉස්ලාමීය බැංකු කටයුතු බලපත්‍රලාභී බැංකුවලට අදළ පවත්නා විධිමත් රාමුව තුළ තදින්ම ක්‍රියාත්මක කල යුතුය.

(2) අදළ බැංකු ඔවුන්ගේ ඉස්ලාමීය බැංකු කටයුතු සඳහා වෙනම ගිණුම් පොත් පවත්වා ගත යුතුය.

(3) ඉස්ලාමීය බැංකු ක්‍රමය සහ සාම්ප්‍රදයික බැංකු ක්‍රමයට අදළ ගිණුම් වෙන්ව පැහැදිලිව හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා මහ බැකුවට භාරදෙන ව්‍යවස්ථාපිත වාර්තා තුළ ඉස්ලාමීය බැංකු කටයුතුවලට අදළ දත්ත වෙනම තීරුවක් යටතේ සඳහන් කළ යුතුය.

(4) සම්ප්‍රදයික බැංකු කටයුතුවලට අදළවන විචක්ෂණ නියෝග ඉස්ලාමීය බැංකු කටයුතු සඳහා ඒ හා සමාන ආකාරයෙන් අදළවන අතර මෙම පවතින නියෝගයන් දැඩිව අනුගමනය කරන මෙන් බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ. කිසියම් අපගමනයක් නිරීක්ෂණය වුවොත්, අදළ බැංකු විසින් එවන් කටයුතු කරගෙන යාම වහාම නැවැත්විය යුතුය.

මේ සම්බන්ධයෙන් බැංකුවලට විමසීම් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙන වෙනම ලියා දන්වනු ඇත.

**2005 මැයි 19 වන දින පවත්වන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී බෙදහරින ලදී.**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 ජූලි මස 29

වෙත :- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## විදේශ මුදලින් ප්‍රාග්ධනය පවත්වා ගැනීම සඳහා ඉල්ලීම

බැංකු විසින් පවත්වාගෙන යායුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ දැමීමත් සමඟ, විදේශ රටවල සංස්ථාපනය කරන ලද ඇතැම් වාණිජ බැංකු විසින් අවම වශයෙන් ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් කොටසක් හෝ විදේශ මුදලින් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසර ඉල්ලා ඇත. මෙම ඉල්ලීම සපුරාලීම සඳහා මහ බැංකුවේ මුදල් මණ්ඩලය පහත නියමයන් නිකුත් කර ඇත.

1. රැගෙන ආ නව ප්‍රාග්ධනයෙන්, 50% ක උපරිමයක් විදේශ මුදලින් පවත්වාගෙන යා යුතුය. ඉතිරි 50% රුපියල්වලට පරිවර්තනය කර බැංකුවේ දේශීය බැංකු ඒකකය තුළ පවත්වා ගත යුතුය.
2. රැගෙන ආ යුතු නව ප්‍රාග්ධනයෙන් සියයට විසිපහක් (25%) (ඉහත සඳහන් කල වටිනාකමෙන් 50%) ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී රහිත සංචිතයක් ලෙස පවත්වාගෙන යා හැකිය.
3. නව ප්‍රාග්ධනයෙන් සියයට 25ක් (25%) ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ණය පහසුකම් සැපයීම සඳහා අක්වෙරළ බැංකු ඒකකයේ රඳවා ගත යුතුය. මෙලෙස ණයදීම සඳහා යොදගත නොහැකි කිසියම් මුදලක් ඇත්නම් එය මහ බැංකුවේ සංචිත ගිණුමේ තැන්පත් කළ යුතුය.
4. විදේශ මුදලින් පවත්වාගෙන යනු ලබන ප්‍රාග්ධනයේ රුපියල් අගයෙහි අධි ප්‍රමාණය/අව ප්‍රමාණය 'විනිමය තුලනය කිරීමේ ගිණුම' නමැති විචක්ෂණ අවශ්‍යතා සඳහා වූ ප්‍රාග්ධනයෙහි කොටසක් ලෙස නොගන්නා වෙනම ගිණුමකට හර/බැර කළ යුතුය. ප්‍රාග්ධන ගිණුමේ රුපියල් අගය, ප්‍රාග්ධනය ගෙන ආ දිනයේ පැවති විනිමය අනුපාතයට පෙන්නුම් කිරීම නොකඩවා කළ යුතුය.
5. මෙහෙයුම් අලාභ කපා හැරීම සඳහා, විදේශ මුදලින් පවත්වාගෙන යන සම්පූර්ණ ප්‍රාග්ධනය හෝ එයින් කොටසක් රුපියල් වලට පරිවර්තනය කරන ලෙස බැංකු වලින් ඉල්ලීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇත.

කරුණාකර මෙය ලැබුණු බව දනුම් දෙන්න.

මෙයට විශ්වාසී

අත්සන් කළේ / බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

**02/04/002/0101/002**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2005 අගෝස්තු 11

වෙත :- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## කේවල ණයගැති සීමාව පිළිබඳ 2005 අංක 04 දරන විධානය

බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී දනුම් දුන් පරිදි කේවල ණය ගැති සීමාව පිළිබඳ දනට ඇති 2005 අංක 02 දරන විධානයට සංශෝධිත විධානය මේ සමඟ අමුණා ඇත.

කරුණාකර මෙය ලද බව දන්වන්න.

මෙයට විශ්වාසී

අත්සන් කළේ / බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

## 1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනතින් සහ 2005 අංක 02 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනත

1995 අංක 33 දරන බැංකු (සංශෝධිත) පනතින් සහ 2005 අංක 02 දරන බැංකු (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරණ බැංකු පනතේ 46(1) (ඇ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද විධානය.

2005 අගෝස්තු 10
කොළඹ

අත්සන් කළේ / **සුනිල් මෙන්ඩිස්**
අධිපති

## බැංකු පනත (කේවල ණයගැති සීමාව) 2005 අංක 04 දරන විධානය

2005 අංක 2 දරන බැංකු පනතේ (කේවල ණයගැති සීමාව) 2005 අංක 2 දරන විධානය මෙමගින් පහත පරිදි සංශෝධනය කරනු ලබයි.

1. එකී විධානයන්හි 04 වන ඡේදය අවලංගුකොට පහත දක්වෙන පරිදි ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.
"4. අංක 02 හා 03 ඡේදයන්ගෙන් අදහස්වන පහසුකම් ප්‍රමාණය බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රාග්ධන අරමුදලින් 30% හෝ 15%ක් ඉක්මවන්නේද යන්න තීරණය කිරීමේදී, පවතින පහසුකම් සීමාව හෝ සියළුම පහසුකම් වල හිඟ මුදල යන දෙකෙන් වැඩි අගය සැලකිල්ලට ගත යුතුය.
03 වන පරිච්ඡේදයේ දක්වෙන පරිදි පසුගිය මූල්‍ය වර්ෂය අවසානය වනවිට බලපත්‍රලාභී වාණිජ බැංකුවක සමස්ත පහසුකම් ප්‍රමාණය යනුවෙන් අදහස් කරන්නේ පසුගිය මූල්‍ය වර්ෂය අවසානයේදී පැවැති සියළුම පහසුකම්වල හිඟ මුදලයි"

2. එකී විධානයන්හි 06 වන ඡේදය අවලංගුකොට පහත දක්වෙන පරිදි ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

"6.(1) පනතේ අංක 46 (1) ඇ(i) හෝ 46 (1) (ඇ) (ii) වගන්තිවල සඳහන් වර්ගවලට අයිති අයිතමයන්ගේ සුරැකුම් මත ගනුදෙනුකරුවන් හට ප්‍රදානය කරනු ලබන පහසුකම්, කේවල ණයගැති සීමාව ගණනය කිරීමේදී බැහැර කරනු ලැබේ.

(අ) මුදල්
(ආ) රජයේ/ මහ බැංකු සුරැකුම්
(ඇ) භාණ්ඩාගාර / මහ බැංකු ඇපකර
(ඈ) ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ලෝක බැංකුව විසින් නිකුත් කරන ඇපකර
(ඉ) පහත ඉහත 03 හා 04 උපඡේදවල සඳහන් කරන ලද නියමයන් හා කොන්දේසිවලට යටත්ව;
   (i) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බැංකුවක් විසින් හෝ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් නිකුත් කරන ලද, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පිළිගනු ලැබිය හැකි යැයි නිශ්චය කරන ඇපයක් හෝ සමාන නීත්‍යානුකූල ලේඛනයක සුරැකුම මත ප්‍රදානය කරනු ලැබූ පහසුකම්
   හෝ
   (ii) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලය විසින් නිකුත් කරන ලද ඇපයක, වන්දිපූරණය හෝ ප්‍රතිඥාවක සුරැකුම මත ප්‍රදානය කරන ලද ණය පහසුකම්.

(3) ඉහත (ඉ) උප ඡේදයේ ලේඛනගතකොට ඇති ආයතනයක් විසින් නිකුත්කොට ඇති ඇපයක් හෝ සමාන නීත්‍යානුකූල ලේඛනයක්, පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත්ව පිළිගනු ලැබිය හැක.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ කාර්යාංශයක් මගින් අගයන ලද A- සහ ඉහළ (හෝ සමාන) ණය ශ්‍රේණිගත කිරීමක් සහිත ආයතනයක් වීම.

(ආ) කේවල ණයගැති සීමාව ගණනය කිරීමේදී බැහැර කළ හැකි පහසුකම්වල වටිනාකමේ ප්‍රතිශතය පහත දක්වේ.

| ණය ශ්‍රේණිය | බැහැර කරනු ලබන මුල් වටිනාකමේ ප්‍රතිශතය |
|---|---|
| AAA සිට AA - (හෝ සමාන) | 80% |
| A+ සිට A - (හෝ සමාන) | 50% |

(ඇ) ඉහත පදනමින් බැහැර කරන ලද සමස්ත පහසුකම්වල එකතුව බැංකුවේ ප්‍රාග්ධන අරමුදලින් 100% කට වැඩි නොවිය යුතුය.

(ඈ) ඇපකරය ප්‍රවර්තන බව හා සමාලෝචනයට ලක්කළ යුතු නොවන බව තහවුරු කර ගනිමින් බැංකුවට පවරන ලද ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳව, එම බැංකුව සෑහීමකට පත් විය යුතුය. එසේම එවැනි වෙනසක් හැකි ඉක්මණින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු අතර සපයනු ලැබූ පහසුකම් අවසන් ණය සමාලෝචනයට අනුව සංශෝධනය කළ යුතුය.

(4) ඉහත 03 වැනි උප ඡේදය යටතේ නියම කරන ලද නියමයන් හා කොන්දේසිවලට අමතරව, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලය විසින් නිකුත් කරන ලද ප්‍රතිඥාවක් හෝ වන්දිපූරණයක් පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත්ව පිළිගනු ලැබිය හැක.

(අ) ඉහත 6 (ඉ) (ii) වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබූ පහසුකමක් කේවල ණයගැති සීමාවෙන් බැහැර කිරීමක් සඳහා සලකා බැලීමට එවැනි පහසුකමක් ප්‍රදානය කිරීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුය.

(ආ) ප්‍රතිඥාවක් වන්දි පූරණයක් නිකුත් කරනු ලැබ ඇති ගනුදෙනුකරුවෙකුගේ ණය පැහැර හැරීමකදී, ප්‍රධාන කාර්යාලය විසින් එම ඇප වූ ප්‍රමාණය, ශ්‍රී ලංකාවේ ඇති දේශීය බැංකු ඒකකයට නොපමාව ප්‍රේෂණය කළයුතු අතර එවැනි මුදලක් අදළ බැංකුවේ කොළඹ ශාඛාවට ලැබෙන තුරු, ශාඛාව විසින් කිසිම ලාභයක් හෝ ප්‍රධාන කාර්යාලයීය වියදමක් ප්‍රේෂණය නොකළ යුතුය.

3. එකී විධානයේ 07 (iv ) ඡේදය අවලංගුකොට පහත පරිදි ප්‍රතිශ්ථාපනය කරනු ලැබේ.

"(iv) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා සෘජු ලෙස පාවිච්චි කිරීමට පහසුකම් ප්‍රදනය කරනු ලබන ගනුදෙනුකරුවෙකුට /ගනුදෙනුකරුවන්ට,

(අ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් යනු මීට අමුණා ඇති ඇමුණුමේ විස්තරකරන ලද ව්‍යාපෘතියකි.

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක සෘජු ලෙස නිරතවීමට කොන්ත්‍රාත්තුවක්පිරිනමනු ලැබ ඇති ගනුදෙනුකරුවෙකු/ගනුදෙනුකරුවන්

(ඇ) පහසුකම් ප්‍රදනය කරනු ලබන බැංකුව හැර, ශ්‍රී ලංකාවට පිටස්තර මාර්ග හෝ බලපත්‍රලාභීවාණිජ බැංකු හෝ/හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සමූහයක් විසින් එවැනි ව්‍යාපෘතියකින් අවමවශයෙන් 50 % මූල්‍යනය කරනුලැබිය යුතු අතර,

(ඈ) එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකු මෙහි අ.ආ හා ඇ. හි නියම කරන ලද කොන්දේසි සපුරන ලද බවට හා ඒ පිළිබඳව සෑහීමකට පත් වී ඇති බවට පහසුකම් ප්‍රදනයට කිරීමට පෙර ශ්‍රීලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකට සහතික විය යුතුය.

(ඉ) මෙම උප ඡේදය ප්‍රකාරව, යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සඳහා දෙනු ලබන ණය, පසුගිය මූල්‍යවර්ෂය අවසානයට තිබූ බැංකුවේ ප්‍රාග්ධන අරමුදලින් 50 % ක් නොඉක්මවිය යුතුය.

4. මෙම විධානයන් වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත් වේ.

ඇමුණුම 1

## කේවල ණයගැති සීමාව පිළිබඳ විධානයේ 7 IV පරිච්ඡේදය යටතේ බැහැර කිරීමට සුදුසුකම් ලබන යටිතල පහසුකම් සඳහා දෙනු ලබන ණය පිළිබඳ නිර්වචනය

පහත සඳහන් කරනු ලබන පරිදි යටිතල පහසුකම් සඳහා බැංකු විසින් ප්‍රදනය කරනු ලබන ණය පහසුකම්, විධානයේ 7 (iv) වගන්තිය යටතේ කේවල ණයගැති සීමාවෙන් නිදහස් කරනු ලැබේ. පහත සඳහන් කටයුතුවල නිරත සමාගමකට සපයනු ලබන ණය,

- සංවර්ධනය කරන
- ක්‍රියාත්මක කරන හෝ නඩත්තු කරන
- පහත අංශවලට හෝ එයට සමාන ස්වභාවයේ යටිතල පහසුකම් සංවර්ධනය කරන, වැඩි දියුණු කරන සහ පවත්වාගෙන යන:

(i) කඩවත් මාර්ගයන් ඇතුළු මාර්ගයක්, පාලමක් හෝ දුම්රිය පද්ධතියක්
(ii) මහාමාර්ග ව්‍යාපෘතියකට අදළ අනිකුත් කටයුතු ද ඇතුළත්ව මහාමාර්ග ව්‍යාපෘතියක්
(iii) වරායක්, ගුවන් තොටුපලක්, අභ්‍යන්තර වාරි මාර්ගයක් හෝ අභ්‍යන්තර වරායක්
(iv) ජල සම්පාදන ව්‍යාපෘතියක්, වාරිමාර්ග ව්‍යාපෘතියක්, ජල පවිත්‍රතා පද්ධතියක්, සනීපාරක්ෂක හා ජලාප්‍රවාහන පද්ධතියක් හෝ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක්
(v ) ගුවන් විදුලි තරංග පිට කිරීම, ජාල දුරකථන පද්ධති, පුළුල් පරාසයක පැතිරුනු ජාල අන්තර් ජාල ඇතුලත් මූලික හෝ ජංගම විදුලි සංදේශ සේවා.
(vi ) කාර්මික උද්‍යාන හෝ විශේෂ ආර්ථික කලාප
(vii ) විදුලි උත්පාදනය හෝ විදුලි උත්පාදනය හා බෙදහැරීම
(viii ) නව සම්ප්‍රේෂණ හෝ බෙදහැරීමේ මාර්ග අතුරා බල ශක්තිය සම්ප්‍රේෂණය කිරීම හෝ බෙදාහැරීම.
(ix ) කෘෂි සැකසුම් හෝ කෘෂිකාර්මික යෙදවුම් සැපයීමේ කටයුතුවල නිරත ව්‍යාපෘතිවලට අදළ ඉදිකිරීම්
(x ) අධ්‍යාපන ආයතන හා රෝහල් ඉදිකිරීම්
(xi ) සමාන ස්වභාවයේ වෙනත් ඕනෑම යටිතල පහසුකම්

**02/08/006 /0001/002**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 අගෝස්තු 11

වෙත :- සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු,
ප්‍රිය මහත්මයාණෙනි,

## බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වූ වාර්ෂික බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ නියමය මේ සමඟ අමුණා ඇත. 2006.01.01 දින සිට මෙම නියමය බල පැවැත්වේ.

මෙයට විශ්වාසී,
අත්සන් කළේ,
අධ්‍යක්ෂ / බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

## බැංකු පනත

බැංකු පනතේ 76 ඇ (6) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නියමය.

2005 අගෝස්තු 10 වැනි දින
කොළඹ

අත්සන් කළේ / **සුනිල් මෙන්ඩිස්**
අධිපති

## 2005 අංක 02 දරන නියමය

1. 76 ඇ(6) වගන්තියේ ප්‍රතිපාදන මත 2006 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි සෑම බලපත්‍රලාභී විශේෂ බැංකුවක්ම වාර්ෂික බලපත්‍ර ගාස්තු වශයෙන් රු.100,000 මුදලක් සෑම ලිත් වර්ෂයක් සඳහාම ගෙවිය යුතු බවට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.
2. සෑම බලපත්‍රලාභී විශේෂ බැංකුවක්ම එම බලපත්‍ර ගාස්තුව සෑම වර්ෂයකම ජනවාරි මස 31 දිනට හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතුය.
3. අනාගතයේදී බලපත්‍ර ලබා ගන්නා සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්ම, මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිත පළමු ලිත් වර්ෂයට අදාළ වාර්ෂික බලපත්‍ර ගාස්තුව, බලපත්‍රය නිකුත් කිරීමට පෙර ගෙවිය යුතුය.

**02/04/002/0018/001**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 අගෝස්තු 12

වෙත :- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## විදේශ මුදලින් ප්‍රාග්ධනය පවත්වා ගැනීම සඳහා ඉල්ලීම

උක්ත ඉල්ලීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අනුමැතිය පිළිබඳව දන්වමින් මා විසින් 2005 ජූලි මස 29 දින නිකුත් කරන ලද චක්‍රලේඛය හා බැඳේ.

2. මෙම විකල්පය අනුගමනය කිරීමට බලාපොරොත්තුවන බැංකු විසින් ප්‍රාග්ධනයෙන් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකු සංචිතයක් ලෙස පවත්වාගෙන යාමේදී අනුගමනය කළයුතු මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් පහත දැක්වේ.

2.1 පහත නම්කර ඇති විදේශ ව්‍යවහාර මුදල් වලින් පමණක් තැන්පතු පවත්වා ගත යුතුය.

- ඇමෙරිකානු ඩොලර්
- ස්ටර්ලිං පවුම්
- යූරෝ

2.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යායුතු ප්‍රාග්ධන ප්‍රමාණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ජංගම ගිණුම්වල තැන්පත් කළ යුතු අතර එය පහත පරිදි මුදල් වර්ගයන් මත පදනම් වේ.

| **මුදල් වර්ගය** | **ඇමෙරිකානු ඩොලර්** | **යූරෝ** | **ස්ටර්ලිං පවුම්** |
|---|---|---|---|
| **බැංකුවේ නම** | ෆෙඩරල් රිසර්ව් බැන්ක්, නිව්යෝර්ක් | ඩොයිෂ් බුන්ඩස් බැන්ක්, ෆ්රැන්ක්ෆර්ට් | හොංකොං ෂැන්හයි බැන්කිං කෝපරේෂන්, ලන්ඩන් |
| **ගිණුම් අංකය** | SRILA 021083514 | 5040040828 | 39600144 |
| **SWIFT සංකේතය** | FRNYU 33 | MARKDEFF | MIDLGB22 |

2.3 වාණිජ බැංකු විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත ඕනෑම ගිණුමකට අරමුදල් මාරු කරනු ලැබීම පිළිබඳව පහත අත්සන් කරනු ලැබූ අය වෙත, (තැන්පතුවල වටිනාකම සහ අගය කල දිනය සඳහන් කරමින්) දැනුම් දිය යුතු අතර එහි පිටපතක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ද යැවිය යුතුය.

3. මෙම තැන්පතු අදාල බැංකුවල ප්‍රාග්ධනයට සම්බන්ධ බැවින් ආපසු ගැනීමට ඉඩ දෙනු නොලැබේ. තැන්පතු ආපසු ගැනීම සඳහා වන ඉල්ලීම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අනුමත නොකළ කිසිදු ආපසු ගැනීමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් පිළිගනු නොලැබේ. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සංචිත අරමුදල්/ආයෝජන පිහිටි මූල්‍ය මධ්‍යස්ථාන අතර පවත්නා කාල වෙනස්කම් හේතුවෙන් සෑම ආපසු ගැනීමක්ම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත අවම වශයෙන් එක් (01) දිනක පූර්ව දැනුම්දීමක් කළ යුතුය. අවම වශයෙන් එක් (01) දිනක සැකසුම් කාලයක්වත් , බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකට අවශ්‍ය වේ. (ඒ අනුව දින දෙකක (02) පූර්ව දැනුම්දීමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කළ යුතුය.)

4. **වාර්තා කිරීමේ ක්‍රියා පිළිවෙළ**

4.1 අක්වෙරළ බැංකු ඒකක විසින් විදේශ මුදලින් පවත්වාගෙන යනු ලබන ප්‍රාග්ධනය, අක්වෙරළ බැංකු ඒකකයේ මාසික වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ අභ්‍යන්තර ගිණුම් යටතේ විදේශ මුදලින් පවත්නා ප්‍රාග්ධනය නමින් අතිරේක තීරුවක් ඇතුලත් කර වාර්තා කළ යුතුය.

4.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන සංචිත ගිණුම "ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති තැන්පතු" ලෙස වත්කම් යටතේ වාර්තා කළ යුතුය.

5. විදේශ මුදලින් පවත්වා ගෙනයනු ලබන ප්‍රාග්ධන කොටසක් නියෝජනය කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති සංචිත ගිණුම, ද ප්‍රාග්ධනයේ කොටසක් වන බැවින්, ද්‍රවශීල වත්කම් ලෙස ඇතුළත් නොකළ යුතුය.

6. **ප්‍රාග්ධන සැලසුම් ඉදිරිපත් කිරීම**
ඉහළ දමන ලද ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා වූ සැලසුම් මේ දක්වා ඉදිරිපත් නොකළ බැංකු, 2005 අගෝස්තු මස 31 දිනට පෙර ඒවා ඉදිරිපත් කළ යුතුය.

මෙයට, විශ්වාසී,

අත්සන් කළේ,
බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

**02/04/003/0401/001**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 සැප්තැම්බර් 30

වෙත :- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්,

ප්‍රිය මහත්මයාණෙනි,

## මහජනයාට හෙළිදරව් කිරීම සඳහා බැංකුවල කාර්තුමය මූල්‍ය ප්‍රකාශ පුවත්පත් වල පළ කිරීම

2005 ජූලි 28 වන දින පවත්වන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී සාකච්ඡාකල පරිදි, බැංකුවල නියෝජනය සමඟ උපදෙස් ගැනීම තුලින් කාර්තුමය මූල්‍ය ප්‍රකාශ පළකිරීම සඳහා වන ආකෘතිය ප්‍රතිසංශෝධනය කර ඇති අතර, එම ආකෘතිය සහ යෝජනා කරන ලද සිංහල සහ දෙමළ පරිවර්ථන මේ සමඟ අමුණා ඇත.

(2) අනෙක් විධිමත් කරන්නන්ගේ ප්‍රකාශන අවශ්‍යතා අනුව ගැලපීමට සහ බැංකු මෙහෙයුම්වල විනිවිධ දක්ම වැඩි කිරීමට, ප්‍රතිසංශෝධන ඉලක්ක කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් හා සුරැකුම්පත් හුවමාරු කොමිසන් සභාවේ (SEC) (ලැයිස්තුගත කළ බැංකුවලට අනුව) ප්‍රකාශන අවශ්‍යතා අනුව ආකෘති පත්‍ර කෙටුම්පත් කරන ලදී. ඊට අමතරව, බැංකු සමඟ එකඟ වූන පරිදි, ප්‍රධාන විචක්ෂණ අනුපාත ඇතුලත්වන ලෙස තෝරාගන්නා ලද කාර්ය සාධක දර්ශක ද ඇතුළත් කර ඇත.

(3) මුළු බැංකුවටම අනුකූලවන පරිදි තොරතුරු ප්‍රකාශ කළ යුතුය. උදා:- පිටරට ඇති ඕනෑම ශාඛාවක්, ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සහ අක්වෙරළ විදේශ බැංකු ඒකක ඇතුළත් වේ.

(4) 1 කොටස :- සාරාංශිත ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, සංචිත සහ හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශන සහ තෝරාගන්නා ලද කාර්ය සාධන දර්ශක සඳහා ආකෘති.

2 කොටස:- මහජනයාට ඉදිරිපත් කිරීම සඳහා බැංකු ගිණුම් සකස් කිරීමට උපදෙස් යන කොටස් 2 නව ආකෘතියේ ඇතුලත් වේ.

(5) අදාල කාර්තුවේ අවසානයේදී ශේෂ පත්‍රයේ තොරතුරු වාර්තා කළ යුතුය. ප්‍රකාශ කිරීමට නියමිත සංසන්දනාත්මක සංඛ්‍යා පසුගිය මූල්‍ය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම් විය යුතුය.

5.1 ආදායම් ප්‍රකාශයට අදාළවන වාර්තා කාලය, මූල්‍ය වර්ෂයේ අදළ කාර්තුව අවසානයේදී ඇති සමුච්චිත තත්ත්වය පෙන්නුම් කළ යුතුය. පෙර වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා එම වාර්තා කාලයටම අනුකූල විය යුතුය.

5.2 පසුගිය මූල්‍ය වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන මත සංසන්දනාත්මක අනුපාත විය යුතු අතර වාර්තාකරන දිනට අදළ අනුපාත, තෝරාගත් කාර්ය සාධන දර්ශක ද වාර්තා කළ යුතුය.

(6) අවම වශයෙන් ඉංග්‍රීසි, සිංහල සහ දමිල පුවත්පත් එකක හෝ හැම කාර්තුවක් අවසානයේ සිට මාස 2 ක් ඇතුලත ප්‍රකාශ කළ යුතුය. බැංකුව මූල්‍ය අවුරුද්ද අවසානයේ සිට මාස 2 ක් ඇතුලත එහි වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන පළකරන්නේ නම්, මෙම උක්ත උපදෙස් තුළ හතරවන කාර්තුව සඳහා මූල්‍ය ප්‍රකාශ පළකිරීමේ අවශ්‍යතාවය අනිවාර්ය නොවේ.

(7) විදේශයක සංස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවකට මව් බැංකුවෙහි විශ්ව මෙහයුම්වලට අදළ තොරතුරු, සමූහය මත තොරතුරු වාර්තා කිරීම සඳහාවන තීරුව තුළ වාර්තා කළ හැක. විදේශ බැංකුවල සමූහ ගිණුම් හි විෂම ජාතික ලක්ෂණ පෙන්වා දෙමින් එකහ වූ ආකෘතිය තුළ දෙන ලද සියළුම අයිතම සියළුම උත්සාහයන් මත ප්‍රකාශ කිරීමට බැංකුවලින් ඉල්ලා සිටී.

(8) පොදු මහජන ප්‍රකාශිතයේ වාසි සඳහා අමතර අනාවරණ ඇති කිරීමට සියළු බැංකු සහ බැංකු මගින් පිළිගැනීමට නියමිත මෙහි අවම අවශ්‍යතාවයන් වල අඩංගු අනාවරනය කරන අවශ්‍යතාවයන් ධෛර්යමත් කළ යුතුය. ඊට අමතරව, කොළඹ කොටස් හුවමාරුව මත ලැයිස්තුගත කරන ලද බැංකු, මූල්‍ය තොරතුරු ප්‍රකාශනයට, සුරැකුම්පත් හුවමාරු කොමිසම මගින් අනාවරණය කරන අනෙකුත් අමතර නියෝග සමඟ අනුකූල විය යුතුය.

(9) බැංකුවල මූල්‍ය ප්‍රකාශන පළකිරීම සඳහා ප්‍රතිසංශෝධිත මෙම ප්‍රකාශන ආකෘතිය 2005 තුන්වන කාර්තුවේ සිට ඉදිරියට බලපැවැත්වෙනු ඇත.

9.1 ආකෘතියේ සඳහන්වන සංකේත උපදෙස්වල අර්ථ නිරූපනයන් සමඟ හරස් නිර්දේශනය සඳහා වන අතර ප්‍රකාශනය සඳහා නොවේ.

(10) කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පළකිරීම සම්බාන්ධයෙන් වන 2003 ජනවාරි 30 දිනැති චක්‍රලේඛය මෙයින් අවලංගු කරන ලදී.

කරුණාකර මෙම චක්‍රලේඛනය ලැබුණු බව දන්වන්න.

මෙයට විශ්වාසී,
අත්සන් කළේ / බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

පිටපත:- උපාලි ද සිල්වා මහතා
ලේකම් - ජෙනරාල්
ශ්‍රී ලංකා බැංකුකරවන්ගේ (ඇපයෙන් සීමිත) සමාගම,
8 වන මහල , සෙලින්කෝ නිවස,
කොළඹ 1.

**බැංකුවේ නම**

**සංක්ෂිප්ත ශේෂ පත්‍රය** **රුපියල් දහස් වලින්**

| සංකේතය | අයිතමය | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | ............... දිනට (ප්‍රවර්තන කාලපේදය) | ............... දිනට (පෙර කාලපේදය) (විගණනය කරන ලද) | ............... දිනට (ප්‍රවර්තන කාලපේදය) | ............... දිනට (පෙර කාලපේදය) (විගණනය කරන ලද) |
| | **ශේෂ පත්‍රය තුල වත්කම්** | | | | |
| 1.1.1.0.0 | අතැති මුදල් | | | | |
| 1.1.2.0.0 | ශ්‍රී ලංකා මහ බැංකුව/අනෙකුත් මහ බැංකු වෙතැති ශේෂ | | | | |
| 1.1.3.0.0 | බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන වලින් අයවිය යුතු ශේෂ | | | | |
| 1.1.4.0.0 | **වෙළෙඳ ගිණුමෙහි ඇතුලත් ආයෝජන** | | | | |
| 1.1.4.1.0 | රාජ්‍ය සුරැකුම්පත් | | | | |
| 1.1.4.2.0 | වෙනත් සුරැකුම්පත් | | | | |
| 1.1.5.0.0 | **කල් පිරෙන දිනතෙක් තබා ගන්නා ආයෝජන (ආයෝජනයන්වල අගය අඩුවීම සඳහා කරන ලද වෙන් කිරීම් අඩු කල පසු ශුද්ධ අගය)** | | | | |
| 1.1.5.1.0 | රාජ්‍ය සුරැකුම්පත් | | | | |
| 1.1.5.2.0 | වෙනත් සුරැකුම්පත් | | | | |
| 1.1.5.3.0 | **අඩු කළා:**<br>ආයෝජනයන්වල වෙළෙඳ අගය අඩුවීම් සඳහා වෙන්කිරිම | | | | |
| 1.1.6.0.0. | **ආශ්‍රිත හා පාලිත සමාගම්වල කර ඇති ආයෝජන** | | | | |
| 1.1.7.0.0 | **මුළු ණය සහ අත්තිකාරම්** | | | | |
| 1.1.7.1.0 | **මුළු ක්‍රියාකාරී ණය සහ අත්තිකාරම්** | | | | |
| 1.1.7.1.1 | විනිමය බිල්පත් | | | | |
| 1.1.7.1.2 | බැංකු අයිරා | | | | |
| 1.1.7.1.3 | ලැබිය යුතු කල් බදු ණය | | | | |
| 1.1.7.1.4 | වෙනත් ණය | | | | |
| 1.1.7.2.0 | **මුළු අක්‍රිය ණය සහ අත්තිකාරම්** | | | | |
| 1.1.7.2.1 | විනිමය බිල්පත් | | | | |
| 1.1.7.2.2 | බැංකු අයිරා | | | | |
| 1.1.7.2.3 | ලැබිය යුතු කල් බදු ණය | | | | |
| 1.1.7.2.4 | අනෙකුත් ණය | | | | |
| 1.1.7.2.5 | ලැබිය යුතු පොලිය | | | | |
| 1.1.7.3.0 | **මුළු දළ ණය සහ අත්තිකාරම්** | | | | |
| | **අඩුකළා:** | | | | |
| 1.1.7.4.0 | අවිනිශ්චිත ගිණුම්ගත පොලිය | | | | |
| 1.1.7.5.0 | බොල් සහ අඩමාන ණය සඳහා කල විශේෂිත වෙන් කිරීම් | | | | |
| 1.1.7.6.0 | බොල් සහ අඩමාන ණය සඳහා කල සාමාන්‍ය වෙන්කිරීම් | | | | |
| 1.1.7.7.0 | **මුළු ශුද්ධ ණය සහ අත්තිකාරම්** | | | | |
| 1.1.8.0.0 | අනෙකුත් වත්කම් | | | | |
| 1.1.9.0.0 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 1.1.10.0.0 | ආයෝජන දේපල | | | | |
| 1.1.11.0.0 | ස්ථාවර වත්කම් (මුළු ක්ෂය කිරීම් අඩු කළ පසු ශුද්ධ අගය) | | | | |
| 1.1.10.0.0 | **ශේෂ පත්‍රය තුල මුළු වත්කම්** | | | | |
| | **ශේෂ පත්‍රය තුල වගකීම්** | | | | |
| 1.2.1.0.0 | **මුළු තැන්පතු** | | | | |
| 1.2.1.1.0 | ඉල්ලුම් තැන්පතු | | | | |
| 1.2.1.2.0 | ඉතිරිකිරීමේ තැන්පතු | | | | |
| 1.2.1.3.0 | කාලීන තැන්පතු | | | | |
| 1.2.1.4.0 | ආන්තික තැන්පතු | | | | |
| 1.2.1.5.0 | අනෙකුත් තැන්පතු | | | | |
| 1.2.2.0.0 | **මුළු ණය ගැනුම්** | | | | |
| 1.2.2.1.0 | ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ගත් ණය | | | | |
| 1.2.2.2.0 | ශ්‍රී ලංකාව තුළ ඇති බැංකු සහ මූල්‍ය ආයතන වලින් ගත් ණය | | | | |
| 1.2.2.3.0 | විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන වලින් ගත් ණය | | | | |
| 1.2.2.4.0 | නැවත මිලදී ගැනීමේ ගිවිසුම් මත විකිණූ සුරැකුම්පත් | | | | |
| 1.2.2.5.0 | යටත් කාලීන ණය | | | | |
| 1.2.2.6.0 | අනෙකුත් ණය ගැනුම් | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.2.3.0.0 | විලම්භිත බිුදු | | | | |
| 1.2.4.0.0 | ප්‍රවර්තන බදු | | | | |
| 1.2.5.0.0 | අනෙකුත් වගකීම් | | | | |
| 1.2.6.0.0 | **ශේෂ පත්‍රයේ මුළු වගකීම්** | | | | |
| 1.3.0.0.0 | **සුළු කොටස් හිමිකාර අයිතිය** | | | | |
| 1.4.0.0.0 | **හිමිකරු ප්‍රාග්ධනය සහ සංචිත** | | | | |
| 1.4.1.0.0 | කොටස් ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය | | | | |
| 1.4.2.0.0 | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | | | | |
| 1.4.3.0.0 | අනෙකුත් සංචිත | | | | |
| 1.5.0.0.0 | **ශේෂ පත්‍රය තුල මුළු වගකීම්, හිමිකරු ප්‍රාග්ධනය සහ සංචිත** | | | | |
| 1.6.0.0.0 | **ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම සහ ප්‍රති ගිණුම්** | | | | |
| 1.6.1.0.0 | අවිනිශ්චිත වගකීම් | | | | |
| 1.6.2.0.0 | බැඳීම් සහ ප්‍රති ගිණුම් | | | | |
| 1.7.0.0.0 | **වෙනත් තොරතුරු** | | | | |
| 1.7.1.0.0 | සේවක සංඛ්‍යාව | | | | |
| 1.7.2.0.0 | ශාඛා ගණන | | | | |

## සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශය

**රුපියල් දහස් වලින්**

| සංකේතය | අයිතමය | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | ............ දිනට (ප්‍රවර්තන කාලච්ඡේදය) | ............ දිනට (පෙර කාලච්ඡේදය) (විගණන කරන ලද) | ............ දිනට (ප්‍රවර්තන කාලච්ඡේදය) | ............ දිනට (පෙර කාලච්ඡේදය) (විගණනය කරන ලද) |
| 2.1.0.0.0 | **පොලී ආදායම** | | | | |
| 2.1.1.0.0 | ණය සහ අත්තිකාරම් වලින් ලද පොලී ආදායම | | | | |
| 2.1.2.0.0 | අනෙකුත් පොලී උපදවන වත්කම් වලින් ලද පොලී ආදායම | | | | |
| 2.2.0.0.0 | **අඩුකලා: පොලී වියදම්** | | | | |
| 2.2.1.0.0 | තැන්පතු සඳහා පොලී වියදම් | | | | |
| 2.2.2.0.0 | අනෙකුත් පොලී ගෙවිය යුතු වගකීම් සඳහා පොලී වියදම් | | | | |
| 2.3.0.0.0 | **ශුද්ධ පොලී ආදායම** | | | | |
| 2.4.0.0.0 | **පොලී නොවන ආදායම්** | | | | |
| 2.4.1.0.0 | විදේශ විනිමය ආදායම් | | | | |
| 2.4.2.0.0 | වෙනත් ආදායම් | | | | |
| 2.5.0.0.0 | **අඩුකලා : පොලී නොවන වියදම්** | | | | |
| 2.5.1.0.0 | කාර්ය මණ්ඩල සඳහා පිරිවැය | | | | |
| 2.5.2.0.0 | කාර්ය මණ්ඩල විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | | | |
| 2.5.3.0.0 | පරිශ්‍ර, උපකරණ සහ ආයතන වියදම් | | | | |
| 2.5.4.0.0 | වෙළෙඳ/ආයෝජන සුරැකුම් මත වූ අලාභ | | | | |
| 2.5.5.0.0 | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | | | |
| 2.5.6.0.0 | අනෙකුත් මෙහෙයුම් වියදම් | | | | |
| 2.6.0.0.0 | **අඩුකලා: බොල් සහ අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සහ ණය කපා හැරීම්** | | | | |
| 2.6.1.0.0 | සාමාන්‍යය වෙන්කිරීම් | | | | |
| 2.6.2.1.0 | විශේෂිත වෙන්කිරීම් | | | | |
| 2.6.3.2.0 | නැවත අයකර ගැනීම් (-) | | | | |
| 2.6.4.3.0 | කපාහරින ලද ණය | | | | |
| 2.7.0.0.0 | **අඩුකලා: ආයෝජන අගය අඩුවීම සඳහා කරන ලද වෙන්කිරීම් (ශුද්ධ)** | | | | |
| 2.8.0.0.0 | **බදුවලට පෙර සාමාන්‍යය කටයුතු වලින් ලද මෙහෙයුම් ලාභය** | | | | |
| 2.9.0.0.0 | අඩුකලා: මූල්‍ය සේවා සඳහා වූ එකතු කළ අගය මත බදු | | | | |
| 2.10.0.0.0 | **සමාගම් බදු වලට පෙර සාමාන්‍ය කටයුතු වලින් ලද මෙහෙයුම් ලාභය** | | | | |
| 2.11.0.0.0 | පාලිත/ආශ්‍රිත සමාගම් වලින් ලද ලාභ | | | | |
| 2.12.0.0.0 | **සමාගම් බදු වලට පෙර මෙහෙයුම් ලාභය** | | | | |
| 2.13.0.0.0 | **අඩුකලා: සාමාන්‍ය කටයුතු වලින් ලද ලාභ මත වූ සමාගම් බදු** | | | | |
| 2.14.0.0.0 | කාලච්ඡේදය තුල ලද මෙහෙයුම් ලාභය | | | | |

## කොටස් ප්‍රාග්ධන අයිතිය සහ සංචිත වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය - බැංකුව

**(දින/මා/වසර ) දිනෙන් අවසන් කාලපේදය සඳහා**

රුපියල් දහස් වලින්

| අයිතමය | කොටස් ප්‍රාග්ධනය | | | | සංචිත | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස් | ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස් | සමුච්චිත නිදහස් කළහැකි වරණීය කොටස් | පැවරූ ප්‍රාග්ධනය | සංචිත අරමුදල | කොටස් අධි මිල | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිත | අනෙකුත් සංචිත | ආදායම් ප්‍රකාශය | එකතුව |
| 3.1.0.0.0 ..................දිනට ශේෂය (ආරම්භක ශේෂය) | | | | | | | | | | | |
| 3.2.1.0.0 කොටස් නිකුත් කිරීම/පැවරූ ප්‍රාග්ධනයේ වැඩිවීම | | | | | | | | | | | |
| 3.2.2.0.0 ප්‍රසාද නිකුතුව | | | | | | | | | | | |
| 3.2.3.0.0 හිමිකම් නිකුතුව | | | | | | | | | | | |
| 3.2.4.0.0 දේපල ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | | | | | | | | | | | |
| 3.2.5.0.0 කාලඡේදය සඳහා වූ ශුද්ධ ලාභය | | | | | | | | | | | |
| 3.2.6.0.0 කාලඡේදය තුළදී සංචිත වලට මාරු කිරීම් | | | | | | | | | | | |
| 3.2.7.0.0 ගෙවන ලද ලාභාංශ | | | | | | | | | | | |
| 3.2.8.0.0 ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කරන ලද ලාභය | | | | | | | | | | | |
| 3.2.9.0.0 වෙනත් | | | | | | | | | | | |
| 3.3.0.0.0 .........................දිනට ශේෂය (අවසාන ශේෂය) | | | | | | | | | | | |

**(දින/මා/වසර ) දිනෙන් අවසන් කාලපේදය සඳහා**

## කොටස් ප්‍රාග්ධන අයිතිය සහ සංචිත වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය - සමූහය

රුපියල් දහස් වලින්

| අයිතමය | කොටස් ප්‍රාග්ධනය | | | | සංචිත | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස් | ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස් | සමුච්චිත නිදහස් කළහැකි වරණීය කොටස් | පැවරූ ප්‍රාග්ධනය | සංචිත අරමුදල | කොටස් අධි මිල | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිත | අනෙකුත් සංචිත | ආදායම් ප්‍රකාශය | එකතුව |
| 3.1.0.0.0 ..................දිනට ශේෂය (ආරම්භක ශේෂය) | | | | | | | | | | | |
| 3.2.1.0.0 කොටස් නිකුත් කිරීම/පැවරූ ප්‍රාග්ධනයේ වැඩිවීම | | | | | | | | | | | |
| 3.2.2.0.0 ප්‍රසාද නිකුතුව | | | | | | | | | | | |
| 3.2.3.0.0 හිමිකම් නිකුතුව | | | | | | | | | | | |
| 3.2.4.0.0 දේපල ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | | | | | | | | | | | |
| 3.2.5.0.0 කාලඡේදය සඳහා වූ ශුද්ධ ලාභය | | | | | | | | | | | |
| 3.2.6.0.0 කාලඡේදය තුළදී සංචිත වලට මාරු කිරීම් | | | | | | | | | | | |
| 3.2.7.0.0 ගෙවන ලද ලාභාංශ | | | | | | | | | | | |
| 3.2.8.0.0 ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කරන ලද ලාභය | | | | | | | | | | | |
| 3.2.9.0.0 වෙනත් | | | | | | | | | | | |
| 3.3.0.0.0 .........................දිනට ශේෂය (අවසාන ශේෂය) | | | | | | | | | | | |

# තෝරාගත් කාර්ය සාධන දර්ශක

| සංකේතය | අයිතමය | ............... දිනට (ප්‍රවර්තන | ............... දිනට (පෙර කාලපේදය) | ............... දිනට (ප්‍රවර්තන | ............... දිනට (පෙර කාලපේදය) |
|---|---|---|---|---|---|
| | | බැංකුව | | සමූහය | |
| | | කාලපේදය) | (විගණනය කරන ලද) | කාලපේදය) | (විගණනය කරන ලද) |
| 4.1.0.0.0 | **විධිමත්කරණ ප්‍රාග්ධන ප්‍රමාතාත්මතාවය** | | | | |
| 4.1.1.0.0 | මූලික ප්‍රාග්ධනය (පළමුපෙළ ප්‍රාග්ධනය) රු. දශලක්ෂ | | | | |
| 4.1.2.0.0 | මුළු ප්‍රාග්ධන පදනම, රු. දශලක්ෂ | | | | |
| 4.1.3.0.0 | මූලික ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය, අවදනම මත බර තැබූ වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස (අවම අවශ්‍යතාවය 5%) | | | | |
| 4.1.4.0.0 | මුළු ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය, අවදනම මත බර තැබූ වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස (අවම අවශ්‍යතාවය 10%) | | | | |
| | **වත්කම්වල ගුණාත්මක භාවය (දෙන ලද ණයවල ගුණාත්මක භාවය)** | | | | |
| 4.2.0.0.0 | දළ අක්‍රීය ණය අනුපාතය, % (අවිනිශ්චිත ගිණුම්ගත පොලිය රහිතව) | | | | |
| 4.2.1.0.0 | ශුද්ධ අක්‍රීය ණය අනුපාතය, % (අවිනිශ්චිත ගිණුම්ගත පොලිය සහ | | | | |
| 4.2.2.0.0 | ණය සඳහා වෙන් කිරීම් අඩු කළ පසු) | | | | |
| | **ලාභදායීතාවය** | | | | |
| 4.3.0.0.0 | පොලී ආදායම්-වියදම් පරතරය, වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස | | | | |
| 4.3.1.0.0 | වත්කම් මත ප්‍රතිලාභය, % (බදු ගෙවීමට පෙර) | | | | |
| 4.3.2.0.0 | ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය, % (බදු ගෙවීමට පසු) | | | | |
| 4.3.3.0.0 | **විධිමත්කරණ ද්‍රවශීලතාවය** | | | | |
| 4.4.0.0.0 | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්, රු. දශලක්ෂ | | | | |
| 4.4.1.0.0 | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, % | | | | |
| 4.4.2.0.0 | (අවම අවශ්‍යතාවය 20%) | | | | |
| | දේශීය බැංකු ඒකකය | | | | |
| | අක්-වෙරළ බැංකු ඒකකය | | | | |

**සහතික කිරීම :**

(අ) ඉහත ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කළ ආකෘතියට සහ නිර්වචනයන්ට අනුකූලව බවත්,

(ආ) විගණනය කළ බව සඳහන් කර නොමැති නම් බැංකුවෙහි විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් මෙම ප්‍රකාශනවල අඩංගු තොරතුරු උපුටා ගන්නා ලද බවත්,

පහත අත්සන් කර ඇති ............................... බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ මූල්‍ය පාලක/අනුකූලතා නිලධාරී
වන අපි එක්ව සහතික කරන්නෙමු.

(නම)
..............................................................................
(අත්සන් කළේ) ප්‍රධාන විධායක නිලධාරී

දිනය : දිනය/මාසය/වසර

(නම)
..............................................................................
(අත්සන් කළේ) මූල්‍ය පාලක / අනුකූලතා නිලධාරී

දිනය : දිනය/මාසය/වසර

## මහජනතාවට හෙළිදරව් කිරීම පිණිස පුවත්පත්වල පලකිරීම සඳහා බැංකු ගිණුම් පිළියෙල කිරීමට උපදෙස්

2005 සැප්තැම්බර් 30

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව.

## විස්තරාත්මක උපදේශයන්

1. ශේෂ පත්‍රය - රුපියල් දහස්වලින්

| පේළි සංකේත | පේළි අයිතම | උපදේශයන් |
|---|---|---|
| **ශේෂ පත්‍රගත වත්කම්** | | |
| 1.1.1.0.0 | **අතැති මුදල්** | සුරක්ෂිතාගාර සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අයකැමියන් වෙත රඳවාගත් දේශීය සහ විදේශීය මුදල් නෝට්ටු හා කාසි. |
| 1.1.2.0.0 | **ශ්‍රී ලංකා මහ බැංකුව සහ වෙනත් මහ බැංකු වෙතැති ශේෂයන්** | සංචිත අවශ්‍යතාවයන් සහ වෙනත් ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ වෙනත් මහ බැංකු වෙතැති ශේෂයන්. |
| 1.13.0.0 | **බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල්** | පහත අයිතමයන්ගේ උප එකතුවන්. |
| 1.1.3.1.0 | එකතුකිරීමේ ක්‍රියාවලිය තුළ ඇති මුදල් අයිතමයන් | දේශීය/විදේශීය අණකර, චෙක්පත් සහ පාරිභෝගික සේවා කටයුතු සඳහා රඳවාගත් පාවිච්චි කළ හැකි, වලංගු මුද්දර තොග, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, ඉදිරිපත් කල වහාම ගෙවිය යුතු බැංකු මගින් මිලදී ගත් සංචාරක චෙක්පත් වැනි මුදල් වලට සමාන අයිතමයන්. |
| 1.1.3.2.0 | විද්‍යුත් කාඩ්පත් මගින් සිදු කෙරුනු මුදල් අත්තිකාරම් (ශුද්ධ) | අනිකුත් බැංකුවල කාඩ්පත් හිමියන් විසින් බැංකුවේ ස්වයංකෘත ටෙලර් යන්ත්‍ර වලින් ආපසු ලබා ගන්නා ලද මුදල් (උද.හර/බැර) අඩු කලා බැංකුවේ කාඩ්පත් හිමියන් විසින් අනිකුත් බැංකුවල ස්වයංකෘත ටෙලර් යන්ත්‍ර වලින් ආපසු ලබා ගන්නා ලද මුදල්. |
| 1.1.3.3.0 | අතැති රන් තොග | අතැති රන් බිස්කට්. |
| 1.1.3.4.0 | ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති ශේෂයන් | ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යන ජංගම ගිණුම්. |
| 1.1.3.5.0 | විදේශ මූල්‍ය ආයතන සහ බැංකු වෙතැති ශේෂයයන් (නොස්ට්‍රෝ ගිණුම්) | විදේශ මුදල් ගනුදෙනු සඳහා පවත්වාගෙන යන (බැංකුවේ පොත්පත්වලට අනුව) විදේශ මූල්‍ය ආයතන සහ බැංකුවල නොස්ට්‍රෝ ගිණුම් හි ශේෂයයන් |
| 1.1.3.6.0 | විදේශ ශාඛාවන් (නොස්ත්‍රෝ ගිණුම්) ප්‍රධාන කාර්යාලය සහ තම විදේශ මුදල් බැංකු ඒකක වෙතැති ශේෂයයන් | විදේශ මුදල් ගනුදෙනු සඳහා පවත්වාගෙන යන (බැංකුවේ පොත්පත්වලට අනුව) විදේශ බැංකු ශාඛා සහ ප්‍රධාන කාර්යාලයේ නොස්ට්‍රෝ ගිණුම්හි ශේෂයයන්. |
| 1.1.3.7.0 | ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සහ බැංකු වෙතැති තැන්පතු | ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සහ බැංකු වෙතැති කෙටිකාලීන තැන්පත් (මාස 12 ට අඩු) සහ එක් දින තැන්පත්. |
| 1.1.3.8.0 | විදේශ මූල්‍ය ආයතන සහ බැංකු වෙතැති තැන්පතු | විදේශ මූල්‍ය ආයතන සහ බැංකු වෙතැති කෙටිකාලීන තැන්පත් (මාස 12 ට අඩු) සහ එක් දින තැන්පත්. |
| 1.1.3.9.0 | තම විදේශ මුදල් බැංකු ඒකක සහ විදේශ බැංකු ශාඛා ප්‍රධාන කාර්යාල වෙතැති තැන්පතු | තම විදේශ මුදල් බැංකු ඒකක සහ විදේශ බැංකු ශාඛා, ප්‍රධාන කාර්යාලයන්හි කෙටි කාලීන තැන්පත් (මාස 12 ට අඩු) සහ එක් දින තැන්පත්. |
| 1.1.3.10.0 | මූල්‍ය ආයතන සමඟ ඇතිකර ගත් ප්‍රති විකුණුම් ගිවිසුම් | ණය උපකරණ එනම් භාණ්ඩාගාර බිල් සහ බැඳුම්කර, වාණිජ පත්‍ර, පොරොන්දු නෝට්ටු සහ ණයකර ඇපයට තබාගෙන මූල්‍ය සමාගම්, ප්‍රාථමික ගැණුම්කරුවන්, වාණිජ සහ විශේෂිත බැංකු සහ මහ බැංකුවට ණය සැපයීම. |
| 1.1.3.11.0 | වෙනත් | ඉහත ගිණුම් ශීර්ෂයන් යටතේ විශේෂයෙන් සඳහන් කර නොමැති වෙනත් කිසියම් ශේෂයන්. |

| | | |
|---|---|---|
| **1.1.4.0.0** | **ආයෝජන වෙළෙඳ ගිණුම** | **පහත 1.1.4.1.0 සිට 1.1.4.2.0 දක්වා අයිතමයන්ගේ උප එකතුව.** |
| 1.1.4.1.0 | රාජ්‍ය සුරැකුම්පත් | පහත අයිතමයන්ගේ උප එකතුව. |
| 1.1.4.1.1 | භාණ්ඩාගාර බිල්පත් | භාණ්ඩාගාර බිල්පත්‍රවල පිරිවැය හෝ වෙළෙඳ අගය (වෙළෙඳ තොගයෙහි ඇතුලත් වෙළෙඳපොළ අගයට ගණනය කරන ලද සහ එම වටිනාකම ශේෂ පත්‍රයට ගෙන එන ලද භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනයන් නම්) |
| 1.1.4.1.2. | භාණ්ඩාගාර බැඳුම්කර | භාණ්ඩාගාර බැඳුම්කරවල පිරිවැය හෝ වෙළෙඳ අගය (වෙළෙඳ තොගයෙහි ඇතුලත් වෙළෙඳපොළ අගයට ගණනය කරන ලද සහ එම වටිනාකම ශේෂ පත්‍රයට ගෙන එන ලද භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනයන් නම්) |
| 1.1.4.1.3 | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිරිවැය. |
| 1.1.4.1.4 | වෙනත් රාජ්‍ය සුරැකුම්පත් | අනිකුත් සියළුම රාජ්‍ය සුරැකුම්පත්වල පිරිවැය හෝ වෙළෙඳ වටිනාකම යන ඒවායින් අඩු වටිනාකම. |
| **1.1.4.2.0** | **වෙනත් සුරැකුම්** | **පහත 1.1.4.2.1 සිට 1.1.4.2.4 අයිතමයන්හි උප එකතුව.** |
| 1.1.4.2.1 | කොටස් සහ ඒකක භාර ප්‍රසිද්ධ ලැයිස්තුගත | සාමාන්‍ය සහ වරණීය කොටස් සහ ඒකක භාරයන්හි කොටස්වල පිරි වැය හෝ වෙළෙඳ අගය යන ඒවායින් අඩු වටිනාකම. |
| 1.1.4.2.2 | කොටස් සහ ඒකක භාර ප්‍රසිද්ධ ලැයිස්තුගත නොවුන | ලැයිස්ත ුගත නොවූ සාමාන්‍ය කොටස් සහ ඒකක භාරයන්හි ලැයිස්තුගත නොවූ කොටස්වල පිරිවැය හෝ වෙළෙඳ අගය යන දෙකින් අඩු අගය. |
| 1.1.4.2.3 | ණය සුරැකුම්පත් | ණය උපකරණ සඳහා ගෙවිය යුතු මුල් මුදලේ අඩුම පිරිවැය හෝ ගණනත කිසියම් නොඉපයූ පොලිය හෝ වට්ටම්හි ශුද්ධ අගය පෙන්වීම. |
| 1.1.4.2.4 | වෙනත් | අනිකුත් සියළුම සුරැකුම්වල පිරිවැය හෝ වෙළෙඳ අගයන්හි අඩු වටිනාකම. |
| **1.1.5.0.0** | **කල් පිරෙන තෙක් රඳවාගත් ආයෝජනයන් (ආශ්‍රිත සහ පරිපාලිතවල ආයෝජනයන් හැර)** | **පහත අයිතමයන්හි උප එකතුවත් කල් පිරෙන රඳවාගත් සුරැකුම් යනු කල් පිරෙන තෙක් රඳවා ගැනීමේ අදහසින් මිලදී ගත් සුරැකුම්පත් වේ. (1.1.5.1-1.1.5.2-1.1.5.3)** |
| **1.1.5.1.0** | **රාජ්‍ය සුරැකුම්පත්** | **පහත 1.1.5.1 සිට 1.1.5.1.4 දක්වා අයිතමයන්හි උප එකතුවත්.** |
| 1.1.5.1.1 | භාණ්ඩාගාර බිල්පත් | භාණ්ඩාගාර බිල්පත් පිරිවැය. |
| 1.1.5.1.2 | භාණ්ඩාගාර බැඳුම්කර - | භාණ්ඩාගාර බැඳුම්කර පිරිවැය. |
| 1.1.5.1.3 | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිරිවැය. |
| 1.1.5.1.4 | අනිකුත් රාජ්‍ය සුරැකුම්පත් | රඳවාගත් අනිකුත් සියළුම රාජ්‍ය සුරැකුම්පත්වල පිරිවැය. |
| **1.1.5.2.0** | **වෙනත් සුරැකුම්පත්** | **පහත අයිතමයන්හි උප එකතුව 1.1.5.2.1 - 1.1.5.2.4** |
| 1.1.5.2.1 | කොටස් සහ ඒකක භාර ප්‍රසිද්ධ ලැයිස්තුගත | සාමාන්‍ය සහ වරණීය කොටස් සහ ඒකක භාරයන්හි කොටස්වල පිරිවැය. |
| 1.1.5.2.2 | කොටස් සහ ඒකක භාරයන් ලැයිස්තුගත නොවන | ලැයිස්තුගත නොවන ස්කන්ධ කොටස් සහ ඒකක භාරයන්හි ලැයිස්තුගත නොවන කොටස්. |
| 1.1.5.2.3 | ණය සුරැකුම් | ණය උපකරණ සඳහා ගෙවිය යුතු මුල් මුදලේ පිරිවැය ප්‍රමාණයන්හි අවමය. |
| 1.1.5.2.4 | වෙනත් | රඳවාගත් අනිකුත් සියළුම ඇප සුරැකුම්හි පිරිවැය. |
| **1.1.5.3.0** | **අඩුකලා: අගය අඩුවීම සඳහා කල වෙන් කිරීම්** | **අගය අඩුවීම සඳහා වෙන්කිරීම්. ප්‍රතිපාදනය ධන අගයක් ලෙස පෙන්වන්න. ලේඛනයේ ස්වයංක්‍රීයව අඩුකෙරෙනු ඇත.** |
| **1.1.6.0.0** | **ආශ්‍රිත සහ පාලිත සමාගම්හි ආයෝජනයන්** | ආශ්‍රිත සහ පාලිත සමාගම්හි මුළු ආයෝජනයන්. |
| **1.1.7.0.0** | **මුළු ණය සහ අත්තිකාරම්** | මේ යටතේ අගයන් පෙන්වීමට ඇවැසි නැත. |

| | | |
|---|---|---|
| **1.1.7.1.0** | **මුළු සක්‍රිය ණය සහ අත්තිකාරම් (දළ)** | පහත 1.1.7.1.1 සිට 1.1.7.1.4 දක්වා අයිතමයන්ගේ උප එකතුව. |
| 1.1.7.1.1. | විනිමය බිල්පත්‍ර | සියළුම වර්ගයේ සක්‍රීය විනිමය බිල් පත්‍රවල එකතුව පෙන්වන්න. |
| 1.1.7.1.2 | අයිරා | සියළුම සක්‍රීය අයිරාව එකතුව පෙන්වන්න. |
| 1.1.7.1.3 | ලැබිය යුතු කල් බදු කුලී | සියළුම වර්ගයේ ලැබියයුතු ලැබියයුතු සක්‍රීය කල් බදු කුලී නොඉපයූ කල් බදු ආදායම සහ අයවිය යුතු එකතුකල අගය මත බදුවල ශුද්ධ අගයන්හි මුළු ගණන පෙන්වන්න. |
| 1.1.7.1.4 | අනිකුත් ණය | සියළුම වර්ගයේ සක්‍රීය අනිකුත් ණයවල මුළු එකතුව් පෙන්වන්න. (කාලීන ණය, කුට්ටි ණය, ඇසුරුම් ණය, බන්ධිත ණය, භාණ්ඩාගාර බිලපත්‍ර සහ බැඳුම්කර, වාණිං පත්‍ර, පොරොන්දු නෝට්ටු සහ ණයකර සහ අනිකුත් ණය වැනි) ණය උපකරණ මත මූල්‍ය ආයතනවල වඩා ගනුදෙනුකරුවන්ට ලබාදෙන ණය (ප්‍රති මිලදී ගැණුම්) |
| **1.1.7.2.0** | **මුළු අක්‍රීය ණය අත්තිකාරම් (දළ)** | **පහත 1.1.7.2.1. සිට 1.1.7.2.5 දක්වා අයිතමයන්ගේ උප එකතුවත්.** |
| 1.1.7.2.1 | විනිමය බිල්පත් | සියළුම වර්ගවල අක්‍රීය විනිමය බිල්පත්වල එකතුව පෙන්වන්න. |
| 1.1.7.2.2 | බැංකු අයිරා | සියළුම අක්‍රීය බැංකු අයිරාවල එකතුව පෙන්වන්න. |
| 1.1.7.2.3 | ලැබිය යුතු කල්බදු වාරික | සියළුම වර්ගවල අක්‍රීය ලැබිය යුතු කල්බදු වාරිකවල එකතුව පෙන්වන්න. (නොඉපයූ කල්බදු ආදායම් සහ එකතු කළ අගය මත බදු රහිත ශුද්ධ අගය) |
| 1.1.7.2.4 | අනෙකුත් ණය | සියළුම අක්‍රීය අනෙකුත් ණයවල එකතුව පෙන්වන්න. (කාලීන ණය කුට්ටි ණය, ඇසුරුම් ණය, බන්ධිත ණය, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (ප්‍රති විකුණුම්) වැනි මූල්‍ය ආයතන නොවන අනෙකුත් ගණුදෙනුකරුවන්ගේ ණය උපකරණ මත ණය දීම්, වාණිජ පත්‍ර, පොරොන්දු නෝට්ටු, ණයකර සහ අනෙකුත් ණය) |
| 1.1.7.2.5 | ලැබිය යුතු පොලී | අදළ ණය/අත්තිකාරම් ගිණුම්වලට ගිණුම්වල හර නොකළ උපචිත රැස්කර නොගත් පොලිය |
| **1.1.7.3.0** | **දළ ණය සහ අත්තිකාරම්වල එකතුව** | **සියළුම ප්‍රවර්තන සහ අක්‍රී ණය සහ අත්තිකාරම්වල පිටහිටි ශේෂයන්ගේ (මුල් මුදල සහ පොලිය) පෙන්වන්න.** |
| 1.1.7.4.0 | අත්හිට වූ පොලිය | ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානය අනුව, ණය සහ අත්තිකාරම්වල මූලික ශේෂයන්ගේ (Principal of balances) හෝ ලැබිය යුතු ණයවල, අත්හිටවූ පොලිය ඇතුලත්ව ලැබේ නම් එය පෙන්වන්න. |
| 1.1.7.5.0 | විශේෂිත ණය හානි වෙන්කිරීම් | ශ්‍රී ලංකා මහ බැංකු විධානයන් අනුව බදුවලට පෙර ආදායමෙන් නිශ්චිතව අඳුනාගත් ණය හානි සඳහා වෙන් කළ ප්‍රමාණය දක්වන්න. |
| 1.1.7.6.0 | සාමාන්‍ය/පොදු ණය හානි වෙන්කිරීම් | සාමාන්‍ය ණය හානි අලාභ සඳහා බදුවලට පෙර ආදායමෙන් වෙන් කල ප්‍රමාණය දක්වන්න. |
| 1.1.7.7.0 | ශුද්ධ ණය සහ අත්තිකාරම්වල එකතුව | දල ණය සහ අත්තිකාරම්වලින් අත්හිටවූ ණය සහ සියළුම ණය හානි අලාභ සඳහා වෙන්කිරීම් අඩුකළ පසු ශුද්ධ තත්ත්වය පෙන්වන්න. |
| **1.1.8.0.0** | **අනෙකුත් වත්කම්** | **පහත 1.1.8.1.0 සිට 1.1.8.7.0 දක්වා අයිතමයන්ගේ උප එකතුව.** |
| 1.1.8.1.0 | ඉදිරියට කළ ගෙවීම් සහ වියැකෙන සැපයුම් | කුලී තැන්පතු, උපයෝගිතා තැන්පතු, ඉදිරි කාලයට අදල කලින් ගෙවූ වියදම්. නොනිමි වැඩ සඳහා දුන් තැන්පතු/අත්තිකාරම්, පරිභෝජ්‍ය තො. |

| | | |
|---|---|---|
| 1.1.8.2.0 | අවිනිශ්චිත ගිණුම | ගිණුම් ශේෂයක හඳුනා නොගත් කිසියම් ශේෂයක් හෝ නොගැලපූ ගිණුම් ශෙෂයන්. |
| 1.1.8.3.0 | තැන්පතු සහ සුරැකුම්පත් මත උපචිත ලැබිය යුතු පොලිය | පොලී උපයන තැන්පතු සහ සුරැකුම්පත් මත ලැබිය යුතු නමුත් රැස්කර නොගත් පොලිය දක්වන්න. |
| 1.1.8.4.0 | ලැබිය යුතු ගිණුම් | ගණුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද වියදම් වෙනුවෙන් බලාපොරොත්තුවන ප්‍රතිපූරනය (ණය අනාවරණයන්ට සම්බන්ධ නොමැති) ලැබිය යුතු කුලී, ගාස්තු, පිරිවැටුම් බදු, ජාතික ආරක්ෂක බදු, එකතු කල අගය මත බදු, ණය ගන්නන් වෙනුවෙන් දරූ යම් වියදමක් ලාභ අලාභ ගිණුමට වියදමක් ලෙස සලකන්නේ නැතිනම් එය ණය යටතේ ඇතුලත් කළ යුතුය. |
| 1.1.8.5.0 | කලින් ගෙවන ලද සමාගම් බදු | බදු ගෙවන ලද නමුත් ගෙවිය යුතු බදු මත තවමත් හිලවු නොකරන ලද පහත වත්කම්වල උප එකතුව. |
| 1.1.8.6.0 | අන්තර් ශාඛා/ප්‍රධාන කාර්යාලවලින් ලැබිය යුතු ශේෂයයන් (දේශීය) | ප්‍රධාන කාර්යාලය, ශාඛා සහ විදේශ මුදල් බැංකු ඒකකයන්හි හිමිකම් පෑමේ වවුචර ශාඛා නිවේදන සහ ශාඛාවන් සහ ප්‍රධාන කාර්යාලය සමගකෙරෙන ගනුදෙනු සඳහා පවත්වාගෙන යන ගිණුම්වල ශුද්ධ ශේෂයන් (හෝ ඒකාබද්ධිත ශේෂයන්) |
| 1.1.8.7.0 | වෙනත් | ඉහත ගිණුම් ශීර්ෂයන්හි වෙනත් ආකාරයකින් ඇතුලත් නොකරන ලද වෙනත් වත්කම් ගිණුම් ශේෂයන්. |
| **1.1.9.0.0** | **අස්පෘශ්‍යය වත්කම්** | කීර්ති නාමය වෙළඳ ලකුණු /පේටන්ට් බලපත්‍රය නිශ්පාදන වර්ධන වියදම සහ වෙනත් අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම පෙන්වන්න. |
| **1.1.10.0.0** | **ආයෝජන දේපල** | කාල පරිච්ඡේදය තුළ එකතු කිරීම් සහ ඉවත් කිරීම් වලින් අනතුරුව ආයෝජන දේපලවල මුළු අගය සහ අවුරන ලද දේපල අයත් නොවන ශුද්ධ ප්‍රතිපාදන අගයන් පෙන්වන්න. |
| 1.1.11.0.0 | දේපල, යන්ත්‍ර උපකරණ (ශුද්ධ) | ක්ෂයවීම් අඩුකළ පසු ස්ථාවර වත්කම්හි උප එකතුව. |
| 1.1.11.1.0 | ඉඩම් සහ ගොඩනැගිලි | බැංකු මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කෙරෙන ඉඩම්, ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් හෝ සවිකිරීම් පිරිවැය. |
| 1.1.111.2.0 | චංචල දේපල ආදිය | උපකරණ, වාහන, කාර්යාලීය යන්ත්‍ර, ක්ෂයවිය හැකි මෘදුකාංග ආදී සියළුම චංචල දේපලවල පිරිවැය. |
| 1.1.11.3.0 | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | ඉඩම්, ගොඩනැගිලි, වැඩි දියුණු කිරීම් සහ චංචල දේපළ මුළු ගණනින් ඉවත් කිරීම, ධණ අගයන් පෙන්නුම් කිරීම, ලේඛනයේ ස්වයංක්‍රීයව අඩු කෙරේ. |
| **1.1.10.0.0** | **ශේෂපත්‍රගත වත්කම්හි මුළු ගණන** | **මුළු ශේෂ පත්‍ර වත්කම්හි මුළු එකතුව** |
| **1.2.1.0.0** | **මුළු තැන්පතු** | **පහත 1.2.1.1.0 සිට 1.2.1.5.0 දක්වා අයිතමයන්හි උප එකතුව.** |
| 1.2.1.1.0 | ඉල්ලුම් තැන්පතු | සියලු ඉල්ලුම් තැන්පතුවල බැර ශේෂ (හරට පැවති අගයන් අඩු නොකරන ලද දල ශේෂය) |
| 1.2.1.2.0 | ඉතුරුම් තැන්පතු | සියලු ඉතුරුම් තැන්පතු වර්ගවල මුළු අගය. |
| 1.2.1.3.0 | කාලීන තැන්පතු | කාලීන තැන්පතු, ඉතුරුම් සහතික කෙටි කලකින් මුදල් කළහැකි තැන්පතු සහතික (දින 1-7 අතර) |
| 1.2.1.4.0 | ආන්තික තැන්පතු ගිණුම් | ශේෂ පත්‍රයෙන් එපිට ණය පහසුකම් හා/හෝ දනට නිකුත් කර නොමැති ණය වෙනුවෙන් ගනුදෙනුකරුවන් විසින් සුරැකුම් ලෙස තබන ලද මුදල් අත්තිකාරම්. |
| 1.2.1.5.0 | වෙනත් තැන්පතු | ඉහත අයිතම යටතට නොගැනුණු අනෙකුත් සියලු තැන්පතු ශේෂ. |

| | | |
|---|---|---|
| **1.2.2.0.0** | **සමස්ථ ණයගැනීම්** | **පහත 1.2.2.1.0 සිට 1.2.2.6.0 දක්වා අයිතම්වල උප එකතුව.** |
| 1.2.2.1.0 | ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ගැනීම් | ශ්‍රී ලංකා මහ බැංකුවෙන් කළ මුළු ණය ගැනීම් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති ණයගැතිභාවයන්හි එකතුව දක්වන්න. (රිපෝ ණය ගැනීම් හැර) |
| 1.2.2.2.0 | ශ්‍රී ලංකාවේ බැංකු හා මූල්‍ය ආයතන වලින් ණය ගැනීම් | ශ්‍රී ලංකාවේ බැංකු සහ මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය ප්‍රමාණය (රිපෝ ණයගැනීම් හැර) |
| 1.2.2.3.0 | විදේශ බැංකු හ මූල්‍ය ආයතනවලින් ණය ගැනීම් | විදේශයන්හි බැංකු හා මූල්‍ය ආයතන වලින් කරන ලද සියලු වර්ගවල ණය ගැනීම් |
| 1.2.2.4.0 | ආපසු ගැනීමේ ගිවිසුම මත විකිණූ සුරැකුම් | අදළ සුරැකුම් කල් පිරීමට පෙර බේරුම් කිරීමේ එකඟතාවයට යටත්ව, භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර හා අනෙක් සුරැකුම් වලට එදිරිව කරන ලද සියලු ණය ගැනීම්. |
| 1.2.2.5.0 | යටත්කාලීන ණය | ප්‍රාග්ධන අවශ්‍යතා අරමුණු සඳහා සුදුසු වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ යටත්කාලීන ණය හා අනෙකුත් යටත් කාලීන ණය |
| 1.2.2.6.0 | අනෙකුත් ණය | ඉහත අයිතම යටතට නොගැනුනු අනෙකුත් සියලු ණය |
| **1.2.3.0.0** | **විලම්භිත බදු** | **කාල වෙනස හේතුවෙන් ඇතිවන විලම්භිත බදු** |
| **1.2.4.0.0** | **ප්‍රවර්ථන බදු** | **ගෙවිය යුතු බදු එකතුව** |
| **1.2.5.0.0** | **අනෙකුත් වගකීම්** | **පහත 1.2.5.1.0 සිට 1.2.5.7.0 දක්වා අයිතමයන්හි උප එකතුව** |
| 1.2.5.1.0 | කලින් අයකරගත් අයකිරීම් | අනාගත කාල වකවානුවක් සඳහා අදළ වන කලින් අයකරගත් අයකිරීම් |
| 1.2.5.2.0 | ගෙවිය යුතු බදු | - |
| 1.2.5.2.0 | තැන්පතු මත ගෙවිය යුතු උපචිත පොලී | ගණුදෙනුකරුවන්ගේ ශ්‍රී ලංකා රුපියල් තැන්පතු ගිණුම් වලට බැර නොකළ නමුත්, උපචිත පොලී |
| 1.2.5.3.0 | ණයගැනීම් මත ගෙවිය යුතු උපචිත පොලී | ශ්‍රී ලංකා රුපියල් ණය ගැනීම් මත නොගෙවිය යුතු වුවත් උපචිත පොලී |
| 1.2.5.4.0 | අනෙකුත් උපචිත වියදම් හා ගෙවිය යුතු වියදම් | ගනුදෙනු හා ගනුදෙනුකරුවන්ගේ ගිණුම් හා සම්බන්ධ උපයෝගී වියදම් වෙන් කිරීම්, දඩ, බදු, ආරක්ෂිත සේප්පු තැන්පතු, අධි උකස් අත්තිකාරම්, බදු තැන්පතු අත්තිකාරම්, සේ.අ.අ. හා සේ.භා අ. සම්බන්ධ ගෙවිය යුතු වියදම් |
| 1.2.5.5.0 | අවිනිශ්චිත ගිණුම් | ගිණුම් ශේෂයන්හි හඳුනානොගත් වෙනස්කම් හා නොසැසඳුනු ගිණුම් ශේෂ නිෂ්කාෂනයට යවනු ලැබූ නමුත් අදළ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට බැර නොවූ චෙක්පත්. |
| 1.2.5.6.0 | අන්තර් ශාඛා/ප්‍රධාන කාර්යාල ශේෂ (දේශීය) | හිමිකම් චවුචර්, ශාඛා විධාන හා ශාඛා සමහ හා ප්‍රධාන කාර්යාලය සමහ ගනුදෙනු සඳහා ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ගිණුම් ශේෂ |
| 1.2.5.7.0 | වෙනත් | ඉහත අයිතමයන්හි සඳහන් නොවූ වගකීම්. |
| **1.2.6.0.0** | **ශේෂ පත්‍රය මත වගකීම්වල එකතුව** | **සමස්ථ තැන්පතු, සමස්ථ ණය, සමස්ථ අනෙක් වගකීම් හා විලම්භිත බදු වල උප එකතුව** |
| **1.3.0.0.0** | **සුළු කොටස්කරුවන්ගේ හිමිකම** | - |
| **1.4.0.0.0** | **සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා සංචිත** | **පහත 1.4.1.0.0 සිට 1.4.3.0.0 දක්වා අයිතමයන්හි උප එකතුව** |
| 1.4.1.0.0 | කොටස් ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය | නිකුත් කළ ඡන්දය හිමි හා අහිමි සාමාන්‍ය කොටස් (සම්පූර්ණ හා අර්ධ වශයෙන් ගෙවා නිමි) හා නිකුත් කළ සම්පූර්ණ හා අර්ධ වශයෙන් ගෙවා නිමි වරණීය කොටස් හෝ ප්‍රධාන කාර්යාලය විසින් පැවරූ ප්‍රාග්ධනය. (හිමිකම් හා සංචිත වාර්තාවේ දක්වෙන මුළු හිමිකම් ප්‍රාග්ධනය හා සමාන විය යුතුය.) |

| | | |
|---|---|---|
| 1.4.2.0.0 | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | බැංකු පනතේ 20 වැනි ඡේදය අනුව ඇති කරනු ලැබූ ව්‍යවස්ථාපිත සංචිත අරමුදල (හිමිකම් හා සංචිත වාර්තාවේ දක්වෙන ව්‍යවස්ථාපිත සංචිත අරමුදල හා සමාන විය යුතුයි.) |
| 1.4.3.0.0 | සමස්ත අනෙක් සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල හැර සියලු සංචිත. |
| **1.5.0.0.0** | **සමස්ථ ශේෂ පත්‍රය මත වගකීම් හා ප්‍රාග්ධනය හා සංචිත** | **1.2.6.0.0, 1.3.0.0.0, 1.4.0.0.0 අයිතමවල එකතුව** |
| **1.6.0.0.0** | **ශේෂ පත්‍රයෙන් එපිට අයිතම** | **(හිමිකම් හා සංචිතවල වෙනස්වීම් වාර්තාවේ දක්වෙන සමස්ත අනෙක් සංචිත හා සමාන විය යුතුයි)** |
| **1.6.1.0.0** | **අසම්භාව්‍යතා** | **1.6.1.1.0 සිට 1.6.1.10.0 දක්වා අයිතමයන්හි එකතුව.** |
| 1.6.1.1.0 | ණයවර ලිපි | බැංකුව විසින් විවෘත කළ නීත්‍යානුකූල භාවිතා නොකළ දුටුවන හා ණයවර ලිපිවල එකතුව |
| 1.6.1.2.0 | ඇපකර/බැඳුම්කර | බැංකු විසින් නිකුත් කළ තීරු බදු බැඳුම්කර, මූල්‍ය බැඳුම්කර, කාර්ය සාධන බැඳුම්කර හා ලංසු බැඳුම්කර හා ඒවායේ නියමිත දිනට වලංගු ප්‍රමාණය. |
| 1.6.1.3.0 | නාවික ඇපකර | ණයවර ලිපි හා ණයවර ලිපි නොවන බිල්පත් සඳහා නිකුත් කල නාවික ඇපකර |
| 1.6.1.4.0 | ප්‍රතිග්‍රහණ | පසුදිනක කල් පිරෙන අණකර එදිරිව ගණුදෙනුකරුවන් සඳහා නිකුත් කළ ආනයන බිල්පත් |
| 1.6.1.5.0 | කොටස් හා සුරැකුම් ප්‍රාරක්ෂණය සුරැකුම්කරණය හා ඇපකර පිටසන් | මහජනයා සහභාගි නොවන කොටස්, වාණිජපත් හා වෙනත් සුරැකුම් මිලදී ගැනීමට බැංකුවේ එකඟත්වය |
| 1.6.1.6.0 | සුරැකුම් | පිළිසරණ සහිත සුරැකුම්කරන ලද ණය අත්තිකාරම් හා බැංකුව විසින් ඇපවූ හෝ පිටසන් කල සුරැකුම්වල එකතුව |
| 1.6.1.7.0 | ඉදිරි ගිවිසුම් | ගැණුම් හා විකුණුම් එකඟතා ඇතුලත් විදේශ විනිමය ඉදිරි ගිවිසුම් |
| 1.6.1.8.0 | එතැන් ගිවිසුම් | ගැණුම් හා විකුණුම් එකඟතා ඇතුලත් විදේශ විනිමය එතැන් ගිවිසුම් |
| 1.6.1.9.0 | ව්‍යුත්පන්න | අනාගත පොලී අනුපාතික හා විකල්ප විදේශ විනිමය හා සාමාන්‍ය කොටස් ඇතුලත් ව්‍යුත්පන්න ගිවිසුම්වල අගය දක්වන්න. |
| 1.6.1.10.0 | වෙනත් | වෙනත් ශේෂ පත්‍රයෙන් එපිට අසම්භාව්‍යතාවයන් |
| **1.6.2.0.0** | **බැඳීම් සහ ප්‍රතිගිණුම්** | **1.6.2.1.0 සහ 1.6.2.1.1 යන අයිතමයන්හි උප එකතුව.** |
| 1.6.2.1.0 | බැඳීම් | භාවිතා නොකළ ණය සීමාවන් සහ ශේෂපත්‍රයෙන් බැහැර වෙනත් බැඳීම් ඇතුළුව, බැංකුව විසින් එකඟ වී ඇති බැඳීම්. |
| 1.6.2.1.1 | ප්‍රති ගිණුම් | සියළුම වර්ගයේ ප්‍රතිගිණුම් - බිල්පත් / අය ලැබීමට යැවූ බිල්පත්, අතැති සංචාරක චෙක්පත් හෝ වෙනත් ශේෂ පත්‍රයෙන් බැහැර ප්‍රති ගිණුම් ඇතුළුව. |
| **1.7.0.0.0** | **සාංගමික තොරතුරු** | - |
| 1.7.1.0.0 | සේවක සංඛ්‍යාව | මුළු සේවක සංඛ්‍යාව (ස්ථිර, අනියම් ආදී) |
| 1.7.2.0.0 | ශාඛා සංඛ්‍යාව | බැංකුව මහින් මෙහෙයවනු ලබන ශාඛා සංඛ්‍යාව |

## 2. ආදයම් ප්‍රකාශය රුපියල් දහස් වලින්

| | | |
|---|---|---|
| **2.1.0.0.0** | **පොලී ආදයම්** | **පහත 2.1.1.0.0 සහ 2.1.2.0.0 යන අයිතමයන්හි උප එකතුව** |
| 2.1.1.0.0 | ණය හා අත්තිකාරම් | විවිධ වර්ගයේ ණය පහසුකම් වෙනුවෙන් ගණුදෙනුකරුවන්ගෙන් ලද හෝ ලැබිය යුතු ලෙස ගිණුම් ගතකළ පොලී ආදයම්. |
| 2.1.2.0.0 | අනෙක් පොලී ඉපයුම් වත්කම් හා පොලී ආදයම් | විවිධ වර්ගයේ අනෙකුත් සියලු ණය පහසුකම් වෙනුවෙන් ගණුදෙනුකරුවන්ගෙන් ලද හෝ ලැබිය යුතු ලෙස ගිණුම් ගතකළ පොලී ආදයම්. |
| **2.2.0.0.0** | **පොලී වියදම්** | **පහත 2.2.1.0.0 සහ 2.2.2.0.0 යන අයිතමවල උප එකතුව** |
| 2.2.1.0.0 | තැන්පතු | සියලු තැන්පත් වර්ග මත (ගෙවූ හෝ ගෙවිය යුතු ලෙස ගිණුම් ගතකළ පොලී වියදම්) |
| 2.2.2.0.0 | අනෙක් පොලී ගෙවිය යුතු වගකීම් මත පොලී වියදම | විවිධ වර්ගයේ අනෙකුත් සියළු පොලී ගෙවිය යුතු වගකීම් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවිය යුතු ලෙස ගිණුම් ගතකළ පොලී වියදම්. |
| 2.3.0.0.0 | ශුද්ධ පොලී ආදයම | පොලී ආදයම් (2.1.0.0.0) හා වියදම (2.2.0.0.0) අතර වෙනස |
| **2.4.0.0.0** | **පොලී නොවන ආදයම** | **2.4.1.0.0 සිට 2.4.2.0.0 දක්වා අයිතමයන්හි උප එකතුව.** |
| **2.4.1.0.0** | **විදේශීය විනිමය ආදයම** | **2.4.1.1.0 සිට 2.4.1.4.0 දක්වා අයිතමයන්හි උප එකතුව.** |
| 2.4.1.1.0 | විදේශීය මුදල් ගනුදෙනු මත ශුද්ධ ලාභ/අලාභ | විදේශ මුදල් ගනුදෙනු මත වූ සියලුම කොමිස් හා සේවා ගාස්තු. |
| 2.4.1.2.0 | විදේශීය විනිමය ගනුදෙනු මත වූ කොමිස් හා සේවා ගාස්තු | විදේශීය විනිමය ගනුදෙනු මත වූ සියලුම හා සේවා ගාස්තු. |
| 2.4.1.3.0 | විදේශීය විනිමය ප්‍රත්‍යගණනයන් ලද ශුද්ධ ලාභ /(අලාභ) | එතැන් හා ඉදිරි විනිමය ගිවිසුම් වැනි විදේශීය විනිමය මගින් ප්‍රකාශිත වත්කම් හා වගකීම් ප්‍රත්‍යගණනය මත විනිමය ලාභ හෝ අලාභ. |
| 2.4.1.4.0 | වෙනත් | ඉහතින් සඳහන් නොකළ සියලුම ආකාරයේ විදේශීය විනිමය ආදයම්. |
| **2.4.2.0.0** | **වෙනත් ආදයම්** | **පහත 2.4.2.1.0 සිට 2.4.2.9.0 යන අයිතමයන්ගේ උප එකතුව.** |
| 2.4.2.1.0 | ආයෝජන මත වූ ලාභාංශ ආදයම | සියලුම වර්ගයේ කොටස් ආයෝජනයන්ගේ ලැබූ හෝ ලැබිය යුතු වශයෙන් ගිණුම් ගතකළ ලාභාංශ ආදයම්. |
| 2.4.2.2.0 | වෙළෙඳ/ආයෝජන සුරැකුම් මත ලාභ | වෙළෙඳ/ආයෝජන සුරැකුම් ඒවායේ මිලට වැඩියෙන් විකිණීමෙන් උපයන ලද ආදයම. |
| 2.4.2.3.0 | භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ | භාණ්ඩාගාර බැඳුම්කර වට්ටම් මිලට ගැනීමෙන් ක්‍රමක්ෂය වන ආදයම ප්‍රමාණය. |
| 2.4.2.4.0 | රුපියල් ව්‍යුත්පන්න උපකරණමත ශුද්ධ ලාභ/අලාභ | ස්ථාවර වත්කම් විකිණීම මගින් උපයන ලද ලාභ. |
| 2.4.2.5.0 | ශේෂ පත්‍රයන් පිටත ණය පහසුකම් මත කොමිස් | ණයවර ලිපි ඇපකර ලිපි, නාවික ඇපකර නිකුත් කිරීම අපනයන ණයවර ලිපි දැනුම්දීම. ඇපවීම් හා අනෙකුත් ශේෂ පත්‍රයෙන් බැහැර ණය පහසුකම් මත ලැබූ හෝ ලැබිය යුතු වශයෙන් ගිණුම් ගත කළ කොමිස්. |
| 2.4.2.6.0 | වෙනත් කොමිස් හා සේවා ගාස්තු | විවිධ පහසුකම් සැපයීම් සැපයීම සඳහා තුන්වන පාර්ශවයන් වෙනුවෙන් ගනුදෙනුකරුවන්ට සලසන සේවා සඳහා උපයන කොමිස් හා සේවා ගාස්තු. |

| | | |
|---|---|---|
| 2.4.2.7.0 | සේවා මත අයකිරීම් | ගනුදෙනුකරුවන් සපයන සේවා මත අයකිරීම් වශයෙන් උපයන ආදායම. |
| 2.4.2.8.0 | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම් වශයෙන් වූ ලාභ. |
| 2.4.2.9.0 | වෙනත් | ඉහතින් සඳහන් නොකළ වෙනත් ආදායම්. |
| **2.5.0.0.0** | **පොලී නොවන වියදම්** | **පහත 2.5.1.0.0 සිට 2.5.6.0.0 දක්වා අයිතමයන්ගේ උප එකතුව.** |
| 2.5.1.0.0 | සේවක පිරිවැය | පුහුණු පිරිවැය හැර වැටුප්, ප්‍රතිපූරණයන් සහ සේවක අර්ථ සාධක/සේවක භාරකාර අරමුදල් සඳහා දායකයන් ආදී සේවකයන් වෙනුවෙන් වැය කරන ලද සියලුම වියදම් |
| 2.5.2.0.0 | සේවක විශ්‍රාම ප්‍රතිලාභ වෙන් කිරීම් | සේවක විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් කරන ලද සියලුම වෙන් කිරීම් |
| 2.5.3.0.0 | පරිශ්‍ර උපකරණ හා ආයතනික වියදම් | සියළුම වර්ගයේ පරිශ්‍ර, උපකරන හා පාලන වියදම්. |
| 2.5.4.0.0 | වෙළෙඳ/ආයෝජන සුරැකුම් මත අලාභ | වෙළෙඳ / ආයෝජන සුරැකුම් ඒවායේ ගැණුම් වලට මිලට අඩුවෙන් විකිණීමෙන් ඇතිවන ලාභය. |
| 2.5.5.0.0 | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම් | අස්පෘශ්‍යය වත්කම් ක්‍රමක්ෂය කිරීමේ මුළු වටිනාකම. (කීර්තිනාමය/ සෘණ කීර්තිනාමය ආදිය) |
| 2.5.6.0.0 | වෙනත් මෙහෙයුම් ආදායම් | වෙනත් ඕනෑම මෙහෙයුම් වියදම්. |
| **2.6.0.0.0** | **බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම් හා ණය කපා හැරීම්** | **පහත 2.6.1.0.0 සිට 2.6.4.0.0 දක්වා අයිතමයන්ගේ උප එකතුව.** |
| 2.6.1.0.0 | පොදු වෙන් කිරීම් | ණය කාර්ය සාධනය නොසලකා විය හැකි ණය පාඩු සඳහා ලාභයෙන් කරන්නාවූ පොදු වෙන්කිරීම්. |
| 2.6.2.0.0 | විශේෂිත වෙන් කිරීම් | ණය කාර්ය සාධනය නොසලකා විය හැකි ණය පාඩු සඳහා ලාභයෙන් කරන්නාවූ විශේෂිත වෙන්කිරීම්. |
| 2.6.3.0.0 | අයකරගැනීම් (-) | අදාල වාර්තා කරන කාලයේ දී කපා හළ හෝ වෙන්කරන ලද ණය සම්බන්ධයෙන් සිදුකළ ණය අයකරගැනීම්. |
| 2.6.4.0.0 | ණය කපා හැරීම් | අදාල වාර්තා කරන කාලයේ දී පොත්වලින් කපා හරින ලද සියළුම ණය. |
| **2.7.0.0.0** | ආයෝජනයන්ගේ වටිනාකමේ අඩුවීම් සඳහා වෙන් කිරීම් (ශුද්ධ) | **ආයෝජනයන්ගේ වෙළෙඳපොල අගයේ විය හැකි අඩුවීම් සඳහා වෙන්කිරීම්.** |
| **2.8.0.0.0** | **බදුවලට පෙර සාමාන්‍ය කටයුතු මත මෙහෙවම් ලාභය** | **ශුද්ධ පොලී ආදායම් උප එකතුව (2.3.0.0.0) පොලී නොවන වියදම්. (2.5.0.0.0) ණය පාඩු වෙන්කිරීම් (2.6.0.0.0) ආයෝජනයන්ගේ වටිනාකම් අඩුවීම් සඳහා වෙන්කිරීම් (ශුද්ධ) (2.7.0.0.0)** |
| **2.9.0.0.0** | **මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු** | **ලාභය හා අනෙක් දේ මත මූල්‍ය එකතුකළ අගය මත බදු.** |
| **2.10.0.0.0** | **බදු අඩු කිරීමට පෙර සාමාන්‍ය කටයුතු වලින් ලැබූ මෙහෙයුම් ලාභය** | **බදු අඩුකිරීමට පෙර සාමාන්‍ය කටයුතුවලින් ලැබූ මෙහෙයුම් ලාභය (2.8.0.0.0) - මූල්‍ය සේවා මත එකතු කල වටිනාකම මත බදු (VAT) 2.9.0.0.0)** |
| **2.11.0.0.0** | **පාලිත/ආශ්‍රිත සමාගම් වල ලාභ කොටස** | **පාලිත/ආශ්‍රිත සමාගම් වල මුළු ලාභ කොටස.** |
| **2.12.0.0.0** | **සමාගම් බදු අඩු කිරීමට පෙර මෙහෙයුම් ලාභය** | **අයිතම 2.1.0.0.0.0 සහ 2.1.1.0.0.0 හී උප එකතුව.** |

| | | |
|---|---|---|
| **2.13.0.0.0** | **සාමාන්‍ය කටයුතු වලින් ඉපයූ ලාභය මත බදු** | **බදු අය කළ යුතු ලාභය මත ගෙවිය යුතු බදු.** |
| **2.14.0.0.0** | **සමාගම් බදු අඩුකළ පසු මෙහෙයුම් ලාභය** | **සමාගම් බදු අයකිරීමට පෙර මෙහෙයුම් ලාභය (2.1.2.0.0.0) - සාමාන්‍ය කටයුතුවලින් ඉපයූ ලාභය මත බදු (2.1.3.0.0.0)** |

## 3. කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය හා සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය රුපියල් දහස් වලින්

| | | |
|---|---|---|
| **3.1.0.0.0** | **ආරම්භක ශේෂය** | පෙර මූල්‍ය වර්ෂයේ අවසාන ශේෂය |
| 3.2.1.0.0 | කොටස් නිකුතුව/ පවරනු ලැබූ ප්‍රාග්ධනයේ වැඩිවීම. | අදාළ කාල සීමාව තුළ සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් ගෙවනු ලැබූ ඡන්ද හිමි සහ ඡන්ද හිමි නොවන සාමාන්‍ය කොටස් සහ වරණීය කොටස් නිකුතුව හෝ ප්‍රධාන කාර්යාලය මගින් පැවරූ ප්‍රාග්ධනය වැඩි කිරීම. |
| 3.2.2.0.0 | ප්‍රසාද නිකුතුව | සලකා බලන කාලය තුළ කරන ලද ප්‍රසාද නිකුතු |
| 3.2.3.0.0 | හිමිකම් නිකුතුව | සලකා බලන කාලය තුළ කරන ලද හිමිකම් නිකුතු |
| 3.2.4.0.0 | දේපළ ප්‍රත්‍යාගණනය කිරීමෙන්න ඇතිවන අතිරික්තය | අදාළ කාල සීමාව තුළ හඳුනා ගත් දේපළ ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්තය. |
| 3.2.5.0.0 | අදාළ කාලය සඳහා ශුද්ධ ලාභය අලාභය | - |
| 3.2.6.0.0 | අදාළ කාලය තුළ සංචිතවලට වෙන්කිරීම් | සලකා බලන කාලය තුළ අදාළ සංචිතයන්ට කරන ලද ව්‍යවස්ථාපිත හා අනෙක් වෙන් කිරීම් |
| 3.2.7.0.0 | ගෙවන ලද ලාභාංශ | බදු අඩු කිරීමෙන් පසු කොටස් හිමියන් වෙත බෙදහරින ලාභය |
| 3.2.8.0.0 | ප්‍රධාන කාර්‍යාලය වෙත යැවූ ලාභය | විදේශීය බැංකු සඳහා පමණක් අදාල වේ. |
| 3.2.9.0.0 | අනෙකුත් | ස්කන්ධ ප්‍රාග්ධනය හා සංචිත මත සෘජුව බලපෑම් කරනු ලබන අයිතමයන් දක්වන්න. මෙම අයිතමයන් වෙනමම සඳහන් කරන්න. |
| 3.3.0.0.0 | අවසාන ශේෂය | වාර්තා කරන කාලයට අවසාන ශේෂය |

## 4. තෝරා ගත් කාර්යසාධක දර්ශක

| | | |
|---|---|---|
| 4.1.0.0.0 | **විධිමත් කිරීමේ ප්‍රාග්ධන අවශ්‍යතාවය** | |
| 4.1.1.0.0 | මූලික ප්‍රාග්ධනය (පළමු පෙළ) | ප්‍රාග්ධන අවශ්‍යතා විධානයට අනුව, පළමු පෙල ප්‍රාග්ධනයේ සමස්ත අගය දක්වන්න.<br>(තන  තනිව හා ඒකාබද්ධ පදනම මත වෙන් වෙන්ම දක්වන්න.) |
| 4.12.0.0 | මුළු ප්‍රාග්ධන මූලය | ප්‍රාග්ධන අවශ්‍යතා විධානයට අනුව සමස්ත ප්‍රාග්ධන මූලය දක්වන්න. |
| 4.1.3.0.0 | මූලික ප්‍රාග්ධන අනුපාතය(පළමු පෙළ)% | මූලික ප්‍රාග්ධනය (පළමු පෙළ) * 100<br>අවධානම මත බර තැබූ වත්කම්<br>(තනි තනිව හා ඒකාබද්ධ පදනම මත වෙන් වෙන්ව දක්වන්න.) |
| 4.1.4.0.0 | මුළු ප්‍රාග්ධන අනුපාතය, % | සමස්ත ප්‍රාග්ධනය * 100<br>අවධානම මත බර තැබූ වත්කම්<br>(තනි තනිව හා ඒකාබද්ධ පදනම මත වෙන් වෙන්ව දක්වන්න.) |
| **4.2.0.0.0** | **වත්කම්වල ගුණාත්මය** | |

| | | |
|---|---|---|
| 4.2.1.0.0 | දළ අක්‍රීය ණය අනුපාතය% | මුළු අක්‍රීය ණය හා අත්තිකාරම්-මුළු අවිනිශ්චිතා පොලිය - මුළු වෙන්කිරීම්.<br>————<br>මුළු අක්‍රීය ණය හා අත්තිකාරම්-මුළු අවිනිශ්චිතා පොලිය (බැංකුව පමණයි) |
| 4.2.2.0.0 | ශුද්ධ අක්‍රීය ණය අනුපාතය % | මුළු අක්‍රීය ණය හා අත්තිකාරම්-මුළු අවිනිශ්චිතා පොලිය - මුළු වෙන්කිරීම්<br>————<br>මුළු අක්‍රීය ණය හා අත්තිකාරම්-මුළු අවිනිශ්චිතා පොලිය (බැංකුව පමණයි) |
| **4.3.0.0.0** | **ලාභදායීතාවය** | |
| 4.3.1.0.0 | පොලී ආන්තිකය % | ශුද්ධ පොලී ආදයම (වාර්ෂික) * 100<br>මුළු වත්කම්හි සාමාන්‍ය වටිනාකම<br><br>ශුද්ධ පොලී ආදයම:පොලී ආදයමින්,පොලී වියදම් අඩුකොට ලැබෙන අගය (වාර්ෂික)<br>මුළු වත්කම්හි සාමාන්‍ය වටිනාකම : වාර්තා කරනු ලබන දිනය දක්වා මාසික සාමාන්‍යය (බැංකුව පමණයි) |
| 4.3.2.0.0 | වත්කම් මත ලැබීම් (බදු ගෙවීමට පෙර) % | බදු ගෙවීමට පෙර ලාභය (වාර්ෂික) * 100<br>මුළු වත්කම්වල සාමාන්‍ය වටිනාකම<br><br>බදු ගෙවීමට පෙර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මගින් ලබා ගන්නා ශුද්ධ මෙහෙයුම් ලාභය (වාර්ෂික)<br>මුළු වත්කම්වල සාමාන්‍ය වටිනාකම : වාර්තා කරනු ලබන දිනය දක්වා මාසික සාමාන්‍යය.(බැංකුව පමණයි) |
| 4.3.3.0.0 | ප්‍රාග්ධනය මත ලැබීම් % | බදු ගෙවූ පසු ලාභය (වාර්ෂික) * 100<br>ප්‍රාග්ධන අරමුදලේ සාමාන්‍ය වටිනාකම<br><br>බදු ගෙවූ පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මගින් ලබාගන්නා ශුද්ධ මෙහෙයුම් ලාභය (වාර්ෂික)<br>ප්‍රාග්ධන අරමුදලේ සාමාන්‍ය වටිනාකම : වාර්තා කරනු ලබන දිනය දක්වා මාසික සාමාන්‍යය.(බැංකුව පමණයි) |
| **4.4.0.0.0** | **ව්‍යවස්ථාපිත ද්‍රවශීලතාවය** | |
| 4.4.1.0.0 | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවයට අනුව ද්‍රවශීල වත්කම්වල සාමාන්‍යයයේ මුළු එකතුව සඳහන් කරන්න. (බලපත්‍රලාභී වානිජ බැංකු : දේශීය බැංකු කටයුතු ඒකකය හා විදේශ බැංකු කටයුතු ඒකකය සඳහා ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය වෙන් වෙන්ව සඳහන් කරන්න.)<br>(බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා): ද්‍රවශීල වත්කම්වල සාමාන්‍යය * 100<br>මුළු වගකීම් පදනම |
| 4.4.2.0.0 | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය% | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවයට අනුව දේශීය බැංකු කටයුතු ඒකකය හා විදේශීය බැංකු කටයුතු ඒකකය සඳහා ඉහත අනුපාතය වෙන් වෙන්ව දක්වනත.<br>(බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා): ද්‍රවශීල වත්කම්වල සාමාන්‍යය * 100<br>මුළු තැන්පතු<br>ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවයට අනුව. |

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 ඔක්තෝබර් 10

වෙත:- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු
(ජාතික ඉතිරිකිරීමේ බැංකුව හැර)

ප්‍රිය මහත්මයාණනි,

## කේවල ණයගැති සීමාව පිළිබඳ සංශෝධිත නියෝගය

2005 ජුලි 28 වන දින පැවැති බලපත්‍රලාභී වාණිජ හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී නිවේදනය කළ පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නිකුත් කරන ලද මේ සම්බන්ධ නව නියෝගයට අනුකූල වන සේ කේවල ණය ගැති සීමාව පිළිබඳ 2005 අංක 3 දරන විධානය වෙනස් කොට ඇත.

බැංකු පනතේ 76ඒ(1) වගන්තිය යටතේ නිකුත් කළ 2005 අංක 5 දරණ සංශෝධිත නියෝගය මේ සමඟ අමුණා ඇත. කරුණාකර ලැබුන බව දනුම්දෙන්න.

මෙයට විශ්වාසී,

අත්සන් කළේ ,
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

## 2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනතින් හා 1995 අංක 33 දරන බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත

2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනතින් හා 1995 අංක 33 දරන බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 76ඒ(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝගය.

2005 ඔක්තෝබර් 10 අත්සන් කලේ / සුනිල් මෙන්ඩිස්
කොළඹ. අධිපති

## බැංකු පනත (කේවල ණයගැති සීමාව) 2005 අංක 05 දරන විධානය

1. බැංකු පනතේ 2005 අංක 3 දරණ (කේවල ණය ගැති සීමාව) නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

2. කලින් නියෝගයේ දෙවෙනි වගන්තිය වෙනුවට පහත වගන්ති ආදේශ කරනු ලැබේ.
බැංකු පනතේ නිර්වචනය කර ඇති ආකාරයට හිමිකරු ප්‍රාග්ධනයක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් පෙර මූල්‍ය වර්ෂයේ ප්‍රාග්ධන අරමුදල් වලින් 30%ක් ඉක්මවා යන ණය පහසුකමක් පහත දක්වා ඇති අයවළුන්ට ලබා නොදිය යුතුය.

2.1 කිසියම් තනි සමාගමකට, පොදු සංස්ථාවකට, ආයතනයකට, පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සංගමයකට හෝ කිසියම් තනි පුද්ගලයෙකුට

2.2 එකතුවක් වශයෙන් ගත්විට

2.2.1 කිසියම් තනි පුද්ගලයෙකුට, ඔහුගේ ළඟ ඥාතියෙකුට හෝ ඔහුට සැලකිය යුතු බැඳියාවක් ඇති සමාගමකට හෝ ආයතනයකට

2.2.2 සමාගමක් හෝ පහත ඒවායින් එකක් හෝ කිහිපයක්
2.2.2.1 එහි පාලිත සමාගම
2.2.2.2 එහි මවු සමාගම
2.2.2.3 එහි ආශ්‍රිත සමාගම
2.2.2.4 එහි මවු සමාගමේ පාලිත සමාගම හෝ
2.2.2.5 එම සමාගමට හෝ ඒවා පාලිත සමාගමට හෝ, එහි මව් සමාගමට හෝ එහි මව් සමාගමේ පාලිත සමාගමකට සැලකිය යුතු බැඳියාවක් ඇති සමාගමකට

3. කලින් නියෝගයේ 4 වැනි ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කරනු ලැබේ.

" 4. දෙවන සහ තුන්වන ඡේද සම්බන්ධයෙන්, කිසියම් පහසුකමක් බලපත්‍රලාභී වාණිජ බැංකුව ප්‍රාග්ධන අරමුදල් වලින් 30% හෝ 15% ඉක්මවා යන්නේ දැයි තීරණය කිරීමේදී දැනට සපයා ඇති පහසුකම්වල සීමාවන් හෝ සියළු පහසුකම්වල හිඟ හිටි අගයන්ගෙන් වැඩි අගය සැලකිල්ලට ගත යුතුය.

තුන්වන ඡේදය සඳහා බලපත්‍රලාභී විශේෂිත බැංකුවක පෙර වර්ෂයේ අග වනවිට සමස්ත ණය පහසුකම් ප්‍රමාණය යන්නෙන් අදහස් වන්නේ පෙර මූල්‍ය වර්ෂයේ අගවන විට පැවැති සියළු පහසුකම්වල හිඟ හිටි ප්‍රමාණයන්".

4. කලින් නියෝගයේ 5 වෙනි ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කෙරේ.

" 5 (1) 2.1 සහ 2.2 ඡේදවල සඳහන් කාණ්ඩවලට අයත් ගණුදෙනුකරුවන්ට පහත සඳහන් සුරැකුම් ඇප වශයෙන් තබා දෙනු ලබන ණය පහසුකම් කේවල ණය ගැති සීමාව ගණනය කිරීමේදී ඉවත් කළ යුතුය.

(අ) මුදල්

(ආ) රජයේ/මහ බැංකු සුරැකුම්පත්

(ඇ) භාණ්ඩාගාර/මහ බැංකු ඇපකර

(ඈ) ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සංවර්ධන ආයතනය, ලෝක බැංකුව හෝ ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත හැකි වෙනත් ආයතනයකින් නිකුත් කරන ලද ඇපකර

(ඉ) පහත 2 උපඡේදයේ දක්වා ඇති නීති සහ කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරනු ලැබූ හෝ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කළ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් නිකුත් කළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකට පිළිගත හැකි ඇපකරයකට හෝ සමාන උපකරණයක් ඇප වශයෙන් තබාගෙන ලබා දී ඇති ණය පහසුකමක්.

5.2 ඉහත (ඉ) උප වගන්තිය යටතේ යම් ආයතනයක් නිකුත් කළ යම් ඇපකරයක් හෝ සමාන උපකරණයක් පිළිගත ඇති වනුයේ පහත නීති සහ කොන්දේසිවලට යටත්වය.

(අ) එම ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයකින් ලබාගත් A- හෝ ඉහළ (හෝ එයට සමාන) උසස් ශ්‍රේණියක් ලැබූ ආයතනයක් විය යුතුය.

(ආ) කේවල ණයගැති සීමාව ගණනය කිරීමේදී වටිනාකමින් අත්හැරිය හැකි ප්‍රතිශතය පහත පරිදි වේ.

| ණය ශ්‍රේණිය | වටිනාකමින් අත් හැරිය හැකි ප්‍රතිශතය |
|---|---|
| AAA සිට AA- (හෝ සමාන) දක්වා | 80% |
| A සිට A- (හෝ සමාන) | 50% |

(ඇ) ඉහත පදනම යටතේ අතහරිනු ලැබූ සියළු පහසුකම්වල එකතුව බැංකුවේ ප්‍රාග්ධන අරමුදල්වලින් 100% නොඉක්මවිය යුතුය.

(ඈ) ඇපකරය සපයන බැංකුවට ලබා දී ඇති ණය ශ්‍රේණිය ප්‍රවර්තන එකක් බවත් එය නැවත සලකා බැලීම අවශ්‍ය වී නොමැති බවත් බැංකුව සෑහීමකට පත්විය යුතුය. එහි වෙනසක් වන්නේ නම් ඒ පිළිබඳව වහාම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු අතර, ඒ අනුව ලබා දී තිබෙන ණය පහසුකම් ඊළඟ ආසන්නම ණය සමාලෝචනයේදී සංශෝධනය කළ යුතුය."

5. කලින් නියෝගයේ (said direction) 6.4 වැනි ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කරනු ලැබේ.

"(iv ) ණය ලබාගත් ගණුදෙනුකරු/ගණුදනුකරුවන් ලබාගත් ණය පහසුකම සෘජුවම භාවිතා කරනු ලබන්නේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියකට වන අවස්ථාවේදී,

5.1 යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් යනුවෙන් අදහස් කරන්නේ මෙහි ඇමුණුම 1 හි විස්තර කර ඇති ව්‍යාපෘතියකි.

5.2 ගණුදෙනුකරුට/ගණුදෙනුකරුවන්ට සෘජුවම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇති විට

5.3 එම ව්‍යාපෘතියේ අරමුදලින් අවම තරමින් 50%ක් ශ්‍රී ලංකාවට පිටත අරමුදල් වලින් හෝ ණය පහසුකම ලබාදෙන බැංකුව හැර වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ/හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් සැදුම් ලත් කණ්ඩායමක් මගින් ලබාදෙන විට

5.4 එම ණය පහසුකම මුද හැරීමට පෙර මේ සමඟ පනවා ඇති (අ), (ආ) සහ (ඇ) යන කොන්දේසි සපුරා ඇති බවට එම බලපත්‍රලාභී වාණිජ බැංකුව සෑහීමකට පත්වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත සහතික කර ඇති විටක

5.5 මෙම උප වගන්තිය අනුව යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට ලබා දුන් ණය බැංකුවේ පෙර මූල්‍ය වර්ෂයේ ප්‍රාග්ධන අරමුදල් වලින් 50% නොඉක්මවිය යුතුය.

6. මෙම නියෝගය වහාම බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ.

ඇමුණුම 1

## කේවල ණය ගැති සීමාව පිළිබඳ නියෝගයේ 6.4 ඡේදය යටතේ ව්‍යතිරේකයක් වීම සඳහා සුදුසුකම් ලැබීමට යටිතල පහසුකම් ණය යන්නෙහි නිර්වචනය

යටිතල පහසුකම් සඳහා පහත දක්වා ඇති ආකාරයෙන් ලබා දී ඇති ණය පහසුකම් කේවල ණය ඇති සීමාව පිළිබඳ නියෝගයේ 6.4 වගන්තිය යටතේ ව්‍යාතිරේකයක් වශයෙන් සැලකීම සඳහා සුදුසුකම් ලබනු ලැබේ. පහත සඳහන් කාර්යයන්හි නිරත සමාගම් සඳහා ලබා දී ඇති ණය පහසුකම් ;

- සංවර්ධනය කරන
- ක්‍රියාත්මක කරන හෝ නඩත්තු කරන
- පහත අංශවලට හෝ එයට සමාන ස්වභාවයේ යටිතල පහසුකම් සංවර්ධනය කරන, වැඩි දියුණු කරන සහ පවත්වාගෙන යන

(i) කඩවත් මාර්ගයන් ඇතුළු මාර්ගයක්, පාලමක් හෝ දුම්රිය පද්ධතියක්
(ii) මහාමාර්ග ව්‍යාපෘතියකට අදළ අනිකුත් කටයුතු ද ඇතුළත්ව මහාමාර්ග ව්‍යාපෘතියක්
(iii) වරායක්, ගුවන් තොටුපලක්, අභ්‍යන්තර වාරි මාර්ගයක් හෝ අභ්‍යන්තර වරායක්
(iv) ජල සම්පාදන ව්‍යාපෘතියක්, වාරිමාර්ග ව්‍යාපෘතියක්, ජල පවිත්‍රතා පද්ධතියක්, සනීපාරක්ෂක හා ජලාප්‍රවාහන පද්ධතියක් හෝ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක්
(v) ගුවන් විදුලි තරංග පිට කිරීම, ජාල දුරකථන පද්ධති, පුළුල් පරාසයක පැතිරුනු ජාල අන්තර් ජාල ඇතුලත් මූලික හෝ ජංගම විදුලි සංදේශ සේවා.
(vi) කාර්මික උද්‍යාන හෝ විශේෂ ආර්ථික කලාප
(vii) විදුලි උත්පාදනය හෝ විදුලි උත්පාදනය හා බෙදහැරීම
(viii) නව සම්ප්‍රේෂණ හෝ බෙදහැරීමේ මාර්ග අතුරා බල ශක්තිය සම්ප්‍රේෂණය කිරීම හෝ බෙදාහැරීම.
(ix) කෘෂි සැකසුම් හෝ කෘෂිකාර්මික යෙදවුම් සැපයීමේ කටයුතුවල නිරත ව්‍යාපෘතිවලට අදළ ඉදිකිරීම්
(x) අධ්‍යාපන ආයතන හා රෝහල් ඉදිකිරීම්
(xi) සමාන ස්වභාවයේ වෙනත් ඕනෑම යටිතල පහසුකම්

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2005 ඔක්තෝබර් 27

වෙත:- බලපත්‍රලාභි විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල
සියළු ප්‍රධාන විධායක නිලධාරීන්

ප්‍රිය මහත්මයාණනි,

## කේවල ණයගැති සීමාව

ඇපය නිකුත් කිරීමේ බැංකුවෙහි ණය ශ්‍රේණිගත කිරීම මත පදනම්ව ශ්‍රී ලංකාවේ මෙහෙයවන විදේශ බැංකුවල ප්‍රධාන කාර්යාලය හෝ ඉහළ ශ්‍රේණිගත බැංකුවලින් ලබාගත් ඇපයන්ට එරෙහිව කේවල ණයගැති සීමාව ඉක්මවා යාමට බැංකුවලට කේවල ණයගැති සීමාව, 2005 අංක 05 දරන විධානයෙන් (බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා) සහ 2005 අංක 04 දරන විධානයෙන් (බලපත්‍රලාභි වාණිජ බැංකු සඳහා) අවසර දී ඇත.

2005 ඔක්තෝබර් 20 දින ශ්‍රී ලංකා මහ බැංකුවේදී පවත්වන ලද ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමේදී දනුම් දුන් පරිදි, ඔවුන් විසින් මුහුණ දී ඇති දුෂ්කරතා සම්බන්ධව බැංකු මගින් කරනු ලැබූ නියෝජනය සලකා බැලීමෙන් පසු 2007.01.01 දින වනතුරු බැංකු ඇපවීම/භාරගැනීම මත සීමාව ක්‍රියාත්මක කිරීම කල් දැමීමට තීරණය කර ඇත.

වහාම ක්‍රියාත්මක වන පරිදි, 2007.01.01 දින වනතුරු එබදු ඇපයන්හි මුළු වටිනාකම දක්වා ප්‍රධාන කාර්යාලයෙන් වන්දිපූරණය/භාරගැනීම/ඇපවීමක් හෝ බැංකු ඇපයකට එරෙහිව කේවල ණයගැති සීමාව ඉක්මවා යාමට බැංකුවලට අවසර දෙනු ඇත.

මෙයට විශ්වාසී,

අජිත් කලේ / බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

**චක්‍රලේඛ අංක: 35/01/005/0006/09**

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව
2005 අප්‍රේල් 28.

සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත,

## ලංකාසෙට්ල්ස්හි නිර්ලේඛන රාජ්‍ය සුරැකුම්පත් මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම පිළිබඳ මෙහෙයුම් උපදෙස්

ඉහත මෙහෙයුම් උපදෙස් සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති 2004 ජනවාරි 27 දතම දරණ චක්‍රලේඛ අංක:35/01/005/0006/05 සම්බන්ධයෙනි.

ඉහත සඳහන් කරන ලද මෙහෙයුම් උපදෙස්හි ව්‍යාපාරික දිනය තුළ නියම කරන ලද නිශ්චිත වේලාවන් තුනකදී අතිරේක ද්‍රවශීලතා පහසුකම් සැපයීම සම්බන්ධයෙන් නියමයන් සඳහන් කර තිබුනද, මෙතෙක් පැවති කොන්දේසි හා නියමයන් අනුව, එක් එක් සහභාගි ආයතනවල ඉල්ලීම මත සහභාගි ආයතනයක ඕනෑම හදිසි දවස ඇතුළත ද්‍රවශීලතා අවශ්‍යතාවයක් සපුරා ගැනීම පිණිස නියම කරන ලද නිශ්චිත කාල වකවානු අතරතුර පවා දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සපයනු ලබන බව සහභාගී ආයතනවලට මෙමගින් දනුම් දෙනු ලැබේ.

ඒ අනුව දනට සඳහන් 8 වන වගන්තිය අවසන් වූ වහාම පහත ඡේදය ඇතුළත් කිරීම මගින් ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛනයෙහි 8 වන වගන්තිය මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

කෙසේ වුවද, මෙහි හෝ 10 වන වගන්තියේ යම් දෙයක් සඳහන්ව තිබුනද, මහ බැංකුව සිය අභිමතය පරිදි සහභාගි ආයතනවල ඉල්ලීම මත, එවැනි නිශ්චිත වේලාවන් අතරතුරදී පවා සහභාගි ආයතනයන්හි හදිසි දවස තුළ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අතිරේක ද්‍රවශීලතාව ලබා ගැනීමට අවසර දෙනු ලැබේ.

අධ්‍යක්ෂ
දේශීය කටයුතු දෙපාර්තමේන්තුව

**සම්බන්ධ අංකය : 06 /04/01/2005**

විනිමය පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 883,
කොළඹ 1.
2005.02.14

බලයලත් වෙළෙඳුන් හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත,
මෙහෙයුම් උපදෙස්
මහත්වරුනි,

## බලයලත් වෙළෙඳුන් සඳහා මෙහෙයුම් උපදෙස්

2005.02.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශිකයින්, විදේශ ආයතන ඇතුළු විදේශීය රාජ්‍යයන් මගින් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවලට එවනු ලබන සියළුම ප්‍රේෂණයන් පහත දක්වෙන කොන්දේසිවලට අනුව " පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම" නමින් වූ විශේෂ ගිණුමක් මගින්, එවිය යුතුය.

1. ගිණුම පවත්වාගෙන යා යුත්තේ ශ්‍රී ලංකා රුපියල් වලින් පමණි.
2. බලයලත් වෙළෙඳුන් විසින් රාජ්‍ය නොවන සංවිධාන සඳහා ගිණුම් විවෘත කිරීමේදී, එකී රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් අත්සන් කරනු ලබන්නන්ගේ නිරවද්‍යතාවය පිළිබඳව "ඔබ ගනුදෙනුකරු දන සිටිය යුතුය" යන සිද්ධාන්තය මත පිහිටා එම රාජ්‍ය නොවන සංවිධානයේ සත්භාවය පිළිබඳව සුපරීක්ෂාකාරී විය යුතුය.
3. විදේශිකයින්, වෙනත් විදේශ ආයතන හා විදේශීය රාජ්‍යයන් විසින් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල්, ආමුඛ ප්‍රේෂණයන් මගින් එවනවිට, උපලබ්ධි වූ ප්‍රේෂණ හා එකතු වූ පොලී මුදල් ආදිය ශ්‍රී ලංකා රුපියල් වලින් පමණක් එකී මුදල් ගිණුමට බැර කළ යුතුය.

4. මෙම ගිණුමෙන් හර කරනු ලබන දේශීය වියපැහැදම් නිදහස්ව කිරීමට අවසර ඇත.

5. රාජ්‍ය නොවන සංවිධාන විසින් තමන් ක්‍රියාත්මකවන ප්‍රදේශය සහ ව්‍යාපෘතියේ අවශ්‍යතාවය අනුව බැංකු ගිණුම් විවෘත කිරීමේදී ගිණුම් එකකට වැඩි සංඛ්‍යාවක් විවිධ බැංකුවල සහ විවිධ බැංකු ශාඛාවල විවෘත කිරීමට අපේක්ෂා කරයි නම් ඒ පිළිබඳ සීමාවක් නොමැත.

6. එකී ගිණුම්වල බැර කිරීම් හා හර කිරීම් සහිත මාසික ගිණුම් ප්‍රකාශන, ඊළඟ මාසයේ 7 වන දිනට පෙර විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

විනිමය පාලක
අත්සන් කළේ /**එච්.ජ්.ජ්.හෙට්ටිආරච්චි**

පිටපත්: අධිපති ලේකම්, නියෝජ්‍ය අධිපති (ඩබ්ලිව්),
නියෝජ්‍ය අධිපති (ජේ), අධිපති සහකාර (ඩී),
අධිපති සහකාර (කේ) අධිපති සහකාර (ඩබ්ලිව්),
අධිපති සහකාර (එෆ්), අධිපති සහකාර (ජේ)
අධිපති සහකාර (සී), බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ, අන්තර්ජාතික කටයුතු අධ්‍යක්ෂ

**සම්බන්ධ අංකය : 06/04/02/2005**

විනිමය පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 883, කොළඹ 1.
2005.04.08

බලයලත් වෙළෙඳුන් වෙත මෙහෙයුම් උපදෙස්

මහත්වරුනි,

## වක්‍ර අපනයනකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයනකරුවන් සඳහා අතිරේක දිරිගැන්වීමක් වශයෙන් "**වක්‍ර අපනයනකරුවන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම**" නමින් වක්‍ර අපනයනකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට තීරණය කර ඇත. මෙමගින් වක්‍ර අපනයනකරුවන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කළ හැකි සෘජු අපනයනකරුවන්ට කරනු ලබන සැපයීම් වෙනුවෙන් කෙරෙන ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගැනීමට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අවසරය දෙනු ලැබේ.

i වක්‍ර අපනයනකරුවන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, වක්‍ර අපනයනකරුවකුගේ නමින් විවෘත කොට පවත්වාගෙන යා යුත්තේ බලයලත් වෙළෙන්දෙකුගේ දේශීය බැංකු ඒකකයක පමණි.

ii මෙම පහසුකම මත සෘජු අපනයනකරුවන් හට වක්‍ර අපනයනකරුවන් විසින් සපයනු ලබන නිෂ්පාදන සඳහා ලැබෙන විදේශ ව්‍යවහාර මුදල් බැර කිරීමට හැකි වන්නේ එම නිෂ්පාදනවල දේශීය එකතු කළ වටිනාකම අවම වශයෙන් 35% ක් වන්නේ නම් පමණි. මේ සඳහා බලයලත් වෙළෙඳුන් විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සෘජු අපනයනකරුවන් හට වක්‍ර අපනයනකරුවන් විසින් කෙරෙන සැපයුම්වල දේශීය එකතු කළ වටිනාකම 35% ක් හෝ ඊට වැඩි බව තහවුරු කරමින් නිකුත් කරනු ලබන සහතිකයක් ලබා ගත යුතුය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යවසායකයන් සඳහා, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ ව්‍යවසායකයන් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්ද නිෂ්පාදනයේ දේශීය එකතු කළ අගය පිළිබඳව සුපරීක්ෂාකාරී තක්සේරුවකින් පසුව මෙම සහතිකය නිකුත් කළ යුතුය.

iii වක්‍ර අපනයනකරුවන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි හර කිරීම් කළ හැක්කේ වක්‍ර අපනයනකරුවන් විසින් කෙරෙන ආනයන යෙදවුම් අවශ්‍යතා සඳහා කළ යුතු විදේශ විනිමය ගෙවීම් සහ රුපියල් වලට කරනු ලබන පරිවර්තන සඳහා පමණි.

iv මෙම ගිණුම සංචාරක චෙක්පත් හෝ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම සඳහා යොදා නොගත යුතුය.

v මෙම ගිණුමේ සෑම මාසයක් අවසානයේදීම ඉදිරියට ගෙන ආ ශේෂය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 5000 නොඉක්මවිය යුතුය. ඊට වඩා වැඩි වන සෑම විදේශ ව්‍යවහාර මුදලක්ම එම මාසය අවසානයේදී ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කළ යුතුය. බලයලත් වෙළෙන්ඳ විසින් මෙම ගිණුම විවෘත කරන අවස්ථාවේදී ගිණුම් හිමියාගෙන් මේ පිළිබඳව කැමැත්ත ලිඛිතව ලබා ගත යුතුය.

vi වක්‍ර අපනයනකරුවන් විසින් තම ව්‍යාපාර කටයුතු නතර කළ අවස්ථාවලදී බලයලත් වෙළෙන්ද විසින් වක්‍ර අපනයනකරුවා වෙත ලබාදී තිබූ මෙම පහසුකම ව්‍යාපාර කටයුතු නතර කළ දින සිට දින 60 ක් ඇතුළතදී

ගිණුමේ ඇති මුළු ශේෂය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් අවසන් කළ යුතුය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වක්‍ර අපනයනකරුවන්ගේ නිෂ්පාදනයන්හි දේශීය එකතු කළ අගය පිළිබඳව යටත් පිරිසෙයින් වසරකට වරක් හෝ ඇගයීමක් කෙරෙතැයි අපේක්ෂා කෙරේ.

vii සියලුම වක්‍ර අපනයනකරුවන්ගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව මුළු හර සහ බැර ශේෂයන් සඳහන් කරන ලද ත්‍රෛමාසික ප්‍රකාශනයක් එක් එක් කාර්තුව ඉකුත්වී දින 15 කට පෙර විනිමය පාලන දෙපාර්තමේන්තුවේ "ඩී" ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.

මෙම මෙහෙයුම් උපදෙස් සඳහා වක්‍ර අපනයනකරුවන් ලෙස අර්ථකතනය කර ඇත්තේ කිසියම් භාණ්ඩයක් නිපදවන / සකස් කරන/ උප කොන්ත්‍රාත් ලෙස කටයුතු කරන හෝ නිමි නිෂ්පාදනයක් ලෙස අපනයනකරුවෙකුට සෘජුව සපයනු ලබන පුද්ගලයෙකු හෝ ආයතනයක් ය.

මෙයට විශ්වාසී
විනිමය පාලක

පිටපත්: අධිපති, නියෝජ්‍ය අධිපතිවරුන්, අධිපති සහකාරවරුන්
අධ්‍යක්ෂ ජනරාල්/ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අධ්‍යක්ෂ/ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ / ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව, සියළුම බලයලත් වෙළෙඳුන්

**සම්බන්ධ අංකය : 06 /04/03/2005**

විනිමය පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 883, කොළඹ 1.
2005 මැයි 09

බලයලත් වෙළෙඳුන් හා ජාතික ඉතිකිරීමේ බැංකුව වෙත,

මෙහෙයුම් උපදෙස්

මහත්වරුනි,

## පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම

මීට යාකර ඇති 2005 පෙබරවාරි මස 14 දින නිකුත් කළ අංක 06/04/01/2005 දරන මෙහෙයුම් උපදෙස් හි අංක 2 වෙත ඔබගේ අවධානය යොමු කරවමු. රාජ්‍ය නොවන සංවිධාන සඳහා ගිණුම් විවෘත කිරීමේදීත් එම ගිණුම් සම්බන්ධ ගනුදෙනු සඳහා අවසරදීමේදීත් ඉදිරිපත් කරනු ලබන පහත සඳහන් කරනු ලබන ලියවිලිවල නිරවද්‍යතාවය පරීක්ෂා කර එම සංවිධානයන්හි සත්භාවය පිළිබඳ සුපරීක්ෂාකාරී විය යුතුය.

i 1980 අංක 31 දරන ඉච්ඡානුගත සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ "රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය" මගින් නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ

ii ඉහත අංක (i) යටතේ සඳහන් සහතිකය නොමැතිනම් මුදල් අමාත්‍යාංශයේ "රාජ්‍ය නොවන අංශය සඳහා වූ කේන්ද්‍රය" මගින් රාජ්‍ය නොවන සංවිධානය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ නිර්දේශය.

මෙම සහතික ඉදිරිපත් නොකර දනට ඔබගේ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය නොවන සංවිධානයන්හි නම සහ ලිපිනයන් 2005 මැයි මස 28 දින හෝ ඊට ප්‍රථම මා වෙත ලබාදෙන මෙන් දන්වමු.

මෙයට විශ්වාසී
අත්සන් කළේ/**එච්.ඒ.ජී.හෙට්ටිආරච්චි**
විනිමය පාලක

පිටපත්: අධිපති, නියෝජ්‍ය අධිපතිවරු,
සහකාර අධිපතිවරු, අධ්‍යක්ෂ/බැංකු අධීක්ෂණ
අධ්‍යක්ෂ/ආර්ථික පර්යේෂණ, අධ්‍යක්ෂ/ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු

**සම්බන්ධ අංකය : 06/05/04/2005**

විනිමය පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 883,, කොළඹ 1.
2005.06.24

බලයලත් වෙළෙඳුන් වෙත මෙහෙයුම් උපදෙස්
මහත්වරුනි,

**විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි සංශෝධනය කිරීම**

1998 අප්‍රියෙල් 8 වෙනි දින අංක 1022/6 දරන රජයේ (අති විශේෂ) ගැසට් නිවේදනයේ රෙගුලාසි අංක (2) (i)(ඇ) මගින් අවසර දී තිබූ ආනයනයන් සඳහා අත්තිකාරම් ගෙවීම් සීමාව, ගරු වෙළෙඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් 2005 මැයි 20 වෙනි දින අංක 1393/21 දරණ රජයේ (අති විශේෂ)* ගැසට් නිවේදනය මගින් ඇ.එ.ජ.ඩොලර් 10,000 දක්වා ඉහළ නංවා ඇති බව මෙයින් දන්වා සිටිමු.

මෙයට විශ්වාසී
විනිමය පාලක

පිටපත්: අධිපති, නියෝජ්‍ය අධිපතීන්
අධිපති සහකාරවරුන්, අධ්‍යක්ෂ/ආර්ථික පර්යේෂණ
අධ්‍යක්ෂ/බැංකු අධීක්ෂණ, අධ්‍යක්ෂ/ජාත්‍යන්තර කටයුතු

* ගැසට් නිවේදනය ගරු, වෙළෙඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

**සම්බන්ධ අංකය : 06/08/06/2005**

විනිමය පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 883,, කොළඹ 1.
2005.09.23

බලයලත් වෙළෙඳුන් වෙත මෙහෙයුම් උපදෙස්

**ජාත්‍යන්තර විද්‍යුත් හර,බැර හෝ වෙනත් මුදල් පැවරුම් කාඩ්පත් මගින් විදේශ විනිමය හැර ගැනීම පිළිබඳ මෙහෙයුම් යෝජනා ක්‍රමය**

අන්තර් ජාතික ගනුදෙනු සඳහා පහසුකම් ඇති විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් භාවිතය සීඝ්‍රලෙස ව්‍යාප්තවීමත් සමග එම කාඩ්පත් භාවිත කරමින් කරනු ලබන විදේශීය විනිමය ගෙවීම් වලදී සිදුවන අපයෝජනය ඉතා මෑතක සිට සැලකිලිමත් ලෙස වැඩි වී ඇති බව අපහට අනාවරණය වී ඇත. එබැවින් ඉදිරියේදී මෙම අපයෝජනයන් වැළැක්වීම සඳහා 1999 දෙසැම්බර් මස 17 දින සම්බන්ධ අංක: EC/09/99(D) හා 2000 පෙබරවාරි මස 3 දින සම්බන්ධ අංක:EC/02/2000(D) යටතේ හඳුන්වාදෙනු ලැබූ මෙහෙයුම් යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීමට තීරණය කරනු ලැබීය. ඒ අනුව ඇමුණුම් අංක 1 යටතේ වූ සම්බන්ධ අංක 1411/5 හා 2005 සැප්තැම්බර් මස 19 දින ප්‍රසිද්ධ කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මගින් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් මගින් කරනු ලබන විදේශ විනිමය ගෙවීම් ඇතැම් වගන්ති හා කොන්දේසිවලට යටත් කර ඇත.

1.1. බලයලත් වෙළෙඳුන් විසින් ඉහත සඳහන් නිවේදනය ගනුදෙනුකරුවන් හට පරීක්ෂාකාරීව කියවීමට අවස්ථාව ලබා දිය යුතු අතරම විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් නිකුත් කිරීමේදී ඇමුණුම් අංක 11 හි ඇති ගනුදෙනුකරුගේ පොරොන්දුව එකී ගනුදෙනුකරු විසින් සුපරීක්ෂාකාරීව කියවූ බවට සහතිකයක් ලබා ගතයුතු අතර බලයලත් වෙළෙඳුන් විසින් කාඩ්පත් හිමියා සමඟ ඇති කර ගන්නා ගිවිසුමට එම පොරොන්දුව ඇතුලත් කළ යුතුය.

1.2 ඉහත සඳහන් ගැසට් නිවේදනයෙන් ලබාදී ඇති පොදු අවසරය දැනට විද්‍යුත් අරමුදල් කාඩ්පත් ලබාගෙන ඇති ගනුදෙනුකරුවන්ට ද දැනුම් දීමට බලය ලත් වෙළෙඳුන් හැකි උපරිම පියවරයන් ගත යුතුය.

1.3 විද්‍යුත් අරමුදල් කාඩ්පත් මගින් අනවසර විදේශ විනිමය ගනුදෙනු සිදුවන්නේ යැයි සැකකිරීමට සාධාරණ හේතු ඇත්නම් එම කාඩ්පත් මගින් ගනුදෙනු කිරීම සඳහා ලබාදී ඇති විදේශ විනිමය පහසුකම් වහාම නතර කිරීමටත්, ඒ පිළිබඳ විනිමය පාලක වෙත දැනුම්දීමට හැකිවන සේ කොන්දේසියක් ගනුදෙනුකරුගේ පොරොන්දු පත්‍රයට ඇතුලත් කළ යුතුය. මෙම කාඩ්පත් හිමියන් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් මගින් කරනු ලබන ගනුදෙනුවල තොරතුරු ලබාගැනීමේ අයිතිය බලයලත් වෙළෙඳුන් තමා වෙත තබාගත යුතුය.

2. විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් නිකුත් කළ යුත්තේ ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් සඳහා පමණි.

2.1 "කෙසේවුවද, දේශීය බැංකු අංශයේ අනේවාසික ව්‍යවහාර මුදල්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට හා අක්වෙරළ අංශයෙහි වූ අක්වෙරළ ගිණුම් හිමියන්ටද" නේවාසිකත්වය නොසලකා විද්‍යුත් අරමුදල් කාඩ්පත් නිකුත් කළ හැකි අතර එම කාඩ්පත මගින් කරනු ලබන විදේශීය විනිමය ගෙවීම් හර කළ යුත්තේ එකී ගිණුම් සඳහා පමණි. විදේශීය ගනුදෙනු පියවීමේදී එකී ගිණුම් බැරට ඇති මුදල විදේශීය විනිමය ගනුදෙනු හර කිරීම සඳහා ප්‍රමාණවත් නොවන විටක මාගේ අවසරයකින් තොරව එම කාඩ්පත් හිමියා රුපියල්වලින් පවත්වාගෙන යනු ලබන ගිණුමකින් හර කිරීමෙන් ගනුදෙනු පියවීම නොකළ යුතුය. සියළුම විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් හිමියන්ට මෙම අවශ්‍යතාවය දැන්වීම කළ යුතුය.

2.2 විදේශික ගනුදෙනු පියවීම සඳහා විදේශ විනිමය හැර ගැනීම් සඳහා නිකුත් කළ අනේවාසික ව්‍යවහාර මුදල්, නේවාසික විදේශීය ව්‍යවහාර මුදල්, නේවාසික විජාතික ව්‍යවහාර මුදල් ගිණුම් හා අක්වෙරළ බැංකු ගිණුම් මත නිකුත්කළ විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් හැර අනෙකුත් කාඩ්පත් හිමියන් රට හැරයාම හෝ, විදේශීය රැකියාවකට යාම හෝ නිත්‍ය වශයෙන්ම විදේශීය රටක පදිංචිය සඳහා ශ්‍රී ලංකාව හැර යන විටදී ඔහු හෝ ඇය වෙත නිකුත්කළ විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් බලයලත් වෙළෙඳුන් වෙත භාර දීමේ කොන්දේසියට යටත් විය යුතුය.

3. සියළුම බලයලත් වෙළෙඳුන් විද්‍යුත් මුදල් පැවරුම් කාඩ්පත් හිමියන් විදේශීය මුදලින් ගනුදෙනු පියවීමේදී භාවිතාකළ ගිණුම් පිළිබඳව මනා පරීක්ෂාකාරී විය යුතු අතර අනවසර ගනුදෙනු සිදුවීම් වලක්වා ගැනීම සඳහා දැඩි ප්‍රයත්නයක් දැරිය යුතුය. කිසියම් කාඩ්පත් හිමියකු විදේශීය විනිමය අනවසර කටයුතු සඳහා යොදගනී යැයි පිළිගත හැකි කරුණු ඇත්නම්, ඔහුගේ / ඇයගේ විද්‍යුත් මුදල් පැවරුම් කාඩ්පත් මගින් කරනු ලබන සැක කටයුතු ගනුදෙනු වහා නතර කිරීමට පියවර ගෙන ඒ පිළිබඳව විනිමය පාලක වෙත දැනුම්දීමට කටයුතු කළ යුතුය.

4. විනිමය පාලන දෙපාර්තමේන්තුවට සපයන වාරික ප්‍රකාශන

4.1 බලය ලත් වෙළෙඳුන් කාඩ්පත් හිමියන්ගේ විදේශ විනිමය වියදම් වෙන වෙනම හඳුනාගත යුතුය.

4.2 විදේශීය මුදලින්, මුදල් ලෙස ලබා ගැනීමද ඇතුලත් වූ විදේශ විනිමය සම්බන්ධ වියදම් එක් මාසයක් තුළදී එ.ජ.ඩො. 5000/- ට වැඩි හෝ අනෙකුත් විදේශ මුදලින් ඊට සමාන වූ මුදලක් හෝ එක් අවස්ථාවක කරනු ලැබූ එ.ජ.ඩො. 3000/- ට වැඩි ගනුදෙනු පිළිබඳ මාසික වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ "විමර්ශන අංශය" වෙත ඇමුණුම් අංක III හි සඳහන් ආකෘතිය අනුව සැකසූ මාසික වාර්තාවක් විද්‍යුත් තැපෑලෙන් eftc@cbsl.lk හා සාමාන්‍ය තැපෑලෙන් ඊළඟ මස දින 07 ක් ඉකුත් වීමට ප්‍රථම එවිය යුතුය.

4.3 උක්ත කරුණු පිළිබඳව 1999 දෙසැම්බර් මස 17 දින සම්බන්ධ අංක EC/09/99(D) හා 2000 පෙබරවාරි මස 3 දින සම්බන්ධ අංක:EC/02/2000(D) දරණ මීට ප්‍රථම නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අවලංගු කරනු ලැබේ.

විනිමය පාලක

පිටපත්:

නියෝජ්‍ය අධිපතිවරු, අධිපති සහකාරවරු
උපදේශකවරු, අධිපති ලේකම්

ඇමුණුම 1

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

## අංක 1411/5 - 2005 සැප්තැම්බර් 19 වැනි සඳුදා - 2005.09.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## 1 වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**(ලං.නි.ප්‍ර. වල 423 වන අධිකාරය වූ ) විනිමය පාලන පනත යටතේ වූ දැන්වීම**

**ලං.නි.ප්‍ර. වල 423 වන අධිකාරය වූ විනිමය පාලන පනතේ 7 වන වගන්තිය සහ 8 වන වගන්තිය ප්‍රකාරව වූ අවසරය**

1. ශ්‍රී ලංකාව තුල සිටින හෝ එහි නේවාසික යම් තැනැත්තෙකු විසින් ඔහුගේ විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත මගින් පහත දක්වෙන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විදේශ ව්‍යවහාර මුදල් වලින් ගෙවීම් කිරීම සඳහා (ලං.නි.ප්‍ර.වල 423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 7 වන සහ 8 වන වගන්තිවල කාර්ය සඳහා මෙයින් අවසර දෙනු ලැබේ.

2. (අ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට හෝ අස්තිත්වයකට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (ඊ.එෆ්.ටී.සී.) මුදල් ගෙවීම, පහත සඳහන් කාර්යයන් සඳහා පමණක් විය යුතුය.

   i. සංචාරක, නවාතැන්, වෛද්‍ය පහසුකම්, ජීවන හා අධ්‍යාපන වියදම් ඇතුළු පෞද්ගලික ස්වභාවයේ සේවා සඳහා කාඩ්පත් හිමියකු විසින් විදේශ රටවලදී මුදල් ගෙවීම;

   ii. විදේශ රටවලදී පෞද්ගලික ප්‍රයෝජනය සඳහා භාණ්ඩ මිලදී ගැනීම සඳහා මුදල් ගෙවීම්;

   iii. එක් භාණ්ඩ තොගයක් සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 3000 ක (මි.ර.ගැ.)හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදල් වලින් ඊට සමාන මුදලක උපරිමයකට යටත්ව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් ගෙවීම;

   iv . විදේශීය වෘත්තිමය ආයතනයකට හෝ ශාස්ත්‍රීය ආයතනයකට ගෙවිය යුතු පෞද්ගලික ස්වභාවයේ ලියාපදිංචි වීමේ ගාස්තු, විභාග ගාස්තු සහ වාර්ෂික දායක මුදල් ගෙවීම;

   v . පෞද්ගලික ස්වභාවයේ සංචාරක සහ සෞඛ්‍ය රක්ෂණ සඳහා පමණක් රක්ෂණ වාරික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් ගෙවීම.

   (ආ) 2(අ) ඡේදයේ විෂය පථයට අයත් නොවන යම් ගනුදෙනුවක් සඳහා විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (ඊ.එෆ්.ටී.සී.) විදේශ ව්‍යවහාර මුදල් වලින් කරනු ලබන යම් ගෙවීමක් සඳහා, එම ගෙවීම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (එන්.ආර්.එෆ්.සී.), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (ආර්.එෆ්.සී.), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (ආර්.එන්.එන්.එෆ්.සී.) හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ශාඛාවක අක්වෙරළ ගිණුමක බැරට අරමුදල් වලින් ගෙවීම සඳහා අවසර දෙන ලද ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ ගෙවීමක් වන්නේ නම් මිස, එම ගෙවීම සඳහා විනිමය පාලකවරයාගෙන් පූර්ව ලිඛිත අවසරය අවශ්‍ය වන්නේය.

03. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, ගැසට් නිවේදනයේ කාර්ය සඳහා "විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත" (ඊ.එෆ්.ටී.සී) යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකිවන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර ඊට ණය කාඩ්පත් (ක්‍රෙඩිට් කාඩ්) හර කාඩ්පත් (ඩෙබිට් කාඩ්) සහ වටිනාකම තැන්පත් කල කාඩ්පත් ද ඇතුළත් වේ.

සහ

"පෞද්ගලික ප්‍රයෝජනය" යන්නෙන් කාඩ්පත හිමියාගේ, ඔහුගේ කාලත්‍රයාගේ සහ ඔහුගේ ළමයින්ගේ සහ දෙමව්පියන්ගේ ප්‍රයෝජනය සඳහා අදහස් වන අතර එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කිරීම අදහස් නොවේ.

19 සැප්තැම්බර් 2005 — එච්.ඒ.ජී.හෙට්ටිආරච්චි

කොළඹ — විනිමය පාලක